1 [illegible]

2 [illegible]

3 [illegible]

4 [illegible]

5 [illegible]

6 [illegible]

7 [illegible]

8 [illegible]

9 [illegible]

10 [illegible]

11 [illegible]

12 [illegible]

13 [illegible]

14 [illegible]

15 [illegible]

16 [illegible]

අ ටු වා ස න් න ස හි ත

# ධ ම් මි ක සූ ත්‍ර ය.

සමයෑ සාමින්වහන්සේ නමක් ලවා

ශුද්ධකරවාගෙණ

අළුත්ගම

එච්. ජුලියන් ප්‍රනාන්දු

විසින්

කොළඹ ශුද්ධප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

ශ්‍රී බුද්ධවර්ෂ 2438.

ක්‍රි. ව. 1895.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

H. J. FERNANDO. MERCHANT. ...GAMA.

# ධම්මික සුත්තං.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

---ooo---

එවම්මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—අථඛො ධම්මිකො උපාසකො පඤ්චහි උපාසක සතෙහි සද්ධිං යෙන භගවා, තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නොඛො ධම්මිකො උපාසකො භගවන්තං ගාථාහි අජ්ඣභාසි—

1 පුච්ඡාමි තං ගොතම භූරි පඤ්ඤ
කථංකරො සාවකො සාධුහොති
යොවා අගාරා අනගාරි මෙති
අගාරි නොවා පනූපාසකාසෙ.

2 තුවංහි ලොකස්ස සදෙවකස්ස
ගතිං පජානාසි පරායණඤ්ච
නචත්ථි තුල්‍යො නිපුණත්ථ දස්සී
තුවං හි බුද්ධං පවරං වදන්ති.

3 සබ්බං තුවං ඤාණ මවෙච්ච ධම්මං
පකාසෙසි සත්තෙ අනුකම්පමානො
විවත්තච්ඡද්දොසි සමන්ත චක්ඛු
විරොචසි විමලො සබ්බලොකෙ.

4 ආගඤ්ඡි තෙ සන්තිකෙ නාගරාජා
එරාවණො නාම ජිනො'ති සුත්වා
සො පිතයා මන්තයිත්වා අජ්ඣගමා
සාධූ'ති සුත්වාන පතීත රූපො.

5 රාජා'පිතං වෙස්සවණො කුවෙරො
උපෙති ධම්මං පරිපුච්ඡ මානො
තස්සාපි ත්වං පුච්ඡිතො බ්‍රූසිධීර
සොචා'පි සුත්වාන පතීත රූපො.

6 යෙකෙචි මෙතිත්ථියා වාදසීලා
ආජීවකා වා යදි වා නිගණ්ඨා
පඤ්ඤාය තං නාතිතරන්ති සබ්බෙ
ඨිතො වජන්තං විය සීඝගාමිං.

7 යෙ කෙචි මෙ බ්‍රාහ්මණා වාදසීලා
වුද්ධා චාපි බ්‍රාහ්මණා සන්ති කෙචි
සබ්බෙ තයී අත්ථබද්ධා භවන්ති
යෙ චා'පි'චඤ්ඤෙ වාදිනො මඤ්ඤමානා.

8 අයං හි ධම්මො නිපුණො සුඛො ච
යො යං තයා භගවා සුප්පවුත්තො
තමෙ'ව සබ්බෙ සුස්සූසමානා
තං නො* වද පුච්ඡිතො බුද්ධසෙට්ඨ.

9 සබ්බෙ'පි'මෙ භික්ඛවො සන්නිසින්නා
උපාසකා චා'පි තථෙ'ව සොතුං
සුණන්තු ධම්මං විමලෙනා'නුබුද්ධං
සුභාසිතං වාසවස්සෙ'ව දෙවා.

10 සුණාථ මෙ භික්ඛවො සාවයාමි වො
ධම්මං ධුතං තඤ්ච ධරාථ සබ්බෙ
ඉරියාපථං පබ්බජිතානුලොමිකං
සෙවෙථ නං අත්ථදස්සී මුතීමා.

11 නවෙ විකාලෙ විචරෙය්‍ය භික්ඛු
ගාමඤ්ච පිණ්ඩාය චරෙය්‍ය කාලෙ
අකාලචාරිංහි සජන්ති සඞ්ගා
තස්මා විකාලෙ නචරන්ති බුද්ධා.

12 රූපා ච සද්දා ච රසා ච ගන්ධා
ඵස්සා ච යෙ සම්මදයන්ති සත්තෙ
එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
කාලෙන සො පවිසෙ පාතරාසං.

13 පිණ්ඩඤ්ච භික්ඛු සමයෙන ලද්ධා
එකො පටික්කම්ම රහො නිසීදෙ
අජ්ඣත්තචින්තී නමනො බහිද්ධා
නිච්ඡාරයෙ සංගහිතත්තභාවො.

* ත්වංනො'පි පාඨො.

14 සචෙපි සො සල්ලපෙ සාවකෙන
අඤ්ඤෙන වා කෙනචි භික්ඛුනා වා
ධම්මං පණීතං තමු'දා, හරෙය්‍ය
න පෙසුණං නොපි පරූපවාදං.

15 වාදංහි එකෙ පටිසෙනියන්ති
න තෙ පසංසාම පරිත්තපඤ්ඤෙ
තතො තතො නෙ පසජන්ති සඞ්ගා
චිත්තංහි තෙ තත්ථ ගමෙන්ති දූරෙ.

16 පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සංඝාටි රජූපවාහනං
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සඞ්ඛාය සෙවෙ වරපඤ්ඤ සාවකො.

17 තස්මා හි පිණ්ඩෙ සයනාසනෙ ච
ආපෙ ච සංඝාටි රජූප වාහනෙ
එතෙසු ධම්මෙසු අනූපලිත්තො
භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු.

18 ගහට්ඨවත්තං පන වො වදාමි
යථා කරො සාවකො සාධු හොති
න හෙසො ලබ්භා සපරිග්ගහෙන
ඵස්සෙතුං යො කෙවලො භික්ඛු ධම්මො.

19 පාණං න හානෙ න ච ඝාතයෙය්‍ය
න චානුජඤ්ඤා හනතං පරෙසං
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙ ථාවරා යෙ ච තසන්ති ලොකෙ.

20 තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චි ක්වචි සාවකො බුජ්ඣමානො
න හාරයෙ හරතං නානුජඤ්ඤා
සබ්බං අදින්නං පරිවජ්ජ යෙය්‍ය.

21 අබ්‍රහ්මචරියං පරිවජ්ජ යෙය්‍ය
අඞ්ගාර කාසුං ජලිතං ව විඤ්ඤූ
අසම්භුනන්තො පන බ්‍රහ්මචරියං
පරස්ස දාරං නාතික්කමෙය්‍ය.

22 සභග්ගතො වා පරිසග්ගතො වා
එකස්ස චෙකො න මුසා භණෙය්‍ය
න භාණයෙ භණතං නානුජඤ්ඤා
සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය.

23 මජ්ජඤ්ච පානං න සමාචරෙය්‍ය
ධම්මං ඉමං රොචයෙ යො ගහට්ඨො
න පායයෙ පිබතං නානුජඤ්ඤා
උම්මාදනන්තං ඉති නං විදිත්වා.

24 මදා හි පාපානි කරොන්ති බාලා
කාරෙන්ති චඤ්ඤෙ පි ජනෙ පමත්තෙ
එතං අපුඤ්ඤායතනං විවජ්ජයෙ
උම්මාදනං මොහනං බාලකන්තං.

25 පාණං නහානෙ නචාදින්න මාදියෙ
මුසා නභාසෙ නච මජ්ජපො සියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං නභුඤ්ජෙය්‍ය විකාල භොජනං.

26 මාලං න ධාරෙ නචගන්ධ මාචරෙ
මඤ්චෙ ඡමායං ව සයෙථ සන්ථතෙ
එතංහි අට්ඨඞ්ගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං

27 තතොච පක්ඛස්සු පවස්සු පොසථං
චාතුද්දසිං පඤ්චදසිඤ්ච අට්ඨමිං
පාටිහාරිය පක්ඛඤ්ච පසන්නමානසො
අට්ඨඞ්ගුපෙතං සුසමත්තරූපං.

28 තතො ච පාතො උපවුත්ථු පොසථො
අන්නෙන පානෙනච භික්ඛු සංඝං
පසන්න චිත්තො අනුමොද මානො
යථා රහං සංවිභජෙථ විඤ්ඤු.

29 ධම්මෙන මාතා පිතරො භරෙය්‍ය
පයොජයෙ ධම්මිකං සො වණිජ්ජං
එතං ගිහී වත්තයං අප්පමත්තො
සයංපභෙනාම උපෙති දෙවෙති.

ධම්මිකසුත්තං නිට්ඨිතං.

# පදත්ථ කථා.

''එවම්මෙසුත''න්ති ධම්මිකසුත්තං. කා උප්පත්ති. තිට්ඨමානෙ
කිරභගවති ලොකනාථෙ ධම්මිකොනාම උපාසකො අහොසි.
නාමෙනෙව පටිපත්තියාච, සොකිරසරණ සම්පන්නො සීලසම්ප
න්නො බහුස්සුතො පිටකත්තය ධරො අනාගාමී අභිඤ්ඤාලා
භී ආකාසචාරී අහොසි. තස්සපරිවාරා පඤ්චසතා උපාසකා
තෙපිතාදිසා එව අහෙසුං. තස්සෙක දිවසං උපොසථිකස්ස ර
හොගතස්ස පටිසල්ලීනස්ස මජ්ඣිම යාමාවසාන සමයෙ එවං
පරිවිතක්කො උදපාදි. “යන්නූනාහං අගාරිය අනගාරියානං
පටිපදං පුච්ඡෙය්‍ය”න්ති. සොපඤ්චහි උපාසක සතෙහි පරිවු
තො භගවන්තං උපසඞ්කමිත්වා තමත්ථංපුච්ඡි. භගවාචස්සබ්‍යා
කාසි. තත්ථපුබ්බෙ වණ්ණිතසදිසං පුබ්බනයෙනෙව වෙදිතබ්බං
අපුබ්බං වණ්ණයිස්සාම—තත්ථ පඨමගාථාය තාව, “කථංකරො”
ති කථංකරොන්තො කථං පටිපජ්ජන්තො; “සාධුහොති”ති සු
න්දරො අනවජ්ජො අත්ථසාධකො හොති; “උපාසකාසෙ”ති උ
පාසකා ඉච්චෙව වුත්තං හොති. සෙසමෙත්ථ පාකටමෙව,
අයංපන යොජනා “යොවාඅගාරාඅනගාරමෙති” පබ්බජති යෙ
වාගාරිනො උපාසකා එතෙසු ද්විධෙසු පිසාවකෙසු “කථංකරොසා
වකො සාධුහොති”ති ඉදානිඑවං පුට්ඨස්ස භගවතො ව්‍යාකරණ
සමත්ථතං දීපෙන්තො “තුවංහි”ති ගාථාවයමාහ; තත්ථ, “ගති
න්ති” අජ්ඣාසයගතිං; “පරායණ”න්ති, නිප්ඵත්තිං; අථවා, “ග
ති”න්ති, නිරයාදි පඤ්චප්පභෙදං; “පරායණ”න්ති, ගතිතොප
රමායණං ගතිවිප්පමොක්ඛං පරිනිබ්බාණං; “නචත්ථිතුල්‍යො”
ති, තයා සදිසො නත්ථි;—“සබ්බං තුවංඤාණ මවෙච්චධම්මං ප
කාසෙසි සත්තෙ අනුකම්පමානො”ති, ත්වං භගවා යදත්ථි ඤෙ
ය්‍යං නාමතං අනවසෙසං අවෙච්ච පටිවිජ්ඣිත්වා සත්තෙ අනුක
ම්පමානො සබ්බං ඤාණඤ්ච ධම්මඤ්ච පකාසෙසි, යං යං යස්ස
හිතං හොතිතංඅවිකාසියෙව දෙසෙසියෙව; නතෙ අත්ථි ආචරි
යමුට්ඨීති වුත්තං හොති. “විරොචසි විමලො”ති, ධූමරජාදිවිරහි
තො වියචන්දො රාහාදි මලාභාවෙන විමලො විරොචසි, සෙසමෙ
ත්ථ උත්තානත්ථමෙව ඉදානියෙසංතදාභගවා ධම්මං දෙසෙසි. තෙ
දෙවපුත්තෙ කිත්තෙත්වා භගවන්තං පසංසන්තො “ආගඤ්ඡිතෙ
සන්තිකෙ”ති ගාථාවයමාහ. තත්ථ “නාගරාජා එරාවණොනාමො”ති
අයංකිර එරාවණොනාමදෙවපුත්තො කාමරූපී දිබ්බවිමානෙ වස
ති. සොයදා සක්කො උය්‍යානකීළං ගච්ඡති. තදා දියඩ්ඪ සත යො
ජනං කායං අභිනිම්මිනිත්වා තෙත්තිංස[illegible]

ණො නාම හත්ථී හොති. තස්ස එකෙකස්මිං කුම්භෙ ද්වෙ ද්වෙ දන්තා හොන්ති. එකෙකස්මිං දන්තෙ සත්ත සත්ත පොක්ඛරණියො, එකෙකිස්සා පොක්ඛරණියා සත්ත සත්ත පදුමිනියො, එකෙකිස්සා පදුමිනියා සත්ත සත්ත පුප්ඵානි. එකෙකස්මිං පුප්ඵෙ සත්ත සත්ත පත්තානි. එකෙකස්මිං පත්තෙ සත්ත සත්ත අච්ඡරායො නච්චන්ති. පදුමච්ඡරායොත්වෙව වීසසුත්තා; සතකසෙනාවකිනී ලො යාවිමානවත්ථුසම්මිසිතවන්ති. තාසඤ්ඤ පදුමෙසු සික්ඛිතානි අඞ්ගානි; තෙසං පන තෙත්තිංසකුම්භානං මජ්ඣෙ සුදස්සනකුම්භො නාම තිංසයොජනමත්තො හොති. තත්ථ යොජනප්පමාණො මණිපල්ලඞ්කො තියොජනුබ්බෙධො පුප්ඵමණ්ඩපො අත්ථරියති. තත්ථ සක්කො දෙවානමින්දො අච්ඡරාසංඝපරිවුතො දිබ්බසම්පත්තිං පච්චනුභොති. සක්කස්ස පන දෙවානමින්දස්ස උය්‍යානකීළනො පවිසිච්ඡතෙන දූත තං රූපං සංහරිත්වා දෙවපුත්තොව හොති. තංසන්ධායාහ—“අග්ගඤ්ඤෙ සපත්තෙ නාගරාජා එරාවණො නාම ජවෙනානි සුත්වා”ති, විජිතපාදපබ්බමෙමා එස භගවාති; එවං සුත්වා “සොපිනයා මනසිත්වා”ති තස්ස සබ්බං මනොහරිත්වා පක්ඛං පුච්ඡිත්වාති අධිප්පායො; “අජ්ඣගමා”ති අධිඅගමා; ගතොති වුත්තං හොති; “සාධූතිසුත්වාන පතීතරූපො”ති, තං පක්ඛං සුත්වා සාධූතනෙතානි අභිනන්දිත්වා තුට්ඨරූපො ගතොති අත්ථො; “රාජිපිතං වෙස්සවණො කුවෙරො”ති එත්ථ සොයතො රක්ඛනාවෙය්‍යනරාජා විසාණාය රාජධානියා රජ්ජං කාරෙතීති වෙස්සවණො පුරිමනාමෙන කුවෙරොති වෙදිතබ්බො සො කිර කුවෙරොනාම බ්‍රාහ්මණමහාසාලො හුත්වා දානාදීනි පුඤ්ඤානි කත්වා විසාණාය රාජධානියා අධිපති හුත්වා නිබ්බත්තො තස්මා කුවෙරොති වුච්චති. වුත්තං චෙතං ආටානාටියසුත්තෙ “කුවෙරස්ස ඛො පන මහාරාජස්ස විසාණානාම රාජධානී තස්මා කුවෙරොමහාරාජා වෙස්සවණොති පවුච්චතී”ති, සෙසමෙත්ථ පාකටමෙව, තත්ථයිදං තස්මා පන දූරතරෙතාව තාවතිංස භවණෙ වසන්තො එරාවණො පඨමං ආගතො වෙස්සවණො පච්ඡා එකනගරෙච වසන්තො අයං උපාසකො සබ්බපච්ඡා කාඵස්ස සො තෙසං ආගමණමුක්ඛස්සි යෙන එව මාභාතිවුච්චතෙ. වෙස්සවණස්සකිර තදා අනෙක සගස්ස පවාළ පල්ලංකමාදස යොජනං නාරිවාහණං අභිරූයභ පවාළකූනනං උච්චාරෙත්වා දසසහස්සකොටියක්ඛහි පරිවාරිතො භගවන්තං පඤ්හං පුච්ඡිස්සාමීති ආකාසට්ඨවිමානානි පරිහරිත්වා මග්ගෙන මග්ගං ආගච්ඡන්තො වෙළුකණ්ඩක නගරෙ නන්දමාතාය උපාසිකාය නිවෙසනස්ස උපරිභාගං සම්පත්තො උපාසිකාය අයමානුභාවො පරිසුද්ධසීලාහොති. නිච්චං විකාලභොජනා පටිවිරතා පිටකත්තයධාරිනී අනාගාමී එළෙප

නිට්ඨිතා, සා තම්හි සමයෙ සීහපඤ්ජරං උග්ඝාටෙත්වා උත්තමඞ්ගභූ
තාය මාලුතෙරිතො කාසෙඨත්වා අට්ඨකපරායන වග්ගෙ පරිම
ණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි මධුරෙන සරෙන භාසති. වෙස්සව
ණො තඤ්ච යානං ඨපෙත්වා යාව උපාසිකා ඉදම්වොච භගවා
මගධෙසු විහරන්තො පාසාණකචෙතියෙ පරිචාරකසොළසන්නං
බ්‍රාහ්මණානං නිගමණං අභාසි තාවසබ්බ සුත්තං සුත්වා වගහ පරි
යොසානෙ සුවණ්ණමුරජසදිසං මහතිං නාදං පග්ගහෙත්වා සාධු
සාධු භගිනීති සාධුකාරමදාසි සා කොඑත්ථාතිආහ අහං භගිනි වෙ
ස්සවණොති, උපාසිකා කිර පඨමං සොතාපන්නා අහොසි. පච්ඡා
වෙස්සවණො තං සොධම්මතො සහොදරභාවං සන්ධාය උපාසි
කං භගිනී වා දෙන සමුදාචරති. උපාසිකායච විකාලෙ භාතික
භද්‍රමුඛ යස්සාදනිකාලං මය්හං සිති වුත්තො අහං භගිනිතසි පස
න්නා පසන්නාකාරං කරොමීති ආහ. තෙනහි භද්‍රමුඛ මම බෙ
තෙන නිප්ඵන්නං සාලිං කම්මකරා ආහරිත්වා නයකොනත්ති තං
තව පරියාය ආනා පෙතීති සාධු භගිනීති යක්ඛෙ ආනාපෙසි. තෙ
අඩ්ඪතෙරස කොට්ඨාගාරසතානි පූරෙසුං ත තොප්පභූති කො
ට්ඨාගාරං න ඌනමහොසි. නන්දමාතු කොට්ඨාගාරං වියාති ලො
කෙ නිදස්සනං අහොසි. වෙස්සවණො කොට්ඨාගාරානි පූරෙත්වා
භගවන්තං උපසඞ්කමි. භගවා විකාලෙ ආගතො සීති ආහ. ආමභ
ගවාති සබ්බං ආරොචෙසි. ඉමිනා කාරණෙන ආසන්නතරෙපි චා
තුම්මහාරාජිකභවනෙ වසන්තො වෙස්සවණො පච්ඡා ආගතො-
එරාවණස්ස පන න තස්ස අනන්තරකරණීයං අහොසි. තෙන ප
ඨමං ආගතො අයං පනුපාසකො කිඤ්චාපි අනාගාමී පකතිකාව
එකභත්තිකො. තථාපි තදා, උපොසථදිවසොතිකත්වා උපොසථ
ගානි අධිට්ඨාය සායණ්හ සමයං ධූනිවත්ථො සුපාරුතො පඤ්චස
ත උපාසක පරිවුතො ජෙතවනං ගන්ත්වා ධම්ම දෙසනං සුත්වා
අත්තනො ඝරං ආගම්ම තෙසං උපාසකානං සරණසීලඋපොසථා
නි සංසාදීපෙන්තං උපාසකධම්මං කථෙත්වා තෙ උපාසකෙ උය්‍යො
ජෙසි. තෙසං චිතසෙසව ඝරෙ මුට්ඨි ගන්ථප්පමාණ පාදකානි ප
ඤ්ච නාපිය මඤ්චකසතානි පාටෙමකතා චරකෙසු පඤ්ඤත්තා
නි හොන්ති. අත්තනො අත්තනො ඔවරකං පවිසිත්වා සමාපත්තිං
අප්පෙත්වා නිසීදිංසු. උපාසකොපි තථෙවාකාසි. තෙනච සම
යෙන සාවත්ථිනගරෙ සත්තපඤ්ඤාසකුලසතසහස්සානි වසන්ති.
මනුස්ස ගණනාය අට්ඨාරසකොටිමනුස්සා — තෙන පඨමෙ යා
මෙ ගතෙ අස්ස මනුස්ස පෙරිසද්දීනා සාවත්ථිනගරං මහාසමු
ද්දො විය එකසද්දං හොති. මජ්ඣිමයාම සමනන්තරෙ සො ස
ද්දො පටිප්පස්සම්භති. තම්හි කාලෙ උපාසකො සමාපත්තිතො වුට්
ඨාය අත්තනො ගුණෙ ආවජ්ජිත්වා යෙනාඝං මහාසුඛෙන ඵල

දුල්ලභො සුඛිතො විහරාමි. ඉදං සුඛං කං නිස්සාය ලද්ධන්ති වි
න්තෙත්වා භගවන්තං නිස්සායාති භගවති චිත්තං පසාදෙත්වා භ
ගවා එතරහි කතමෙන විහාරෙන විහරතීති ආවජ්ජෙන්තො දි
බ්බෙන චක්ඛුනා එරාවණං වෙස්සවණෙන දිස්වා දිබ්බාය සොතධා
තුයා ධම්මදෙසනං සුත්වා වෙනෙය්‍ය පරියායෙන ඤාණෙන තෙසං ප
සන්නචිත්තතං ඤත්වා "යන්නූනාහම්පි භගවන්තං උපසඞ්කමිතං
පටිපත්තිං සුණෙය්‍යන්"ති චින්තෙන්තො අහොසි. තස්මා සො එකනගරෙ
වසන්තොපි සබ්බපච්ඡා ආගන්ත්වා එවමෙව නෙසං අග්ගමග්ගමඤ්ඤ
සි. තෙනාහ "ආගඤ්ජිතො සන්තිකෙ නාගරාජා—පෙ—සොචාපි
සුත්වාන පතීතරූපො"ති, ඉදානි ඉතො බහිද්ධා ලොකෙ සම්මතෙ
හි සමණබ්‍රාහ්මණෙහි උක්කට්ඨභාවං භගවන්තං පසංසන්තො,
"යෙකෙචිමෙ"ති, ගාථාද්වයමාහ. තත්ථ "තිත්ථියා"ති, නන්දවච්ඡ
සංකිච්චෙහි ආදිපුග්ගලෙහි නීහි තිත්ථකරෙහි කතෙ ලද්ධි තිත්ථෙ
ජාතා තෙසං සාසනෙ පබ්බජිතා පූරණාදයො ඡසත්ථාරො. තත්ථ
නාථපුත්තො නිගණ්ඨො අවසෙසා ආජීවිකා තෙසබ්බෙ දස්සෙ
න්තො ආහ. "යෙකෙචිමෙවාදසීලා"ති මයං සම්මා පටිපන්නා
අඤ්ඤෙ මිච්ඡා පටිපන්නාති; එවංවාදකරණසීලා ලොකංමුඛස
ත්තීහි විතුදන්තා විචරන්ති. "ආජීවිකාවා"ති, තෙ එකාජඬ්ඩමුද්ධි
වෙස්ස දිට්ඨිං නිස්සිත්වා දස්සෙති; "නාතිතරන්ති"ති, නාතික්කම
න්ති; "සබ්බෙ"ති, අඤ්ඤෙපි යෙකෙචි තිත්ථියා සාවකාදයො;
තෙපිපරිග්ගහෙත්වා ආහ. "සිතොවජන්තංවියා"ති, යථාකො
චි සිතො ගච්ඡකාලො සීඝගාමිනං පුරිසං ගච්ඡන්තං නාතිතරෙ
ය්‍ය; එවංතෙ පඤ්ඤාගතියා අභාවෙන තෙ තෙ අත්ථප්පභෙදෙ
බුජ්ඣිතුං අසක්කොන්තානාසිතා. අතිජවනපඤ්ඤං භගවන්තං නා
තිතරන්තීති අත්ථො. "බ්‍රාහ්මණා වාදසීලා වුද්ධාවා"ති, එත්තාවතා
චංකීතාරුක්ඛපොක්ඛරසාති ජානුස්සොණි ආදයො දස්සෙති;
"අපිබ්‍රාහ්මණා සන්තිකෙචී"ති, ඉමිනා මජ්ඣිමාපි දහරාපි කෙවලං
බ්‍රාහ්මණා; "සන්ති" අත්ථි උපලබ්භන්ති; "කෙචී"ති, එවඅස්ස
ලායන වාසිට්ඨ අම්බට්ඨ උත්තරමාණවකාදයො දස්සෙති "අත්ථ
බද්ධා"ති, අපිතුම්හෙ ඉමං පඤ්හං ව්‍යාකරෙය්‍යාථ ඉමංකථං ජිඤ්ඤෙ
ය්‍යාති එවං අත්ථබද්ධා භවන්ති, "යෙචාපිවඤ්ඤු"ති "අඤ්ඤෙපි
යෙ මඤ්ඤෙවාදිනො"ති, එවං මඤ්ඤමානා චරන්ති ඛත්තිය පණ්ඩි
තා බ්‍රාහ්මණ බ්‍රහ්මදෙව යක්ඛාදයො අපරිමානා තෙපිසබ්බෙක
යි අත්ථබද්ධා භවන්තීති; දස්සෙති. එවං නානප්පකාරෙහි භගව
න්තං පසංසිත්වා ඉදානි ධම්මෙනෙව තං පසංසිත්වා ධම්මකථං යා
චන්තො "අයංහි ධම්මො"ති, ගාථාද්වයමාහ. තත්ථ "අයංහි ධ
ම්මො"ති, සත්තතිංසබොධපක්ඛියධම්ම සන්ධායාහ, "නිපුණො"
ති, සණ්හො දුප්පටිවිජ්ඣො, "සුඛො"ති, පටිවිජ්ඣමානො

ලොකුත්තර සුඛං අධිගති. තස්මා සුඛමධිගතත්තා සුඛොති; වුච්චති.
"සුප්පවුත්තො" ති, සුදෙසිතො; "සුස්සූසමානා" ති, සොතුකාම
ම්හා ත්‍යත්ථො; තන්නොවදාති, තංධම්මං අම්හාකංවද; ත්වංනොති
පිපාසො, ත්වං අම්හාකං වදාතිඅත්ථො, "සබ්බෙපිමෙ භික්ඛවො" ති,
තංඛණං නිසින්නානිකිර පඤ්චභික්ඛුසතානි හොන්ති තානි ද
ස්සෙන්තො යාචති. "උපාසකාචාපී" ති, අත්තනො පරිවාරෙ අ
ඤ්ඤෙච දස්සෙති. සෙසමෙත්ථ පාකටමෙව, අථභගවා අනාගාරිය
පටිපදං තාවදෙසෙතුං භික්ඛු ආමන්තෙත්වා "සුණාථමෙ භික්ඛ
වො" ති ආදිමාහ. තත්ථ "ධම්මං ධුතං තඤ්ච චරාථ සබ්බෙ" ති, කිලෙ
සධුනනානිනිධුතො. එවරූපං කිලෙසධුනනකං ධුතපද,ධම්මං; "සා
වයාමිවො" තංවමයා සාවිතං සබ්බෙ චරථ පටිපජ්ජථ මාපමාදිත්ථා
ති වුත්තං හොති. "ඉරියාපථන්ති" ගමනාදිචතුබ්බිධං; "පබ්බජි
තානුලොමිකන්ති" සමණසාරුප්පං සති සම්පජඤ්ඤ යුත්තං අර
ඤ්ඤ කම්මට්ඨානානුයොගවසෙන පවත්තනමෙවාති; අපරෙ "සෙ
වෙථනන්ති", තං ඉරියාපථං භජෙය්‍ය "අත්ථදස්සී" ති, හිතානුප
ස්සී; "මුනිමා" ති, බුද්ධිමා; සෙසමෙත්ථ ගාථාය පාකටමෙව, "නවෙ
විකාලෙ" ති එවං පබ්බජිතානුලොමිකං ඉරියාපථං සෙවමානො
ච දිවා මජ්ඣන්තික වීතික්කමං උපාදාය විකාලෙ නචරෙය්‍ය;
භික්ඛුයුත්තකාලෙ එව පන ගාමං පිණ්ඩායචරෙය්‍ය කිං'කාරනං? *
"අකාලචාරිංහි සජන්තිසඞ්ගා" ති, අකාලචාරිං පුග්ගලං රාගසං
ගාදයො අනෙකෙ සඞ්ගා සජන්ති පරිස්සජන්ති උපගූහන්ති අ
ල්ලියන්ති. තස්මා විකාලෙ නචරන්ති බුද්ධා තස්මා යෙ චතුසච්චබු
ද්ධා අරියපුග්ගලා තෙපි විකාලෙ පිණ්ඩාය චරන්තීති තෙන කිර
සමයෙන විකාල භොජන සික්ඛාපදං අපඤ්ඤත්තං හොති තස්මා
ධම්මදෙසනාවසෙනෙ වෙත්ථ පුථුජ්ජනානං ආදීනවං දස්සෙ
න්තො ඉමං ගාථමාහ. අරියා පන සමග්ග පටිලාභා එව තතො ප
ටිවිරතා හොන්ති එසා ධම්මතා එවං විකාල චරියං පටිසෙ ධෙත්වා
කාලෙචරන්තෙනාපි එවං චරිතබ්බන්ති දස්සෙන්තො ආහ. "රූපා
ච සද්දා" ති, තස්සත්ථො යෙ එතෙ රූපාදයො නානප්පකාරකං
මදං ජනෙන්තා "සත්තෙ සම්මදයන්ති" තෙසු පිණ්ඩපාතා පරි
සුද්ධිසුත්තාදීසු වුත්තනයෙන ඡන්දං විනෙත්වා යුත්තකාලෙ නෙව
පාතරාසං පවිසෙය්‍යාති එත්ථ පාතො අසිතබ්බොති පාතරාසො;
පිණ්ඩපාතස්සෙතං නාමං, සො යත්ථ ලබ්භති. සො පදෙසො පි
තං යොගෙන පාතරාසොති ඉධ වුත්තො යතො පිණ්ඩපාත ල
බ්භනොකාසං ගවෙසයන්ති එවමෙත්ථ අත්ථො වෙදිතබ්බො එවං
පවිට්ඨො "පිණ්ඩඤ්ච භික්ඛු—පෙ—සංගහිතත්තභාවො" තත්ථ
"පිණ්ඩ" න්ති මිස්සකභත්ත භික්ඛා, සාහි තතො තතො සමො
ධානෙත්වා සම්පිණ්ඩිතට්ඨෙන පිණ්ඩොති වුච්චති; "සමයෙනා"

ති. අනෙනා මජ්ඣන්තික කාලෙන; "එකොපටික්කම්මා"ති, කා
යවිවෙකං සම්පාදෙනෙතා අදුතියො නිවත්තිත්වා "අජ්ඣත්ත
චින්ති"ති, තිලක්ඛණං ආරොපෙත්වා ඛන්ධසන්තානං චිනෙත
නෙතා; "නමනො බහිද්ධා නිච්ඡාරෙ"ති, බහිද්ධාරූපාදීසු රාගාදි
වසෙන චිත්තං නාතිහරෙ "සංගහිතත්තභාවො"ති, සුට්ඨු ගහිත
චිතෙතා; එවං විහරනෙතා පන, "සචෙපිසො—පෙ—පරූපවා
දං" කිංවුත්තං හොති සොයොගාවචරො කිඤ්චිදෙව සොතුක
ම්‍යතාය උපගතෙන සාවකෙනවා කෙනචි අඤ්ඤතිත්ථිය ගහ
ට්ඨා දීනාවා ඉධෙව පබ්බජිතෙන භික්ඛුනාවා සද්ධිං සචෙපි ස
ල්ලපෙ අථ සචායං මග්ගඵලාදි පටිසංයුත්තො දසකථාවත්ථු ගො
දෙවා අතප්පසකටෙඨන පණීතො ධම්මො ධම්මං පණීතං තං උ
දාහරෙය්‍ය අඤ්ඤං පන පිසුනාවාචංවා පරූපවාදංවා අප්පමත්ත
කම්පි න උදාහරෙය්‍යාති, ඉදානි තස්මිං පරූපවාදෙ දොසං ද
ස්සෙනෙතා ආහ, "වාදම්හිඑකෙ"ති, තස්සත්ථො ඉධෙ කාචෙව
මොඝපුරිසා පරූපවාද සඤ්ඤිතං නානප්පකාරං විග්ගාහික ක
ථාභෙදං වාදං පටිසෙනියන්ති විරුජ්ඣන්ති යුජ්ඣිතුකාමා හුත්වා
සෙනාය පටිමුඛං ගච්ඡන්තා විය හොන්ති. තෙ මයං ලාමක ප
ඤ්ඤනප්පසංසාම. කිං කාරණං ? "තතො තතො නෙපසජන්ති
සංගා." යස්මා. තෙතාදිසකෙ පුග්ගලෙ තතො තතො වචන ප
ථෙතා සමුට්ඨාය විවාදසංගා පසජන්ති අල්ලීයන්ති. කිං පන කා
රණං ? පසජන්තීති චිත්තාගිතෙ තත්ථ ගමෙන්තිදූරෙ යස්මා තෙ
පටිසෙනියන්තා චිත්තං තත්ථගමෙන්ති යත්ථගතං සමථවිපස්ස
නානං දූරෙ හොතීති එවං පරිත්තං පඤ්ඤානං පවත්තිං දස්සෙ
ත්වා ඉදානි මහාපඤ්ඤානං පවත්තිං දස්සෙනෙතා ආහ. පිණ්ඩං
විහාරං—පෙ—වරපඤ්ඤ සාවකොති තත්ථ විහාරෙන පතිස්ස
යො; සයනාසනෙන මඤ්චපීඨන්ති තිහිපි පදෙහි සෙනාසන
මෙව වුත්තං; "ආපගන්ති" උදකං; "සංඝාටිරජූපවාහන"න්ති, පං
සුමලාදිනො සංඝාටිරජස්ස ධොවනං; "සුත්වාන ධම්මං සුගතෙ
න දෙසිත"න්ති, සබ්බාසං සංවරාදිසුපටිසං ඛායො තිසො චීව
රං පටිසෙවති; සීතස්ස පටිඝාතායාති ආදිනායයෙන භගවතා
දෙසිතං ධම්මං සුත්වා; "සංඛාය සෙවෙ වරපඤ්ඤ සාවකො,,ති එ
තං ඉධ පිණ්ඩන්තිවුත්තං. පිණ්ඩපාතං විහරාදිහි වුත්තං, සෙනා
සනං අපමුඛෙන දස්සිතං ගිලානපච්චයං සංඝාටියා චීවරන්ති;
චතුබ්බිධම්පි පච්චයං සංඛාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා
යාති ආදිනානයෙන පච්චවෙක්ඛිත්වා සෙවෙ වරපඤ්ඤ සාවකො
සෙවිතුං සක්කුණෙය්‍ය වරපඤ්ඤස්ස තථාගතස්ස සාවකො සෙ
ඛොවා පුථුජ්ජනොවා නිප්පරියායෙනවා අරහා සො හි චතුරප
ස්සෙනො සංඛා යෙකං පටිසෙවති. සංඛායෙතං අධිවාසෙති

සංඛායෙකං පරිවජ්ජෙති. සංඛායෙකං විනොදෙතීති වුත්තො ය
ස්මාච සංඛාය සෙවෙ වරපඤ්ඤසාවකො, තස්මාහි පිණ්ඩ-පෙ-
පොක්ඛරෙ වාරිබින්දු තථා හොතීති වෙදිතබ්බො එවං ඛීණාසව
පටිපත්තිං දස්සෙත්වා. අරහත්ත නිකූටෙන අනාගාරිය පටිප
දං නිට්ඨපෙත්වා ඉදානි අගාරිය පටිපදං දස්සෙන්තො "ගහට්ඨවත්තං
පනවො"ති ආදිමාහ. තත්ථ පඨමගාථාය තාව "සාවකො"ති අගා
රියසාවකො සෙසං උත්තානත්ථමෙව අයම්පන යොජනා යොම
යා ඉතො පුබ්බෙ කෙවලො අව්‍යාමිස්සො සකලො පරිපුණ්ණො
භික්ඛුධම්මො කථිතො එස ඛෙත්තවත්ථු ආදි පරිග්ගහෙහි සප
රිග්ගහෙන නලබ්භා ඵස්සෙතුං න සක්කා අධිගන්තුන්ති එවං
තස්ස භික්ඛුධම්මං පටිසෙධෙත්වා ගහට්ඨධම්මමෙව දස්සෙ
න්තො ආහ. "පාණංනහානෙ"ති, තත්ථ පුරිමඩ්ඪෙන තිකොටි ප
රිසුද්ධ පාණාතිපාතා වෙරමණී වුත්තා පච්ඡිමඩ්ඪෙන සත්තෙසු නි
ත පටිපත්තිං, තතිය පාදෙ, චෙත්ථ ඛග්ග විසාන සුත්තෙ චතුත්ථ
පාදෙ ථාවරතස භෙදෙ, මෙත්තසුත්තවණ්ණනාය සබ්බප්පකා
රතො වණ්ණිතො සෙසං උත්තානත්ථමෙව උප්පටිපාටියා පන
යොජනාකාතබ්බා තස ථාවරෙසු සබ්බෙසු භූතෙසු නිධාය ද
ණ්ඩං නහානෙ නඝාතයෙය්‍ය; "නානුජඤ්ඤා"ති, "නිධාය දණ්ඩ"
න්ති, ඉතො වා පරං වත්තෙය්‍යන්ති පාඨසෙසො ආහරිතබ්බො ඉ
තරථාහි න පුබ්බෙන නාපරං සන්ධියතීති එවං පඨමසික්ඛාපදං ද
ස්සෙත්වා ඉදානි දුතිය සික්ඛාපදං දස්සෙන්තො ආහ. "තතො අ
දින්න"න්ති තත්ථ "කිඤ්චි"ති, අප්පංවා බහුංවා; "ක්වචි"ති ගාමෙ
වා අරඤ්ඤෙවා "සාවකො"ති අගාරිය සාවකො; "බුජ්ඣමා
නො"ති පරසන්තකමිදන්ති ජානමානො; "සබ්බං අදින්නං පරි
වජ්ජයෙය්‍ය"ති එවංහි පටිපජ්ජමානො සබ්බං අදින්නං පරිවජ්ජ
යෙය්‍ය; නො අඤ්ඤථාති අධිප්පායො. සෙසමෙත්ථ වුත්තනයඤ්ඤෙව පා
කටඤ්ඤෙවාති, එවං දුතිය සික්ඛාපදම්පි තිකොටිපරිසුද්ධං දස්සෙත්වා
උක්කට්ඨ පරිච්ඡෙද තොප්පභූති තතියං දස්සෙන්තො ආහ. "අ
බ්‍රහ්මචරිය"න්ති—තත්ථ "අසම්භුනන්තො"ති අසක්කොන්තො
ඉදානි චතුත්ථ සික්ඛාපදං දස්සෙන්තො ආහ. "සභග්ගතොවා"ති-
තත්ථ "සභග්ගතො"ති, සන්ථාගාරාදිගතො "පරිසග්ගතො"ති, පූ
ගමජ්ඣගතො; සෙස මෙත්ථ උත්තානඤ්ඤෙව පාකටඤ්ඤෙවාති, එවං ච
තුත්ථ සික්ඛා පදම්පි තිකොටිපරිසුද්ධං දස්සෙත්වා පඤ්චමං දස්සෙ
න්තො ආහ "මජ්ජඤ්චපානං"න්ති, "තත්ථ මජ්ජඤ්ච පානං"න්ති ගා
ථා බන්ධසුඛත්ථං එවං වුත්තං අයම්පනත්ථො "මජ්ජපානඤ්ච
න සමාචරෙය්‍ය"ති "ධම්මං ඉම"න්ති, මජ්ජපාන වෙරමණී ධ
ම්මං "උම්මාදනන්ති" තං උම්මාද පරියොසානං, යොහිසබ්බලහු
සො මජ්ජපානස්ස විපාකො සො මනුස්සභූතස්ස උම්මත්තක සං

චිත්තන්තිකො හොති "ඉතිනං විදිත්වා"ති, ඉති නං මජ්ජපානං ඤ
ත්වා සෙසමෙත්ථ උත්තානනයෙනෙව පාකටමෙවාති. එවං පඤ්චම්
සික්ඛාපදම්පි නිකොටිපරිසුද්ධං දස්සෙත්වා ඉදානි පුරිමසික්ඛාප
දානම්පි මජ්ජපානමෙව සංකිලෙසකරඤ්ච භෙදකරඤ්ච දස්සෙ
ත්වා දළ්හතරං තතො වෙරමණියං නියොජෙන්තො ආහ. "ම
දා හි පාපානි කරොන්තී"ති, තත්ථ "මදා"ති, මදහෙතු, හිකාරො නිපා
තො පදපූරණමත්තො—"පාපානි කරොන්තී"ති පාණාතිපාතාදී
නි සබ්බාකුසලානි කරොන්ති; "උම්මාදනං මොහන"න්ති, පර
ලොකෙ උම්මාදනං ඉධලොකෙ මොහනං; සෙසමුත්තානත්ථ
මෙව එත්තාවතා අගාරිය සාවකස්ස නිච්චසීලං දස්සෙත්වා ඉදා
නි උපොසථඞ්ගානි දස්සෙන්තො "පාණං න හානෙ"ති ගාථාද්වය
මාහ. තත්ථ "අබ්‍රහ්මචරියා"ති අසෙට්ඨචරියභූතා; "මෙථුනා"ති,
මෙථුනධම්මසමාපත්තිතො, "රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභො
ජන"න්ති, රත්තිම්පි න භුඤ්ජෙය්‍ය දිවාපිකාලාතික්කන්තං භොජ
නං න භුඤ්ජෙය්‍ය; "න ච ගන්ධ"න්ති, එත්ථ ගන්ධගහණෙන විලෙ
පනචුණ්ණාදීනිපි ගහිතානෙවාති වෙදිතබ්බානි; "මඤ්චෙ"ති ක
ප්පියමඤ්චෙ; "සන්ථතෙ"ති, තට්ටිකාදිහි කප්පියත්ථරණෙහි
අත්ථතෙ ඡමායං පන ගොනකාදිසන්ථතායම්පි වට්ටති; "අට්ඨ
ඞ්ගික"න්ති, පඤ්චඞ්ගිකංවියතුරියං න අඞ්ග විනිමුත්තං; "දු
ක්ඛන්තගූනා"ති, වට්ටදුක්ඛස්සඅන්තං ගතෙන සෙස මෙත්ථ පා
කටමෙව පච්ඡිමද්ධං පන සංගීතිකාරෙහි වුත්තන්තිපි ආහු. එවං
උපොසථඞ්ගානි දස්සෙත්වා ඉදානි උපොසථකාලං දස්සෙන්තො
ආහ. "තතො ච පක්ඛස්සා"ති, තත්ථ "තතො"ති, පදපූරණම
ත්තෙ නිපාතො, "පක්ඛස්සු පවස්සුපොසථ"න්ති, එවං පරපදෙ
න යොජෙතබ්බං පක්ඛස්ස චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමින්ති එතෙ
තයො දිවසෙ උපවස්ස උපොසථං එතං අට්ඨඞ්ගිකං උපොසථං
උපගම්මවසිත්වාති. "පාටිහාරිය පක්ඛඤ්චා"ති, එත්ථ පන වස්සූප
නායිකාය පුරිමභාගෙ ආසාළ්හමාසො අන්තොවස්සෙ තයො
මාසා කත්තිකමාසොති ඉමෙ පඤ්චමාසා පාටිහාරියපක්ඛොති
වුච්චන්ති; ආසාළ්හකත්තිකඵග්ගුණමාසා තයො යෙවාති අපරෙ
පක්ඛුපොසථදිවසානං පුරිමපච්ඡිමදිවසවසෙන පක්ඛෙ පක්ඛෙ
තෙරසීපාටිපද සත්තමීනවමීසංඛාතා චත්තාරො චත්තාරො දිවසා
ති අපරෙ, යං රුච්චති තං ගහෙතබ්බං සබ්බං වා පන න පුඤ්ඤ
න හාසයිතබ්බං එවමෙතං පාටිහාරිය පක්ඛඤ්ච පසන්නමාන
සො අට්ඨඞ්ගුපෙතං සුසමත්තරූපං සුපරිපුණ්ණරූපමෙකම්පි දිවසං
පරිච්චජන්තො අට්ඨඞ්ගුපෙතං උපොසථං උපවස්සාති සම්බන්ධි
තබ්බං එවංඋපොසථකාලංදස්සෙත්වා එතානි එතෙසු කාලෙසු
එතංඋපොසථං උපවස්සං කාතබ්බං තංදස්සෙන්තො ආහ. "තතො

නොචපාතො" තිවාචඡ්ඡොපි "තතො"ති පදපූරණමත්තෙනනිපා
තොඅනන්තරත්ථො. අථානිවුත්තං හොති. "පාතො" තිඅපරජ්ජු
දිවසෙ පුබ්බභාගෙ "උපවුත්ථුපොසථො"ති උපවසිත උපොස
ථො; "අන්නෙන"ති. යාගුභත්තාදිනා "පාණෙන"ති, අට්ඨවි
ධපානකෙන "අනුමොදමානො"ති, අනුමොදමානො නිරන්ත
රං මොදමානොති අත්ථො; "යථාරහ"න්ති අත්තනො අනුරූ
පෙන යථාසත්තිං යථාබලන්තිවුත්තං හොති, "සංවිභජෙථා"ති,
භාජෙය්‍ය පතිමානෙය්‍ය; සෙසං පාකට මෙව එවං උපවුත්ථු
පොසථස්ස කිච්චං දස්සෙත්වා ඉදානිස්ස යාවජීවිකං ගරුවත්තං
ආජීවපාරිසුද්ධිංච කථෙත්වා තාය පටිපදාය අධිගන්තබ්බට්ඨානං
දස්සෙන්තොආහ. "ධම්මෙනමාතාපිතරො"ති, තත්ථ "ධම්මෙ
නා"ති, ධම්මලද්ධෙනභොගෙන "භරෙය්‍ය"ති, පොසෙය්‍ය, "ධ
ම්මිකංසොවණිජ්ජ"න්ති, සත්ථවණිජ්ජා සත්තවණිජ්ජා විසවණිජ්ජා
මංසවණිජ්ජා සුරාවණිජ්ජාති ඉමාපඤ්ච අධම්මවණිජ්ජා වජ්ජෙත්වා
අවසෙසාධම්මිකාවණිජ්ජා වණිජ්ජාමුඛෙනචෙත්ථ කසිගොරක්ඛා
දි අපරෙපිධම්මි කොවොහාරෙ සංගහිතො සෙසමුත්තානත්ථ
මෙව අයම්පන යොජනා සොනිච්චසීල උපොසථසීල දානධම්ම
සමන්නාගතො අරියසාවකො පයොජයෙ ධම්මිකංවණිජ්ජං ත
තො ලද්ධෙනච ධම්මතො අනපෙතත්තා ධම්මෙන භොගෙන
මාතා පිතරෙ භරෙය්‍ය අථසො ගිහී එවං අප්පමත්තො ආදිතො
පපඤ්ච නිවුත්තං ඉමං වත්තං වත්තයං කායස්සභෙදා යෙ තෙ අත්ත
නොආභාය අන්ධකාරං විධමිත්වා ආලොකකරණෙන සයං පභා
ති ලද්ධ නාමාජ කාමාවචරදෙවාතෙ සයම්පභෙනාම දෙවෙ උ
පෙති භජති අල්ලියති; තෙසං නිබ්බත්තට්ඨානෙ නිබ්බත්තතීති.

ධම්මිකසුත්තවණ්ණනානිට්ඨිතා.

---

# ඓරාවණ දිව්‍යපුත්‍ර වර්ණනාව.

අයං කිර එරාවණො නාමදෙවපුත්තො, මේ ඓරාවණනාම් දිව්‍ය
පුත්‍රතෙම වනාහි; කාමරූපි දිබ්බවිමානෙවසති, තව්තිසාදිව්‍ය
ලෝකයෙහිවෙසෙයි, සො, හෙතෙම, යදා, යම්කලෙක; ස
ක්කො, ශක්‍රදිව්‍යරාජතෙම, උය්‍යානකීළංගච්ඡති, උයන්කෙළිය
ටයේද; තදා, එකල්හි; දියඩ්ඪයොජනසතං, එකසියපනස්යොදු
නක් (150) කායංඅභිනිම්මිණිත්වා, ශරීරයක් නිර්මිතකොට, තෙ
ත්තිංසකුම්භමාපෙත්වා, තිස්තුන (33) ක් කුම්භමවා; එරාවණො
නාමහත්ථීහොති, ඓරාවනනාම් හස්තියෙක්වෙයි; තස්ස, ඔහු
ගේ; එකෙකස්මිංකුම්භෙ; එකඑකකුම්භයෙහි; වෙවෙදන්තා, ද

ළදෙතක් දෙකක්වශයෙන්; හොන්ති, හැටහය (66) ක් වන්නා හුවෙත්; එකෙකස්මිංදන්තෙ, එකඑකදලයෙක; සත්තසත්ත පොක්ඛරණියො, පොකුණු සතක් සතක්වශයෙන් හාරසියහැට දෙක (462) ක් වෙත්; එකෙකිස්සාපොක්ඛරණියා, එකඑකපො කුණක; සත්තසත්තපදුමිණියො, මල්පඳුරු සතක් සතක් වශ යෙන් තුන්දහස්දෙසියතිස්හතර (3234) ක් වෙත්; එකෙකිස්සා පදුමිණියා, එකඑකමල්පඳුරක; සත්තසත්තපුප්ඵානි, මල්සතක් සතක්වශයෙන් විසිදෙදාස්හසියතිස්අට (22638) ක් වෙත්; එකෙ කස්මිංපුප්ඵෙ, එකඑකමලක; සත්තසත්තපත්තානි, මල්පත්‍රසතක් සතක් වශයෙන් මල්පෙති එක්ලක්ෂපනස්අටදහස් හාරසියහැ ටහය (158466) ක් වෙත්; එකෙකස්මිංපත්තෙ, එකඑක මල්පත්‍ර යක සත්තසත්ත අච්ඡරායො, දිව්‍යාඞ්ගනාවෝ සත්සත්දෙනාව ශයෙන්එකොළොස්ලක්ෂ නවදහස් දෙසිය හැටදෙදෙනෙ (1109262) ක්; නච්චන්ති, නටත්.

# ධම්මිකසූත්‍රසන්නය.

එවමෙමසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතව
නෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ—අථඛො ධම්මිකො උපාසකො
පඤ්චහි උපාසක සතෙහි සද්ධිං යෙන භගවා, තෙනුපසංකමි. උ
පසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකම
න්තං නිසින්නොඛො ධම්මිකො උපාසකො භගවන්තං ගාථාහි
අජ්ඣභාසි—

1 පුච්ඡාමි තං ගොතම භූරි පඤ්ඤ
කථංකරො සාවකො සාධුහොති
යොවා අගාරා අනගාරි මෙති
අගාරි නොවා පනුපාසකාසෙ.

---

මෙ,(ආයුස්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්ස) මාවිසින්; එ
වංසුතං, (මේධාර්මිකසූත්‍රාන්ත ධර්මදෙශනාව) මෙයාකාරයෙන්
අසනලදී; එකංසමයං; (ගර්භාවක්‍රාන්තිසමයාදිවූ) එක්ධර්මදේශ
සනා සමයෙක්හී; භගවා, භාග්‍යවත්තෙම, සාවත්ථියං, ශ්‍රාවස්ති
නම් පුරප්‍රවරයන්නයෙහිවූ; ජෙතවනෙ, (ජෙතනම් රාජකුමාර
යාවිසින් රොපිතසංවර්ධිතහෙයින්) ජෙතවනනම්වූ; අනාථපිණ්ඩි
කස්සආරාමෙ, අනේපිඩුමහසිටානූ විසින් සිව්පනස්කෙළක් ධනය
වියදම්කොට කරවාපිළිගන්වනලද ජෙතවනාරාමයෙහි; විහර
ති; (චතුර්විධඊර්‍යාපථවිහරණයෙන්යුක්තව) වැඩවාසයකර වදාරණ
සේක; අථඛො, එකල්හී වනාහී; ධම්මිකොඋපාසකො, ධාර්මික
නම් උපාසකතෙම; පඤ්චහි උපාසක සතෙහිසද්ධිං, පන්සිය
යක්උපාසකවරුන්හාසමඟ; භගවා,භාග්‍යවත් සම්‍යක්සම්බුද්ධ සර්‍ව
ඥරාජොත්තමයානන්වහන්සේ; යෙන, යම්තැනෙක්හී (වැඩවා
සයකරවදාරණසේක්ද;) තෙන, එතැන්හී; උපසඞ්කමි, එළඹියේ
ය, උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට;
අභිවාදෙත්වා, නමස්කාරකොට;එකමන්තංනිසීදි, එකත්පසෙක
හුන්නේය; එකමන්තං නිසින්නොඛො, එකත්පස්වහුන්නාමවූ; ධ
ම්මිකො උපසකො, ධාර්මිකනම්උපාසකතෙම; භගවන්තං. (ස
නරාමරලොකදිවාකර සම්‍යක්සම්බුද්ධ) සර්‍වඥරාජොත්තමයානන්ව
හන්සේට; ගාථාහි, (අක්ෂරපදනියමිත) ශ්‍රන්ථවලින්හෙවත් ගාථා
වලින්; අජ්ඣභාසි, මෙසේසැළකළේය.

1, භූරිපඤ්ඤ, මහත්ප්‍රඥාවක්ඇති, ගොතම, ගෞතමගොත්‍රා
දභූතවූ බුදුරජානන්මහන්ස; තං, නුබවහන්සේ; පුච්ඡාමි, විචාර
මි, යො, යමෙක්; අගාරා, ගිහිගෙයින්නික්ම; අනගාරිමෙතිවා,

2 තුවංහි ලොකස්ස සදෙවකස්ස
ගතිං පජානාසි පරායණඤ්ච
නචත්ථි තුල්‍යො! නිපුණත්ථදස්සී
තුවං හි බුද්ධං පවරං වදන්ති.

3 සබ්බං තුවං ඤාණ මවෙච්ච ධම්මං
පකාසෙසි සත්තෙ අනුකම්පමානො
විවත්තච්ඡද්දොසි සමන්ත චක්ඛු
විරොචසි විමලො සබ්බලොකෙ.

4 අගඤ්ජි තෙ සන්තිකෙ නාගරාජා
එරාවණො නාම ජිනො'ති සුත්වා
සො පිතයා මන්තයිත්වා අජ්ඣගමා
සාධූ'ති සුත්වාන පතීත රූපො.

---

ශාසනයට පැමිණෙන්නේහෝ වේද; අගාරිනොවා, ගිහිගෙයිව සන්නාවූ හෝ, උපාසකාසෙ, උපාසකයයිකියනලද්දේවේද; යේ මේ ශ්‍රාවකදෙදෙනාඅතුරෙන්; කථංකාරොසාවකො, කවරප්‍රතිපත්තියක් පළිපදින්නාවූ, ශ්‍රාවකතෙම; සාධුහොති, යහපත්වේද.

2, තුවංහි, තුඹවහන්සේවනාහි, සදෙවකස්සලොකස්ස, දෙවියන්සහිතවූ ලොකයාගේ, ගතිං, අධ්‍යාසයද නොහොත් නිරයාදී පංචගතියද; පරායනඤ්ච, අමෘතමහානිර්වාණයද; පජානාසි, දැනවදාරන්නෙහිය. හෙවත් (නරකගතිය 2 තිර්සන්ගතිය, 3 ප්‍රේතගතිය 4 අසුරගතිය 5 දිව්‍යබ්‍රහ්මසංඛ්‍යාතගතියද නිවනදයන මේ සියල්ලද්දැනවදාරණසේක.) තුල්‍ය, තුඹවහන්සේහාසමානවූ; නිපුණත්ථදස්සී, අර්ථදර්ශිනයෙහි ව්‍යක්තකෙනෙක්; නචඅත්ථි, නොමඇත්තේය; හි එසේමැයි, ත්වං. තුඹවහන්සේ; පවරං. ප්‍රවර (උතුම්)වූ; බුද්ධං, බුද්ධයයි, වදන්ති, කියති.

3, තුවං; තුඹවහන්සේ, සබ්බංඤාණං, සියළු විදර්ශනාඥානයද; ධම්මං, ප්‍රතිපත්තිධර්මයද; අවෙච්ච, (ස්වයම්භූඥානයෙන්) දැන; සත්තෙඅනුකම්පමානො, සත්වයන්ටඅනුකම්පාවෙන්; පකාසෙසි, ඒ ප්‍රතිපත්තිධර්මය ප්‍රකාශකරන්නෙහිය; විවත්තච්ඡද්දොසි, විවෘත කරණලද ක්ලෙශඡදනයඇත්තෙහිය; සමන්තචක්ඛු, සර්වඥතාඥානයද ඇත්තෙහිය, හෙවත් (දිවැස 2 පැණැස 3 මසැස 4 බුදුඇස 5 සමතැසයන පසැස්ඇත්තෙහිය) එහෙයින්, සබ්බලොකෙ, (කාමලෝකය. රූපලෝකය. අරූපලෝකයයන) ත්‍රිවිධලෝකයෙහි; විමලො, නිර්මලවූයේ; විරොචසි, චන්ද්‍රයාසේබබලන්නෙහිය.

4, තෙසන්තිකෙ, තුඹවහන්සේගේසමීපයට; ජිනොතිසුත්වා,(පස්

5 රාජා'පි තං වෙස්සවණො කුවෙරො
උපෙති ධම්මං පරිපුච්ඡමානො
තස්සාපි ත්වං පුච්ඡිතො බ්‍රෑසි ධීර
සො චා'පි සුත්වාන පතීත රූපො.

6 යෙ කෙචි මෙ තිත්ථියා වාදසීලා
ආජීවිකා වා යදිවා නිගණ්ඨා
පඤ්ඤාය තං නාතිතරන්ති සබ්බෙ
ඨිතො වජන්තං විය සීඝගාමිං.

7 යෙ කෙචි මෙ බ්‍රාහමණා වාදසීලා
වුඩ්ඪා චාපි බ්‍රාහමණා සන්ති කෙචි
සබ්බෙ තයී අත්ථබද්ධා භවන්ති
යෙ වා'පි ච'ඤ්ඤෙ වාදිනො මඤ්ඤමානා.

---

මරුත්බිද) දිනූයේයයි අසා; එරාවණොනාගරාජා, ඓරාවණනම් දිව්‍යරාජතෙම, ආගඤ්ඡි, ආයේය; සොපි, හෙතෙමේද; තයා; තුබවහන්සේහාසමග, මන්තයිත්වා, මන්ත්‍රණයකොට, හෙවත් ප්‍රශ්නවිචාරා; සුත්වාන, (එසේවිසඳුවදාරණලද) ප්‍රශ්නයන්අසා; සාධූති, යහපතැයිකියා; පතීතරූපො, සතුටුසිත්ඇතිව; අජ්ඣගමා, සතුතිප්‍රශංසාකොට ගියේය.

5 වෙස්සවණො කුවෙරොරාජාපි, වෛශ්‍රවණනම් කුවෙර රජද; ධම්මං, ධර්මය; පරිපුච්ඡමානො, විචාරනුයේ; තං, තුබවහසේකරා; උපෙති, එළඹෙයි; ධීර, දසබලධාරිවූ බුදුරජාණන්වහන්ස; ත්වං තුබවහන්සේ; පුච්ඡිතො, විචාරණලද්දෑවූ; තස්සාපි, ඔහටද; බ්‍රෑසි, වදාළසේක, සොචාපි, හෙතෙමේද; සුත්වාන; (එසේදෙශනාකරවදාරණලද) ධර්මයඅසා; පතීතරූපො, ප්‍රසන්නසිත්ඇතිවූයේය.

6 වාදසීලා, ("මයංසම්මාපටිපන්නා අඤ්ඤෙමිච්ඡාපටිපන්නාති' යනාදිවශයෙන්) වාදකරණස්වභාවඇත්නාවූ; යෙකෙචිමෙතිත්ථියා. යම්කිසිමේ තීර්ථකකෙනෙක්ඇද්ද; ආජීවිකාවා, යම්කිසි ආජීවකකෙනෙක්ඇද්ද; යදි ඉඳින්; නිගණ්ඨාවා. යම්කිසි නිගණ්ඨකෙනෙක්ඇද්ද; සබ්බෙ, මෙසී සියල්ලෝ; ඨිතො, සිටියකුපතු කොට; වජන්තංසීඝගාමිංවිය, යන්නාවූ සීඝ්‍රගාමීපුද්ගලයෙක්මෙන්; තං. තුබවහන්සේ; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; නාතිතරන්ති' නොසික්මවත්

7 වාදසීලා, වාදසීලිවූ; යෙකෙචිබ්‍රාහමණා, චඞ්කිතාරුක්ඛාදි යම්කිසිබ්‍රාහමණකෙනෙක්ඇද්ද; වුඩ්ඪා.වයොවෘද්ධවූ; අපි, නැවත; වුඩ්ඪා, උසස්කුලඇත්තාවූ, යෙකෙචිමෙබ්‍රාහමණාසන්ති, යම්කිසිබ්‍රා

8 අයං හි ධම්මො නිපුණො සුබොච
යො යං තයා භගවා සුප්පවුත්තො
තමෙ'ව සබ්බෙ සුස්සූස මානා
තං නො* වද පුච්ඡිතො බුද්ධ සෙට්ඨ.

9 සබ්බෙ'පි'මෙ භික්ඛවො සන්නිසින්නා
උපාසකාවා'පි තථෙ'ව සොතුං
සුණන්තු ධම්ම ,විමලෙනා'නුබුද්ධං
සුභාසිතං වාසවස්සෙ'ව දෙවා.

---

ශ්‍රමණකෙනෙක්ඇද්ද; අපි, නැවත; වාදිනොමඤ්ඤමානා, වාදී හුයයි හඟිනුලබන්නාවූ; යෙවඅඤ්ඤෙ, ක්‍ෂත්‍රිය බ්‍රාහමණාදි යම් අනිකුදුකෙනෙක්ඇද්ද; සබ්බෙ. ඒ සියල්ලෝ; තයි' නුබවහන් සේකෙරෙහි; අත්ථබද්ධාභවන්ති, අත්ථබදින්නාහු හෙවත් (නුබව හන්සේ හාවාදකිරීමපිණිස) ගැඹුරුප්‍රශ්න ගොතන්නාහුවෙත්.

8 භගවා, භාග්‍යවතුන්වහන්ස; තයා, නුබවහන්සේවිසින්; යො අයංධම්මො, (චතුන්නංසතිපට්ඨානානං, චතුන්නංසම්මප්පධානා නං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලා නං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ග ස්සාති" යනාදින්දක්වනලද) යම්මේ සතතිස්බොධි පාක්‍ෂිකධ ර්ම්යක්ඇද්ද; සබ්බෙ, ඒ සියළුධර්ම්ය; සුප්පවුත්තො මනාකොට දෙශනාකරණලදද; අයංහි, මෙධර්ම්යවනාහි; නිපුණො, නිපුණ ය; හෙවත් (සියුම් අර්ථඇත්තේය) සුබොච (ලෝකෝත්තරසුව එළවනහෙයින්) සැපය; තමෙව, ඒ ධර්ම්යම; සුස්සූසමානා, අ සනුකැමැත්තම්හ; බුද්ධසෙට්ඨ, සර්වඥශ්‍රෙෂ්ඨයන්වහන්ස; තං, නු බවහන්සේ පුච්ඡිතො, විචාරණලද්දෑවූ; නො, අපට; වද, ඒ ධ ර්මයදේශනාකරවදාළමැනවයි යාඥාකලේය.

9 ධම්මංසොතුං, ධර්ම්යඅසන්ට; සන්නිසින්නා, රැස්වහුන්නාවූ; සබ්බපිමෙභික්ඛවො, සියළුම මේ භික්‍ෂූහුද; තථෙව, එසේමඋන් නාවූ; උපාසකාචාපි, උපාසකවරුද; විමලෙන, සර්වඥරාජොත්තම යානන්වහන්සේ විසින්; අනුබුද්ධං, විශේෂයෙන් අවබෝධකරණ ලද නිර්වාණධර්ම්ය; වාසවස්ස, දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රදෙ, වෙන්ද්‍රයාගේ; සුභාසිතං, යහපත් වචනය අසන්නාවූ; දෙවාඉව (දෙදෙව්ලොව) දෙවියෝමෙන්; සුණන්තු (කන්යොමුකොට) සා දරයෙන් අසත්වා.

---

* තුවංනොතිපි පාඨො.

10 සුණාථ මෙ භික්ඛවො සාවයාමි වො
ධම්මං ධුතං තඤ්ච ධරාථ සබ්බෙ
ඉරියා පථං පබ්බ ජිතානු ලොමිකං
සෙවෙථ නං අත්ථ දස්සී මුතී මා.

11 නවේ විකාලෙ විචරෙය්‍ය භික්ඛු
ගාමඤ්ච පිණ්ඩාය චරෙය්‍ය කාලෙ
අකාලචාරිංහි සජන්ති සඞ්ගා
තස්මා විකාලෙ නචරන්ති බුද්ධා.

12 රූපාච සද්දාච රසාච ගන්ධා
ඵස්සාච යෙ සම්මදයන්ති සත්තෙ
එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
කාලෙන සො පවිසෙ පාතරාසං.

---

10 භික්ඛවො, මහණෙනි; වො, තොපට; සාවයාමි, අස්වමි, හෙවත් ප්‍රකාශකොට කියමි; මෙ, මාගේධර්මය; සුණාථ, අසා දරාගණිව්; සබ්බෙ, සියල්ලෝ; ධම්මංධුතංතඤ්ච,(කෙලෙසසන්සිඳුවන්නා වූ තෙලෙස්) ධූතාදි ප්‍රතිපත්තිධර්මය, ධරාථ, දරව්; හෙවත් (අප්‍රමාදව යහපත්කොට රක්‍ෂාකරව්) පබ්බජිතානුලොමිකං; ප්‍රව්‍රජ්ජිතයන්ට අනුරූපවූ; ඉරියාපථං, චතුර්විධර්යාපථය හෙවත් (ශ්‍රමණ සාරූප්‍ය සිහියෙන් යුක්තව ගොචරයෙහි හැසිරියයුතුයි) තංඅත්ථ දස්සී, තමහට වැඩදක්නාවූ; මුනිමා, පණ්ඩිතතෙම; සෙවෙථ, සේවනය කරන්නේය.

11 භික්ඛු, මහණතෙම; විකාලෙ, නොකල්හී; න විචරෙය්‍ය, නොහැසිරෙන්නේය; ගාමඤ්ච, ගමටද; කාලෙ, පෙරවරුකාලයෙහි; චෙ, ඉඳින්; පිණ්ඩායචරෙය්‍ය, පිඬුපිණිසහැසිරෙන්නේය; අකාලචාරිංහි, නොකල්හි හැසිරෙන්නාවූ පුද්ගලයා; සඞ්ගාසජන්ති, රාගාදිකෙලෙස සමූහයෝ වැළඳගණිත්; තස්මා, එහෙයින්; විකාලෙ, නොකල්හී; බුද්ධා, ඥාතබුද්ධ ශ්‍රාවකයෝ; නචරන්ති, නොහැසිරෙත්.

12 රූපාච, රූපයද; සද්දාච, ශබ්දයද; රසාච, රසයද; ගන්ධාච, සුගන්ධයද; ඵස්සාච, ස්පර්ශයද; යන. යෙ. යම්පඤ්චකාමයෙක්දැද්දෑ; තෙ, ඒපඤ්චකාමගුණයෝ; සත්තෙ, සත්වයන්; සම්මදයන්ති, විශෙෂයෙන් මුළාකරන්නාහුය, එතෙසුධම්මෙසු, මේ පඤ්චකාමධර්මයෙහි, ඡන්දංවිනෙය්‍ය, ආලයහැර; කාලෙන, පෙරවරුකාලයෙහි; සො, ඒ ඥාතබුද්ධශ්‍රාවකතෙම; පාතරාසං, පිඬුපිණිස; පවිසෙ ප්‍රවිෂ්ටවන්නේය.

13 පිණ්ඩඤ්ච භික්ඛු සමයෙන ලද්ධා
එකො පටික්කම්ම රහො නිසීදෙ
අජ්ඣත්ත චින්තී නමනො බහිද්ධා
නිච්ඡාරයෙ සං ගහිතත්ත භාවො.

14 සචෙපි සො සල්ලපෙ සාවකෙන
අඤ්ඤෙන වා කෙනචි භික්ඛුනාවා
ධම්මං පණීතං තමුදාහරෙය්‍ය
නපෙසුනං නොපි පරූපවාදං.

15 වාදංහි එකෙ පටිසෙනි යන්ති
න තෙ පසංසාම පරිත්ත පඤ්ඤෙ
තතො තතො නෙ පසජන්ති සඞ්ගා
චිත්තංහි තෙ තත්ථ ගමෙන්ති දූරෙ.

---

**13** භික්ඛු, මහණතෙම; පිණ්ඩඤ්ච, පිණ්ඩපාතයද; සමයෙනලද්ධා, පෙරවරුකාලයෙහිලැබ; එකොපටික්කම්ම. හුදකලාවනැවතී; රහොනිසීදෙ, රහසිගතවහිද; සංගහිතත්තභාවො, තිලක්ඛණමෙනෙහිකිරීම්වශයෙන් ගන්නාලද ආත්මභාවය ඇතිව; අජ්ඣත්තචින්තී, අධ්‍යාත්මිකය සිතමින් හෙවත් (කෙසා ලොමා නඛා යනාදි දෙතිස්කුනපකොට්ඨාසය මෙනෙහිකරමින්) මනො, තමාගේ සිත; බහිද්ධා, රූපාදි බාහිර අරමුණෙහි; න නිච්ඡාරයෙ, නොවිසුරුවන්නේය.

**14** සො, ඒ යොගාවචර භික්ෂුතෙම; සාවකෙනවා, ප්‍රතිපත්තිය අසනුකැමතිව එළඹුනාවූ ශ්‍රාවකකෙනෙක් සමගහෝ; අඤ්ඤෙන කෙනචිවා, අනිකුදු තීර්ථකාදි කිසිකෙනෙක් සමගහෝ; භික්ඛුනාවා, (මේ ශාසනයෙහි පැවිදි) භික්ෂුවක් සමගහෝ; සචෙපිසල්ලපෙ, ඉඳින් කථාකෙරේද; තං, ඕහට; පණීතංධම්මං, අල්පෙච්ඡ කථාදි මාර්ගඵල ප්‍රතිසංයුක්තවූ උතුම් ධර්මය; උදාහරෙය්‍ය, පහළකරන්නේය හෙවත් කියන්නේය; නපෙසුනං, පෛශුන්‍ය වචන නොකියන්නේය; අපි, නැවත; නපරූපවාදං, පරහට උපවාද නොකරන්නේය.

**15** වාදංහි, (විග්‍රාහික කථා සංඛ්‍යාත) වාදයවනාහි; එකෙ, සමහරඅඥනකෙනෙක්; පටිසෙනියන්ති, සෙනගමැදට පමුණුවත්; තෙ පරිත්තපඤ්ඤෙ, ඒ ලාමක ප්‍රඥාවතුන් කෙරෙහි; න පසංසාම, ප්‍රශංසානොකරම්හ; කාරුණිකමයත්; තතොතතො, ඒ ඒ වාදමුඛයෙන්; තෙ, ඔවුන්; සංගා, විවාදමූලිකකෙල සසමූහයෝ; පසජන්ති, වැලඳගණිත්; නෙ, ඔවුන්ගේ; චිත්තංහි, සිතවනාහි; තත්ථ,

16 පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සංඝාටි රජූපවාහනං
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සඞ්ඛාය සෙවෙ වරපඤ්ඤ සාවකො.

17 තස්මා හි පිණ්ඩෙ සයනා සනෙ ච
ආපෙච සංඝාටි·රජූප වාහනෙ
එතෙසු ධම්මෙසු අනූපලිත්තො
භික්ඛුයථා පොක්ඛරෙ වාරිබින්දු.

18 ගහට්ඨ වත්තං පන වො වදාමි
යථා කරො සාවකො සාධු හොති
නහෙ සො ලබ්භා සපරිග්ගහෙන
ඵස්සෙතුං යො කෙවලො භික්ඛු ධම්මො.

---

(යම් සමාධියකට පැමිණියාහුද) එසින්; දූරෙගමෙනාති, දුරටපමුණු
වත් හෙවත් (සමාධිචිත්තය විවාදමූලික කෙලෙසයන් කෙරෙහි වි
සූරුවන්නාහුය.)

16 පිණ්ඩං, පිණ්ඩපාතයද; විහාරං, ආවාසයද; සයනාසනඤ්ච;
සෙනසුන්ද, ආපඤ්ච, ගිලානප්‍රත්‍යයද; සංඝාටි, චීවරයද; රජූපවා
හණං, රජස්බෝවනයද; සුගතෙන, යහපත් ගමන් ඇති බුදුරජා
නන්වහන්සේ විසින්, දෙසිතං, දේශනාකරණලද; ධම්මංසුත්වා
න, ධර්මයඅසා; වරපඤ්ඤසාවකො, උතුම් ප්‍රඥාවඇති ශ්‍රාවකතෙම;
සංඛාය, ප්‍රත්‍යවෙක්ෂාකොට හෙවත් සලකා; සෙවෙ, සේවනයක
රන්නේය හෙවත් (සිව්පස පස්විකා වලදන්නේය.)

17 තස්මාහි, එහෙයින්වනාහි; පිණ්ඩෙ, පිණ්ඩපාතයෙහිද; සය
නාසනෙච, සෙනාසනයෙහිද; ආපෙච, ගිලානප්‍රත්‍යයෙහිද, සං
ඝාටිරජූපවාහනෙ, සිවුරු රජස්බෝවනයෙහිද, යන එතෙසු ධ
ම්මෙසු, මේ චතුර්විධ ප්‍රත්‍යයෙහි, අනූපලිත්තො; නොඇළුනාවූ;
භික්ඛු, ක්ෂීණාශ්‍රාවක භික්ෂුතෙම, පොක්ඛරෙ, පොකුරුපතෙහි
නොඇළුනාවූ; වාරිබින්දුයථා, දියබින්දුව යම්සේද; එමෙන් (සිව්පස
යෙහි නොඇලෙන්නේය.)

18 යථාකරො, යම් පරිද්දකින් පිළිපදින්නාවූ; සාවකො, ගෘහස්ථ
ශ්‍රාවකතෙම; සාධුහොති, යහපත්වෙයිද; එබඳුවූ, ගහට්ඨවත්තං
පන, ගිහිවතවනාහි; වො, තොපට; වදාමි, කියමි; යොකෙවලො
භික්ඛුධම්මො, යම් සියළු භික්ෂු ධර්මයක් ඇද්ද; සො, ඒ සියළු භික්ෂු
ධර්මයතෙම; සපරිග්ගහෙන, කෙත්වත් ආදි පරිග්‍රහසහිතවීමෙන්;
ඵස්සෙතුං, ස්පර්ශකරන්ට හෙවත් පිළිපදින්ට; නහිලබ්භා, නොබ
ලත්නාහුය.

19 පාණං න හානෙ න ච ඝාතයෙය්‍ය
න චානුජඤ්ඤා හනතං පරෙසං
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙ ථාවරා යෙ ච තසන්ති ලොකෙ.

20 තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චි ක්වචි සාවකො බුජ්ඣමානො
න හාරයෙ හරතං නානුජඤ්ඤා
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය.

21 අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය
අඞ්ගාරකාසුං ජලිතං ව විඤ්ඤූ
අසම්භුණන්තො පන බ්‍රහ්මචරියං
පරස්ස දාරං නාතික්කමෙය්‍ය.

---

19 ලොකෙ, මේලෝකයෙහි; යෙථාවරා, යම් ස්ථාවර සත්වකෙනෙක්ඇද්ද; යෙචතසන්ති, යම් ත්‍රසථවත්නාවූ සත්වකෙනෙක්ඇද්ද; සබ්බෙසුභූතෙසු, ඒ සියළුසත්වයන්කෙරෙහි; නිධායදණ්ඩං, බහා තබනලද දණ්ඩමුද්ගරාදින්ඇතිව; නොහොත් දණ්ඩනයනොගැනීම්වශයෙන්තබා; පාණංනහානෙ, ප්‍රාණීන්නොනසන්නේය; නචඝාතයෙය්‍ය, නොනසවන්නේය; හනතං, නසන්නාවූ; පරෙසං, අනුන්ට; නානුජඤ්ඤා, අනුනොදන්නේය, හෙවත් නොකැමැතිවන්නේය.

20 තතො, ඉන්පසු; බුජ්ඣමානො සාවකො, දෙස දන්නාවූ ශ්‍රාවකතෙම; ක්වචි, ග්‍රාමආරණ්‍යාදි යම්කිසිතැනෙක්හී, කිඤ්චි, ස්වල්පවූද; අදින්නං, හිමියන්විසින් නුදුන්දෙය; හෙවත් හොරකම; පරිවජ්ජයෙය්‍ය; දුරුකරන්නේය; නහාරයෙ, සොරකම් නොකරවන්නේය; හරතං, ගන්නාහටද, නානුජඤ්ඤා, නොඅනුදන්නේය; සබ්බංඅදින්නං, හිමියන්විසින් නුදුන් සියළුදෙය; පරිවජ්ජයෙය්‍ය, දුරුකරන්නේය.

21 විඤ්ඤූ, නුවනැත්තාවූ පුද්ගලතෙම; ජලිතං, දිලිසෙන්නාවූ, අඞ්ගාරකාසුංඉව, අඟුරුවලක්මෙන්සිතා; අබ්‍රහ්මචරියං, ලාමකහැසිරීම, හෙවත් මෛථුනසේවනාව; පරිවජ්ජයෙය්‍ය, දුරුකරන්නේය; බ්‍රහ්මචරියංපන, බ්‍රහ්මචර්‍ය්‍යාවවනාහි; අසම්භුණන්තො, රක්නට නොහැකිවන්නාවූ පුද්ගලතෙම, පරස්සදාරං, පරස්ත්‍රිය; නාතික්කමෙය්‍ය, නොඉක්මවන්නේය, හෙවත් සේවනය නොකරන්නේය.

22 සභග්ගතො වා පරිසග්ගතො වා
එකස්ස වෙකො න මුසා භණෙය්‍ය
න භාණයෙ භණතං නානුජඤ්ඤා
සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය.

23 මජ්ජඤ්ච පානං න සමාචරෙය්‍ය
ධම්මං ඉමං රොචයෙ සො ගහට්ඨො
න පායයෙ පිබතං නානුජඤ්ඤා
උම්මාදනන්තං ඉති තං විදිත්වා.

24 මදාහි පාපානි කරොන්ති බාලා
කාරෙන්ති චඤ්ඤෙ පි ජනෙ පමත්තො
එතං අපුඤ්ඤ යතනං විවජ්ජයෙ
උම්මාදනං මොහනං බාලකන්තං.

25 පාණං නහානෙ නචාදින්න මාදියෙ
මුසා නභාසෙ නච මජ්ජ පො සියා
අබ්‍රහ්ම චරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං නභුඤ්ජෙය්‍ය විකාල භොජනං.

---

**22** සභග්ගතොවා, සභාවකට ගියේහෝ; පරිසග්ගතොවා, පිරිසක්මැදට ගියේහෝ; එකොවා, තනිවූයේහෝ; එකස්සච, එකක් හටද; න මුසාභණෙය්‍ය, බොරුනොකියන්නේය; න භාසයෙ, නොකියවන්නේය; භණතං, කියන්නාහටද, නානුජඤ්ඤා, අනුනොදන්නේය; සබ්බං අභූතං, සියළු අභූතවාදය; පරිවජ්ජයෙය්‍ය, දුරුකරන්නේය; හෙවත් බොරු නොකියන්නේය.

**23** යොගහට්ඨො; යම්ග්‍රහස්ථකෙනෙක්තෙම, ඉමංධම්මං, මේග්‍රහස්ථධර්මය; රොචයෙ, කැමතිවන්නේද; සො, හෙතෙම; තං, ඒ සුරාපානය, උම්මාදනංඉති, උමතුබවට කාරණයයි; විදිත්වා, කාරණදැන; මජ්ජඤ්චපානං, මද්‍යපානයෙහි; න සමාචරෙය්‍ය; නොහැසිරෙන්නේය; න පායයෙ, පානයනොකරන්නේය; පිබතං, බොන්නාහටද; නානුජඤ්ඤා, නොඅනුදන්නේය හෙවත් කැමතිනොවන්නේය.

**24** බාලා, අඥනයෝ; මදාහි, මත්වීම හේතුකොටගෙණ; පාපානි, පව්; කරොන්ති, කරත්; අඤ්ඤෙපිජනෙ, අනිකුදුජනයන්; පමත්තෙකරොන්ති, ප්‍රමාදකරත්; උම්මාදනං, උමතුකරන්නාවූ; මොහනං, මුළාකරන්නාවූ; බාලකන්තං, අඥනයන්කැමතිවන්නාවූ; එතං අපුඤ්ඤයතනං, මේ අකුශලවාරය; විවජ්ජයෙ, දුරුකරන්නේය.

**25** පාණංනහානෙ, ප්‍රාණඝාතනොකරන්නේය; අදින්නං, (හිමි

26 මාලං න ධාරෙ නචගන්ධ මාචරෙ
මඤ්චෙව ඡමායං ච සයෙථ සන්ථතෙ
එතං හි අට්ඨඞ්ගික මාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං

27 තතො ච පක්ඛස්සු පවස්සු පොසථං
චාතුද්දසිං පඤ්චදසිඤ්ච අට්ඨමිං
පාටිහාරිය පක්ඛඤ්ච පසන්නමානසො
අට්ඨඞ්ගුපෙතං සුසමත්ත රූපං.

---

යන් විසින්) නුදුන්වස්තුව; නචආදියෙ, නොමගන්නේය; මුසානභාසෙ, බොරුනොකියන්නේය; නචමජ්ජපොසියා, මද්‍යපානය නොකරන්නේය, අබ්‍රහ්මචරියා, ලාමකහැසිරීම් සඞ්ඛ්‍යාතවූ; මෙථුනා, මෛථුන ධම්සේවනයෙන්; විරමෙය්‍ය, වලකින්නේය; රත්තිං, රාත්‍රියෙහිද; විකාලභොජනං, දහවල්විකාලයෙහිභොජනය; න භුඤ්ජෙය්‍ය, අනුභවනොකරන්නේය.

26 මාලං න ධාරයෙ, (ගෙතූ නොගෙතූ) මල් නොදරන්නේය; නචගන්ධමාචරෙ, සුවඳවිලවුන් නොගල්වන්නේය; මඤ්චෙ, (පමණඉක්මවූත්)ඇඳෙහි (හෝ); සන්ථතෙ, කැපඇතිරිලිඅතුරණලද; ඡමායංච, බිම හෝ; සයෙථ, සයනයකරන්නේය; (යන) එතං අට්ඨඞ්ගිකංහි, මේ අෂ්ටාඞ්ගයවනාහි; දුක්ඛන්තගුනා, සංසාර දුක්ඛයාගේකෙළවරටගියාවූ; බුද්ධෙන, සර්වඥරාජොත්තමයානන්වහන්සේ විසින්; පකාසිතං, ප්‍රකාශකරණලද; උපොසථං ආහු, උපොසථ සීලයයි කීහු (හෙවත් උපොසථසීලය දේශනාකර වදාළසේක.)

27 තතො, එහෙයින්; පක්ඛස්ස, පක්ෂයසම්බන්ධවූ; හෙවත්(අඩමසක්සම්බන්ධකොටඇති; චාතුද්දසිං, තුදුස්වකද; පඤ්චදසිං, පසළොස්වකද; අට්ඨමිං, අෂ්ටමියද; පාටිහාරියපක්ඛඤ්ච, පාටිහාරියපක්ෂයද; හෙවත් (වර්ෂානසෘතුවආදි ඒ ඒ කාලවල, නිරන්තරයෙන් රක්ෂාකටයුතුවූ පාටිහාරිය පක්ෂයද—"පාටිහාරියපක්ඛඤ්චා"ති එත්ථ පන වස්සූපනායිකායපුරිමභාගෙ ආසාළ්හිමාසො අනන්තරාච සෙසා තයොමාසා කත්තිකමාසොති ඉමෙපඤ්චමාසාපාටිහාරිය පක්ඛොතිවුච්චන්ති—ආසාළ්හි කත්තික ඵග්ගුණමාසා තයොඑවාති) අට්ඨඞ්ගුපෙතං, අෂ්ටාඞ්ගයෙන්යුක්තවූ; උපොසථං, උපොසථසීලය; පසන්නමානසො, ප්‍රසන්නවූ සිතින්; සුසමත්තරූපං, අඛණ්ඩාදි වශයෙන් සම්පූර්ණව; උපවස්සු, වෙසෙව; හෙවත් (උපොසථ සීලය යහපත්ව රක්ෂාකරව්‍යයි වදාළසේක.)

28 තතො ච පාතො උපවුත්ථු පොසථො
අන්නෙන පානෙන ච භික්ඛු සංඝං
පසන්න චිත්තො අනුමොද මානො
යථා රහං සං විභජෙථ විඤ්ඤූ.

29 ධම්මෙන මාතා පිතරො භරෙය්‍ය
පයොජයෙ ධම්මිකං සො වණිජ්ජං
එතං ගිහී වත්තයං අප්පමත්තො
සයං පභෙනාම උපෙති දෙවෙ'ති.

---

28 තතොච, ඉන්පසුද; පාතො, උදෑසන; උපවුත්ථුපොසථො, වසනලද පෙහෙවස් ඇති; විඤ්ඤූ, පණ්ඩිතතෙම; අන්නෙන, ආහාරයෙන්ද; පානෙන, (අෂ්ටවිධපාණවර්ගාදියෙන්ද; යථාරහං, ශක්තිවූපමණින්. පසන්නචිත්තො, ප්‍රසන්නවූසිත්ඇතිව, අනුමොදමානො, නිරන්තරයෙන් සතුටුවනුලබමින්, භික්ඛුසංඝං. භික්ෂුසංඝයා; සංවිභජෙථ. වළඳවන්නේය.

29 ධම්මෙන, දැහැමින්ලැබූනාවූ භොගයෙන්; මාතාපිතරො, දෙමව්පියන්; භරෙය්‍ය, පොෂ්‍යකරන්නේය; ධම්මිකංවණිජ්ජං, ධාර්මිකවෙළඳාම; පයොජයෙ, යොදවන්නේය; එතංගිහිවත්තයං, මේ ගිහිවතෙහිවනාහි; අප්පමත්තො, අප්‍රමාදවූ; සො, ඒගෘහස්තෙම; සයංපභෙනාම, තමන් ආලෝකයෙන් අඳුරුවිදහා පවත්නාවූ; දෙවෙ, දෙවියන්හා (එකීනාවයට;) උපෙති, පැමිණෙයි—සර්වඥරාජොත්තමයානන්වහන්සේ විසින් මේ ධාම්මිකසූත්‍රාගත ධර්මදේශනාව නිමවා වදාළසේක.

නිමි

# දැන්වීමයි.

—000—

මෙම ධම්මිකසූත්‍රය කුදුගොත් සඟියෙහි සූත්‍රනිපාතයට අයත් මධුරමනොහර ධම්දෙශනාවකි. හෙදවනාහි ධම්ප්‍රදීපායමානවූ භාග්‍යවතුන්වහන්සේ විසින් තමන්වහන්සේකරා පැමිණි නාම ශෙන්හා ප්‍රතිපත්තියෙන් "ධාම්මික"නම්වූ අනාගාමී උපාසකයා ආරබ්‍යා වදාරණලදුව ඔහුවිසින් පිළිගත් බැවින් මෙනම් විය,

මෙය ගිහිපැවිදි උභයපක්ෂයගේම උභයාර්ථසිද්ධිය සඳහා භික්ෂුධර්මය සහ ගිහිධර්මය (ගිහිවත)ත් විස්තරකොට පූර්වාපරසිකාවශයෙන් වදාරණලද්දක්බැවින්ද. පොතරුගෙණ භාවිතාකරණ සකලසත්පුරුෂ පින්වතුන්ටම මෙහි අනර්ඝතාවය අතඹුලක්සේ හැඟී යනබැවින්ද බෙහෙවින් වර්ණනානොකරමු.

එරාවන දිව්‍යපුත්‍රයා සම්බන්ධ අර්ථකථාවත් පදාර්ථ සන්නව තිබුනාබැවින් අර්ථකථාවට අනතුරුව යෙදුමු.

ව්‍යාකරණයට සමනොවූ ඇතම්පද පුරාණ සන්නයෙහි තිබුනාහෙයින් එසේම යෙදිමු.

ඇටුවා සහ සන්න ත්‍රයක් පරීක්ෂාකොට ශුද්ධකරණලද මෙහි අපගේ ප්‍රමාදාදියෙන් අවශිෂ්ටදෝෂයක් ඇතහොත් එයද ප්‍රාඥයෝ සෝධනයකෙරෙත්වා.

මගේසිල්එක නොමැතිපොතක් ලැබුනොත් නඩුමාගීයේ ප්‍රකාර දඬුයම් පමුණුවනුලැබේ. නැවත නැවතත් අච්චුගැසීමේ අයිතිවාසිකම මටම තබාගන්නෙමි.

මෙවගට,

H. JULIAN FERNANDO.

---

## ශුද්ධිපත්‍රය

| | | | | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|---|---|
| 6 | පිටේ | 3 | පෙලේ | පදුම්නියො | පදුම්ණීයො |
| 7 | ,, | 16 | ,, | පූරෙසුං | පූරෙසුං |
| ,, | ,, | 18 | ,, | පූරෙත්වා | පූරෙත්වා |
| 8 | ,, | 3 | ,, | විහුරෙන | විහාරෙන |
| ,, | ,, | 8 | ,, | ආගතෙ | ආගතො |
| ,, | ,, | 13 | ,, | තිත්ථකයෙහි | තිත්ථකරෙහි |
| ,, | ,, | ,, | ,, | තිරත්ථ | තිත්ථ |
| ,, | ,, | 14 | ,, | සබ්බජිතා | පබ්බජිතා |
| ,, | ,, | 23 | ,, | අත්තප්පහෙදෙ | අත්ථප්පභෙදෙ |
| ,, | ,, | 37 | ,, | සත්තතිංසබොධ | සත්තතිංසබොධි |

පදගතාර්ථ සහ

# භාවසන්න සහිත

# ශුභසූත්‍රය.

හෙවත්

## චූලකම්මවිභඞ්ග සූත්‍රය.

ගිරිදර රතනජෝති සාමින් විසින්

සංස්කරණලදී.

ජේ. ඩී. පුණාන්දු විසින්

ශාස්ත්‍රාධාර යන්ත්‍රාලයෙහි

මුද්‍රිතයි.

1890.

# සංක්‍ෂෙපනය.

———00———

"ශුභසූත්‍රය" හෙවත් "චූලකර්‍මවිභඞ්ග" නම්වූ මෙම සූත්‍රය මැදුම්සඟියෙහි විභඞ්ගවර්‍ගයට ඇතුළත් එක්තරා සූත්‍රාන්ත දෙශනාවකි.

මෙය ශුභනම්මාණවකයා විසින් අසනලද ප්‍රශ්නතුදුසකට පිළිතුරුවශයෙන් වදාළහෙයින් 'ශුභසූත්‍රය' කියාද මහාකර්‍මවිභඞ්ග දෙශනාවක් තිබෙනබැවින් සහ කර්‍මවිභාග ප්‍රකාශකරණුපිණිස වදාළහෙයින්ද "චූලකර්‍මවිභඞ්ග" සූත්‍රයයි කියාද ව්‍යවහාරයට පැමිණ තිබේ.

මෙහි ප්‍රාණඝාතාදි අකුශලකර්‍මයන්ගේ ආදීනව සහ ප්‍රාණඝාත විරත්‍යාදි කුශලකර්‍මයන්ගේ ආනිසංසයන්ද විස්තරලෙස දක්වාවදාරණ ලදී.

මෙය ලොකවාසී සත්ත්වයන් අතුරෙහි ඇතම්කෙනෙක් ආයුවණ්ණාදියෙන් ක්‍ෂීණවට පැමිණෙන්ටත් ඇතම්කෙනෙක් ආයුවණ්ණාදියෙන් වැඩිබවට පැමිණෙන්ටත් හෙතුවනම් තමතමන් කළාවූ කුශලාකුශලකර්‍මයබව සහ යම්කිසිදෙවිකෙනෙක්විසින් ලොකසත්ත්වයන් මවාආරක්‍ෂාකරණු නොලැබූනබවද වෙසෙසින් තේරුම්ගැනීමටද අත්‍යන්තොපකාරීවේ.

සිංහලබෞද්ධ මහජනයාගේ ප්‍රයොජනය පිණිස ධර්‍මවිනයධර පූරාණ පණ්ඩිතාචාර්‍ය්‍ය වරයෙක්විසින් මීට කරණලද විසිතුරුපදගතාර්‍ථව්‍යාඛ්‍යානයක් දකින්ට ලැබුනුබැවින් අපවිසින් එයින්පොත් කීපයක්සපයා ගිරිදුරරත්නජොතිසාමීන්ලවාලිපිදොෂාපහරණයෙන් සකස්කරවාගෙන භාවසන්නයක්ද යොදවා අච්චුගස්වනලදී.

# ශුභසූත්‍රදෙශනාවෙහි

## නිදාන කථාව.

—x—

ශ්‍රීමත් ශ්‍රීඝණ සුගත තථාගතවරධර්‍මචක්‍රවර්‍ත්තිස්වාමිවූ අපසම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ ජේතවනමහාවිහාරයෙහි වැඩවසනකල්හි සැවැත්නුවරට නුදුරුතැනවූ “තුදී” නම් ගමෙක්ඇත ඒ ගමට අධිපතිවනබැවින් “තොදෙය්‍ය” නම්වූ බමුණෙක් කොසොල්රජ්ජුරුවන්ට අග්‍රපුරොහිතවිය, ඒ බමුණුතෙම සතාසූකෙළක්ධන ඇත්තේය එතකුදුවූවත් ඉතාමසුරුය.

අඤ්ජනානං ඛයංදිස්වා උපචිකානං ච ආචයං
මධූනංච සමාහාරං පණ්ඩිතොඝර මාවසෙ.*

යනමේ ගාථාව තමාගේපුතුට උගන්වාකිසිවක්හට කිසිවක් නොදෙනපරිද්දෙන් හික්මවන්නේය, සමීපවිහාරයෙහි වැඩවසන්නාවූ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේට යටත්පිරිසෙයින් කැඳසාළුවක්පමණ වේවයි බත්කෙණෙස්සක්පමණ වේවයි, නොදිධන ලොභයෙන්මිය එමගෙයි තිරිසන්වඋපදනා තැනැත්තෝ අභිමානයෙන්බලුව උපන්නේය.

ඔහුපුත් සුභමාණවකනම් බමුණුදරු ඒ බල්ලාට බලවත්වූ ස්නෙහඇතිව තමාඅනුභවකරණ සැටියේ රසමසවුලෙන්යුක්ත ආහාරය ලන්නේය.

කසාසඳුන්සුවඳ ආදියෙන්නහවා උතුම්යහනාවෙක හොවන්නේය එසමයෙහි බුදුරජාණන්වහන්සේ අළුයම්වේලෙහි ලොවබලාවදාරණසේක් ඒ බල්ලාදැක“තොදෙය්‍ය නම් බමුණු වස්තුලොභයෙන්මිය තමාගේගෙයි බලුවඋපන්නේය.

අදමාඑතනවගියකල්හි මාදැකබලුබුරයි ඕහට මමඑකබසක් කියමි, ඒ බලු‘ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේ මාහැඳිනිසේක් ව නා’යිගොස් ලිප්දොර නිදන්නේය.

---

* අඳුන්ක්ෂයවනබවද වේයන්ගේසුබස් බැඳිමද මධූන්ගේරැස්කිරීමද යනමේ කරුණු නුවණමෙහෙයාබලා එපරිද්දෙන් පණ්ඩිතතෙමේ වස්තුසැපයීමෙන් ගිහිගෙයි වසන්නේය. යනු භාවයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ඒ කාරණයෙන් සුභනම්මානවකයා හට මාහාසමග කථාසල්ලා
පයෙක්වන්නේය සුභනම්මානවකයා මාගෙන්බණඅසා සරණසී
ලයෙහිපිහිටයි බල්ලුමියගොස්නරකයෙහි උපදනේය"යිනුවනැසින්
දැක සරණසීලයෙහිපිහිටන මානවකයා කෙරෙහි අනුකම්පාවෙන්
එදවස් උදෑසන කලමතාසියලු දිනචර්යාවකොට නිමවා එකලා
වගොස් ඒ තුදිනම් ගමටවැද මානවකයාකිසිකාර්ය්‍යයක් පිණිසග
මින්බැහැර ගියවේලේ ඔහුගේ ගෙදෙරටවැඩ වදාළසේක.

එසමයෙහි බල්ලුද සම්‍යක්සම්බුදු රජාණන්වහන්සේදැක බුරබුරා
සමීපයට ගියේය.

බුදුහු ඔහටවදාරණසේක් "තොදෙය්‍යය තෝපූර්වජන්මයෙහි හො
හෝ යනාදීන් මහතුන්ට ආක්‍රොශපරිභවබැණ බල්ලුවඋපන්නේය දැ
න්මටබුරා අවීචිමහානරකයෙහි වැටෙන්නේවේද"යි වදාළසේක.

බල්ලු එබස්අසා ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේ "මාහැඳිනි
සේක්වනැ"යි කලතිරීමට පැමිණ කරනමාගෙනගොස් බඳුන්අ
තුරේ හළුපිටහොත්තේය.

මනුෂ්‍යයෝ ඔහුනගාසිටුවා යහනේවැද හොවන්ට අසමර්ථවූහ,
සුභනම්මානවකයාඅවුත් "මේබල්ලායහනෙන් බිමලූවෝකවුරුද"
යි විචාළේය.

මනුෂ්‍යයෝ ඔහටතමන් හැමයහනින්බිම බල්ලාහුළුතියාව කි
යා සර්වඥයන්වහන්සේ වදාළබස් කීහ.

මානවකයා එබස්අසා මපියාණන්වහන්සේ බ්‍රහ්මලෝකයෙහි
උපන්සේක තොදෙය්‍යනම් බල්ලෙක්ඇත්තේනොවෙයි ශ්‍රමණභ
වත් ගෞතමයන්වහන්සේ මපියාණන්බලූකරණසේක ඒ බුදුහුන
ම් "මුඛාරූඪවූදෙයක්ම කියනසේකැ"යිකියා කිපී බුදුන්මුසවාදයෙ
න්මඩනාකැමතිව මානවකයාවිහාරයටගොස් එපවත් විචාළේය.

බුදුහුඹහට තමන්වහන්සේ වදාළලෙසම වදාරා ඒ නිබොරුපරි
දී දක්වනුසඳහා "දරුවතාගේපියා තටනොකීවසතුවෙක්ඇද්ද"යි
විචාළේය.

එසඳ මානවකයා "ශ්‍රමණභවත්ගෞතමයන්වහන්ස මපියාණ
න් මටනොකීවසතු ඇතැ"යි කීයේය. කවරේදැයිකියා බුදුන්විචා
ළකල්හි "ලක්‍ෂයක්වටනා රන්මාලාවෙක ලක්‍ෂයක්වටනා රුවන්
මිරිවැඩිසඟලෙක ලක්‍ෂයක්වටනා රන්පලසෙක මසුරන්ලක්‍ෂයක
යනමේ සියලුවසතු මපියාණන්මට නොකීවසතුය"යිකීය.

බුදුහු වදාරණසේක් "දරුවතෝගොස් ඒ බල්ලාට කිරිබත්කවා යහනේහොවා මදනින්දක් නිදවාගත්කල්හි නොකීවස්තුවිචාරව ඒ බල්ලුපූර්වජන්මයෙහි තමානොකීසුලුවස්තුව තටකියයි එසඳ ඔහු තාපියබවදැනගතැ"යි වදාළසේක.

ශුභනම්බ්‍රාහ්මණමානවකයා "ඉදින් බුදුන්බස්සැබෑවීනම් වස්තු ලබමි බොරුවීනම් මුසවාදයෙන් නිග්‍රහකෙරෙම්යි දෙකාරණෙන්ම සතුටුව තමාගේගෙටගොස් මනාකොට කිරිබත්පිසවා බල්ලාට අනුභවකරවා යහනේහොවා මදනින්දක් නිදන්ටවන්කල්හි පළමුතමාට නොකීවස්තුවිචාළේය.

එසඳබල්ලු තමාහැඳිනිබවදැන හුංහුංයනඅනුකරණයෙන් ධවනි පවත්වා ධනනිඛූතැනටගොස් පයින්බිම කැණ සලකුණුකෙළේය ඒ සලකුණෙන් මානවකයා බිමකැණවස්තුව ගොඩනගාගෙන "භවයෙන්සැඟවීතිබෙන්නාවූ අතිසූක්ෂමවූ ජන්මාන්තරයෙහි කාර්‍ය්‍යයපවා ශ්‍රමණභවත් ගෞතමයාණන්වහන්සේට ප්‍රකාශව දැනෙන්නේය, එහෙයින්උන්වහන්සේ ඒකාන්තයෙන් සර්වඥසේකැ"යි බුදුන්කෙරෙහි පැහැද "දහම්පඬුරුගෙනගොස් ශ්‍රමණභවත් ගෞතමයන්ගෙන් ප්‍රශ්නවිචාරන්ට උවමැනවැ"යි දෙවෙනිවාරයේ යනගමනේ ප්‍රශ්නතුදුසක් සතිවූගත්කොටගෙන බුදුන්කරාඑළඹ කථාකොට එකත්පස්වසිඳ ප්‍රශ්නවිචාරන්නේ "කොනුඛොභොගෝතමහෙතු කොපච්චයො" යනාදිපාළිපන්තිය විචාළේය.

J. D. FERNANDO PRINTER & BOOK SELLER COLOMBO

සු භ සුත්තං

අථ වා·

# චූළකම්ම විභඞ්ගසුත්තං.

1 එවම්මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ·

2 අථ ඛො සුභොමානවො තොදෙය්‍යපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සුභොමානවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච.

3 කොනුඛො භොගොතම හෙතුකොපච්චයො යෙන මනුස්සානං යෙවසතං මනුස්සභූතානං දිස්සන්ති යදිදං හීනප්පණීතතා දිස්සන්තිහි භොගොතම මනුස්සා අප්පායුකා දිස්සන්ති දීඝායුකා දිස්සන්ති බව්හාබාධා දිස්සන්ති අප්පාබාධා දිස්සන්ති දුබ්බණ්ණා දිස්සන්ති වණ්ණවන්තො දිස්සන්ති අප්පෙසක්ඛා දිස්සන්ති මහෙසක්ඛා දිස්සන්ති අප්පභොගා දිස්සන්ති මහාභොගා දිස්සන්ති නීචාකුලීනා දිස්සන්ති උච්චාකුලීනා දිස්සන්ති දුප්පඤ්ඤා දිස්සන්ති පඤ්ඤවන්තො කොනු ඛො භොගොතම හෙතුකොපච්චයො යෙන මනුස්සානං යෙවසතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතා'ති·

4 කම්මස්සකාමානව සත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධූ කම්මපටිසරණා කම්මං සත්තෙවිභජති යදිදං හීනප්පණීතතායා'ති.

5 නඛො අහං ඉමස්ස භොතො ගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි, සාධුමෙ භවංගොතමො තථාධම්මං දෙසෙතු යථා අහං ඉමස්සභොතො ගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍ය'න්ති තෙන හිමානව සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමී'ති·

6 එවම්භො'තිඛො සුභොමානවො තොදෙය්‍යපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච·

7 ඉධපනමානව එකච්චො ඉත්ථීවා පුරිසොවා පාණාතිපාතීහොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු සොතෙනකම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපා

නං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චා ජායති, අප්පායුකො හොති, අප්පායුකසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු.

8 ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති, දීඝායුකො හොති දීඝායුකසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති.

9 ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සත්තානං විහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති, බව්හාබාධො හොති බව්හාබාධ සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සත්තානං විහෙඨකජාතිකො හොති, පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා.

10 ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සත්තානං අවිහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා, සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති අප්පාබාධො හොති අප්පාබාධසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සත්තානං අවිහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා.

11 ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති, කුප්පති බ්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස

හෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නොචෙ කායස්සහෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති දුබ්බණ්ණොහොති, දුබ්බණ්ණසංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං කොධනොහොති, උපායාසබහුලො අප්පම්පිවුත්තොසමා නො අභිසජ්ජති කුප්පති බ්‍යාපජ්ජති පතිත්ථියති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති.

12 ඉධපනමාණව එකච්චො ඉත්ථීවා පුරිසොවා අක්කොධනො හොති අනුපායාසබහුලො, බහුම්පිවුත්තොසමානො නාභිසජ්ජති නකුප්පති නබ්‍යාපජ්ජති නපතිත්ථියති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච න පාතුකරොති සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සහෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙකායස්සහෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථයත්ථ පච්චාජායති පාසාදිකොහොති පාසාදිකසංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං අක්කොධනොහොති අනුපායාසබහුලො බහුම්පිවුත්තො සමානො නාභිසජ්ජති නකුප්පති න බ්‍යාපජ්ජති න පතිත්ථියති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච න පාතුකරොති.

13 ඉධපනමාණව එකච්චො ඉත්ථීවා පුරිසොවා ඉස්සාමනකො හොති පරලාභ සක්කාර ගරුකාර මානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සංබන්ධති සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සහෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නොචෙකායස්සහෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථයත්ථපච්චාජායති අප්පෙසක්ඛොහොති අප්පෙසක්ඛ සංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං ඉස්සාමනකොහොති පරලාභ සක්කාරගරුකාර මානනවන්දන පූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති.

14 ඉධපනමාණව එකච්චො ඉත්ථීවා පුරිසොවා අනිස්සාමනකොහොති පරලාභසක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු න ඉස්සති න උපදුස්සති න ඉස්සංබන්ධති සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සහෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙ කායස්සහෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථයත්ථ පච්චාජායති මහෙසක්ඛොහොති මහෙසක්ඛ සංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං අනිස්සාමනකොහොති පරලාභ සක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු න ඉස්සති න උපදුස්සති න ඉස්සංබන්ධති.

15 ඉධපනමාණව එකච්චො ඉත්ථිවා පුරිසොවා නදාතාහොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං සොතෙන කම්මෙන එවං සමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති,නොචෙ කායස්සභෙදාපරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථයත්ථ පච්චාජායති අප්පභොගොහොති අප්පභොගසංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං නදාතාහොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං.

16 ඉධපනමාණව එකච්චො ඉත්ථිවා පුරිසොවා දාතාහොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං සොතෙන කම්මෙන එවං සමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උපපජ්ජති නොචෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උපපජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති මහාභොගො හොති මහාභොගසංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං දාතාහොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං.

17 ඉධපනමාණව එකච්චො ඉත්ථිවා පුරිසොවා ථද්ධොහොති අතිමානී, අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨෙති, ආසනාරහස්ස න ආසනංදෙති, මග්ගාරහස්ස න මග්ගංදෙති, සක්කාතබ්බං න සක්කරොති, ගරුකාතබ්බං න ගරුකරොති, මානෙතබ්බං න මානෙති, පූජෙතබ්බං න පූජෙති, සොතෙන කම්මෙන එවංසමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, නොචෙකායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථපච්චාජායති, නීචාකුලීනොහොති, නීචාකුලීනසංවත්තනිකා එසාමාණව පටිපදා යදිදං ථද්ධොහොති, අතිමානී, අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨෙති, ආසනාරහස්ස න ආසනංදෙති, මග්ගාරහස්ස න මග්ගංදෙති, සක්කාතබ්බං න සක්කරොති, ගරුකාතබ්බං න ගරුකරොති,මානෙතබ්බං න මානෙති,පූජෙතබ්බං න පූජෙති.

18 ඉධපනමාණව එකච්චො ඉත්ථිවාපුරිසොවා අත්ථද්ධොහොති. අනතිමානී, අභිවාදෙතබ්බං අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං පච්චු

ට්ඨෙති, ආසනාරහස්ස ආසනං දෙති, මග්ගාරහස්ස මග්ගං දෙති, සක්කාතබ්බං සක්කරොති, ගරුකාතබ්බං ගරුකරොති, මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති, සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති· නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, උච්චාකුලීනො හොති. උච්චාකුලීනසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං අත්ථද්ධො හොති, අනතිමානී, අභිවාදෙතබ්බං අභිවාදෙති, පච්චුට්ඨෙතබ්බං පච්චුට්ඨෙති, ආසනාරහස්ස ආසනං දෙති, මග්ගාරහස්ස මග්ගං දෙති, සක්කාතබ්බං සක්කරොති, ගරුකාතබ්බං ගරුකරොති, මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති.

19 ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සමණං වා බ්‍රාහ්මණං වා උපසංකමිත්වා න පරිපුච්ඡිතා හොති· කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිම්මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති· කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතී'ති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, දුප්පඤ්ඤො හොති, දුප්පඤ්ඤසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සමණං වා බ්‍රාහ්මණං වා උපසංකමිත්වා න පරිපුච්ඡිතා හොති, කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිම්මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතී'ති.

20 ඉධ පන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා සමණං වා බ්‍රාහ්මණං වා උපසංකමිත්වා පරිපුච්ඡිතා හොති කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිම්මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතී'ති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නො චෙ කායස්ස භෙදා පරම්මරණා—පෙ—සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, මහාපඤ්ඤො හොති මහාපඤ්ඤසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං සමණං වා බ්‍රාහ්මණං වා උපසංකමිත්වා පරිපුච්ඡිතා හොති.

කිංභන්තෙ කුසලං කිංඅකුසලං කිංසාවජ්ජං කිංඅනවජ්ජං කිංසෙවිතබ්බං කිංනසෙවිතබ්බං කිම්මෙකයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිංවාපන මෙකයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතී'ති

21 ඉතිඛොමානව අප්පායුක සංවත්තනිකා පටිපදා අප්පායුකත්තං උපනෙති දීඝායුක සංවත්තනිකා පටිපදා දීඝායුකත්තං උපනෙති බව්හාබාධ සංවත්තනිකා පටිපදා බව්හාබාධත්තං උපනෙති අප්පාබාධ සංවත්තනිකා පටිපදා අප්පාබාධත්තං උපනෙති, දුබ්බණ්ණසංවත්තනිකා පටිපදා දුබ්බණ්ණත්තං උපනෙති, පාසාදික සංවත්තනිකා පටිපදා පසාදිකත්තං උපනෙති, අප්පෙසක්ඛ සංවත්තනිකා පටිපදා අප්පෙසක්ඛත්තං උපනෙති,මහෙසක්ඛසංවත්තනිකා පටිපදා මහෙසක්ඛත්තං උපනෙති, අප්පභොගසංවත්තනිකා පටිපදා අප්පභොගත්තං උපනෙති, මහාභොගසංවත්තනිකා පටිපදා මහාභොගත්තං උපනෙති, නීචාකුලීන සංවත්තනිකා පටිපදා නීචාකුලීනත්තං උපනෙති, උච්චාකුලීන සංවත්තනිකා පටිපදා උච්චාකුලීනත්තං උපනෙති, දුප්පඤ්ඤසංවත්තනිකා පටිපදා දුප්පඤ්ඤත්තං උපනෙති, මහාපඤ්ඤසංවත්තනිකා පටිපදා මහාපඤ්ඤත්තං උපනෙති.

22 කම්මස්සකාමානවසත්තා කම්මදායාදා කම්මයෝනී කම්මබන්ධු කම්මපටිසරණා කම්මංසත්තෙ විභජති යදිදං හීනප්පණීතතායා'ති.

23 එවං වුත්තෙ සුභොමානවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච, අභික්කන්තං භොගොතම අභික්කන්තං භොගොතම සෙය්‍යථාපි භොගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානිදක්ඛන්තී'ති එවමෙවං භොතාගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මංභවංගොතමො ධාරෙතු අජ්ජතග්ගෙපාණුපෙතං සරණං ගතං 'ති.

සන්න සහිත

# ශුභසූත්‍රය.

නමොතස්ස භගවතො
අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 එවම්මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

1 එවං මෙසුතං, මෙ, මාවිසින් (මේ සූත්‍රාන්ත ධර්මදෙශනාව)· එවං සුතං, මේ ආකාරයෙන් අසනලද මෙසේ අසනලද මෙසේම අසනලදී; එකං සමයං, (ගර්භාවක්‍රාන්තිසමය ජාතිසමය සංවෙගසමය අභිනිෂ්ක්‍රමණසමය දුෂ්කරක්‍රියාසමය මාරපරාජයසමය සම්‍යක් සම්බෝධි සමධිගමකාලසමය දෘෂ්ටධර්මසුඛවිහාරසමය දෙශනාසමය පරිනිර්වාණසමය යනාදිදිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශසමයන් අතුරෙන් කරුණාකෘත්‍යසමය සඞ්ඛ්‍යාතවූ) එක්(ධර්මදෙශනා) සමයෙක්හි; භගවා, (සර්වානර්ථපරිහාර පූර්වඞ්ගමවූ නිරවශෙෂහිතසුඛවිධාන තත්පරනිරතිශයප්‍රයොග සම්පත්තියෙන් දෙවිමිනිසුන් සහිත සත්වලොකයාහට අත්‍යන්තොපකාරභවයෙන්) භගවත්නම්වූ සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෙන්ද්‍රයාණන් වහන්සේ; සාවත්ථියං, (රන් රිදී මුතුමැණික් මරකතවෛඩූර්‍ය්‍ය මසාරගල්ල සඞ්ඛශිලප්‍රවාලාදි නානාවිධ රත්නාගණනීණ් විස්ඵුරණ වාණිජාපණශ්‍රෙණියෙන් සමලඞ්කෘතහෙයින්ද "ශාලිව්‍රීහියවකඞ්ගුකුද්‍රූසවරකගොධූමය" යනසප්තවිධධාන්‍යයෙන් සම්පූර්ණහෙයින්ද, ක්ෂෞමකොශෙය්‍යාදි විචිත්‍රපෂ්ටවස්ත්‍රයෙන්හා අතිකුදු මනුෂ්‍යයන්ටප්‍රයොජනවත්වූ මධුරාන්නපානවර්ගාදිවූ සියලු උපකරණයෙන් සමෘද්ධහෙයින්ද, "සර්වමස්ති" කියයුතුතන්හි නෛරුක්තිකවිධියෙන් "ශ්‍රාවස්තිය" යනනමින්ප්‍රසිද්ධවූපුරඤරපුරාකාරකොශලදෙශතිලකායමානවූපැවැත්මෙන්යුත්) සැවැත්නුවරසමීපයෙහිවූ; ජෙතවනෙ, (ජේතනම් රාජකුමාරයා විසින් රොපිතසංවර්ධිතහෙයින්) ජෙතවනනම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, (සියලු අනාථයාචකජනයන්ට නියමකොට දෙනලද ආහාරාදි විවිධපදාර්ථයන් ඇතිහෙයින් අනාථපිණ්ඩිකනම්වූ සුදත්තාපරනාමධෙයයක් ඇති මහාදානපති අනේපිඬුමහසිටුහු විසින් සිව්පණස්කෙළක් ධනවියදම්කොට කරවාපිළිගන්වනලද) ජෙතවනාරාමයෙහි; විහරති, (වෛනෙයජනයන්ට ධර්මදෙශනා කිරීමෙන්ද නානාප්‍රකාරඵලසමාපත්තියට සමවැදීමෙන්ද සත්වයන්ටහා තමන්වහන්සේට විවිධවූ හිතසැප එළවමින්) වැඩවාසය කරණසේක·

2 අථ ඛො සුභොමාණවො තොදෙය්‍යපුත්තො යෙනභගවා තෙනුපසංකමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නොඛො සුභොමාණවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතද වොච.

2 අථඛො, ඉක්බිත්තෙන්; තොදෙය්‍යපුත්තො, තුදිග්‍රමයට අධිපතිහෙයින් 'තොදෙය්‍ය' නම්වූ සත්‍යාසූකෙළක් වස්තුවෙන් ආඪ්‍යවූ පසෙනදි කොසොල්මහරජහුගේ පුරොහිත බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ; සුභොමාණවො (ප්‍රසාදවහවූ ශරීරසෞන්දර්‍ය්‍යය ඇතිවනහෙයින් අඞ්ග සුභත්වයෙන්) සුභ නම්වූ තරුණබ්‍රාහ්මණතෙම; භගවා, (ප්‍රමාණාතික්‍රාන්ත ලොකධාතුගත අනන්තාපර්‍ය්‍යන්ත සත්වයන්ට උත්තම ගෞරවස්ථානීයවූ) සර්‍වඥයන්වහන්සේ; යෙන, යම්තැනෙක්හිද, තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියේය; (නොහොත්) භගවා, (අපරිමිත රූපප්‍රභාවශීලාද්‍යශෙෂගුණ විශෙෂසම්බන්ධත්වයෙන්) භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ; යෙන, යම්නානාප්‍රකාර ගුණවිශෙෂාධිගමයක් හෙතුකොටගෙණ මධුරඵලරසාස්වාදය පිණිස කීරකොකිල සාරිකාදිපක්ෂිසමූහයා විසින් නිත්‍යඵලභරිත මහාවෘක්ෂයක් මෙන් දිව්‍යමනුෂ්‍යයන් විසින් එළඹියයුතුද; තෙන, ඒකාරණයෙන්; උපසඞ්කමි, (තමාහුන්තැනින් නික්මතත්තත් ප්‍රදෙශාතික්‍රමණයකොට) සමීපයටගියේය; උපසඞ්කමිත්වා, උපසංක්‍රමණක්‍රියාව අවසන්කොට; (නොහොත් යම්තැනකටගියේ උපසංක්‍රාන්තනම් වීද ඒ උපගතස්ථානයෙන් ප්‍රශ්නවිචාරණ ධර්‍මශ්‍රවණාදි කෘත්‍යයට යොග්‍යවූ) ආසන්නතරස්ථානයට පැමිණ; භගවතාසද්ධිං, (සමෛවීශ්වර්‍ය්‍ය පූර්‍ණ්‍යයසශ්‍රීසංකල්පසිද්ධප්‍රයත්නාය යන ෂාඩ්ගුණ්‍යපරිපූර්‍ණතායෙන් පරමොත්කෘෂ්ටයට පැමිණි) භාග්‍යවතුන් වහන්සේහා සමග; සම්මොදි "කච්චිතෙබ්‍රාහ්මණ ඛමනීයං කච්චියාපනීයං" යනාදීන් විචාරා වදාළ පූර්‍වභාෂණයට අනුකාරීව ඒ බ්‍රාහ්මණද "කච්චිතෙ භොගොතම ඛමනීයං කච්චියාපනීයං" යනාදීන් කුශලප්‍රශ්නකරණයෙන් උෂ්ණොදකයහා සීතොදකයමෙන් සම්මොදනක්‍රියායෙන් සමානරූපත්වයට පැමිණියේය හෙවත් ප්‍රියකථාකළේය; සම්මොදනීයං, (ප්‍රීතිප්‍රමොදජනනයකරන්නාවූ නොහොත්) සමග සතුටුවියයුතුවූ; සාරාණීයං, (ශබ්දාර්‍ථමධුරත්වයෙන් කලක්ක්‍රියාපවත්වන්ට සුදුසුවූ නොහොත්) නැවත නැවත සිහිකටයුතුවූ; කථං, (ආපාථමධුරවමධ්‍යරමණීයාදිවූ වචනචාතුර්‍ය්‍යාදීන් යුක්තවූ) කථාව; වීතිසාරෙත්වා, කොටනිමවා; එකමන්තං නිසීදි, එකත්පසෙක්හුන්නේය, එකමන්තං නිසින්නොඛො, එකත්පස්වහුන්නාවූ; තොදෙය්‍යපුත්තො, තොදෙය්‍යබ්‍රාහ්මණයාගේ පුත්‍රවූ; සුභොමාණවො, සුභ

නාම් මානවකතෙම; භගවන්තං, (ලෞකිකලොකොත්තරහිත සුඛාභිනිර්වෘත්තකාදෘන ශීලාදි පාරප්‍රාප්තභාග්‍ය ඇති) සර්වඥයන්වහන්සේට; එතං, මේ වචනය; අවොච, කීයේය.

3 කොනුඛො භොගොතම හෙතුකොපච්චයො? යෙන මනුස්සානං යෙවසතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතා දිස්සන්තිහි භොගොතම මනුස්සා අප්පායුකා දිස්සන්ති දීඝායුකා දිස්සන්ති බව්හාබාධා දිස්සන්ති අප්පාබාධා දිස්සන්ති දුබ්බණ්ණා දිස්සන්ති වණ්ණවන්තො දිස්සන්ති අප්පෙසක්ඛා දිස්සන්ති මහෙසක්ඛා දිස්සන්ති අප්පභොගා දිස්සන්ති මහාභොගා දිස්සන්ති නීචාකුලීනා දිස්සන්ති උච්චාකුලීනා දිස්සන්ති දුප්පඤ්ඤා දිස්සන්ති පඤ්ඤවන්තො කොනු ඛො භොගොතම හෙතු කොපච්චයො? යෙන මනුස්සානං යෙවසතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතා 'ති.

3 භොගොතම, භවත්ගෞතම ගොත්‍රයෙහි උපන්සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෙන්ද්‍රයාණන් වහන්ස; යෙන, යම්හෙතුවකින්; මනුස්සානං යෙවසතං, මනුෂ්‍යජාති ඇත්තාමවූ; මනුස්සභූතානං, මනුෂ්‍යසත්වයන් අතුරෙහිම; හීනප්පණීතතා, ලාමකවූද උතුම්වූද සත්වයෝ; දිස්සන්ති, දක්නාලැබෙති; කොනුඛො හෙතු, ඊටහෙතුකවරේද; කොපච්චයො, ඊටප්‍රත්‍යයකවරේද; හි, එසේමැයි; භොගොතම, භවත්ගෞතමයාණන් වහන්ස; අප්පායුකාමනුස්සා, අල්පායුෂ්කමනුෂ්‍යයෝත්; දිස්සන්ති, දක්නාලැබෙති; දීඝායුකාමනුස්සා, දීර්ඝායුෂ්කමනුෂ්‍යයෝත්; දිස්සන්ති, දක්නාලැබෙති; බව්හාබාධා, (කාශශ්වාසාතීසාරාදිවූ බොහෝ) රොගයෙන් පීඩිතවූ සත්වයෝද; දිස්සන්ති, දක්නාලැබෙති; අප්පාබාධා, නිරොගීසත්වයෝද; දිස්සන්ති, දක්නාලැබෙති; දුබ්බණ්ණා, දුර්වර්ණවූ මනුෂ්‍යයෝද; දිස්සන්ති, දක්නාලැබෙති; වණ්ණවන්තො, (උතුම්ප්‍රශස්තවූ) ශරීරවර්ණ ඇත්තාහුද; දිස්සන්ති, දක්නාලැබෙති; අප්පෙසක්ඛා, (අප්‍රසිද්ධ) අල්පානුභාව සත්වයෝද; දිස්සන්ති, දක්නාලැබෙති; මහෙසක්ඛා, (රාජරාජමහාමාත්‍යාදි) මහානුභාව ඇත්තෝද; දිස්සන්ති, දක්නාලැබෙති; අප්පභොගා, උපභොගපරිභොග සම්පත් නැත්තාවූ දරිද්‍රජනයෝද; දිස්සන්ති, දක්නාලැබෙති; මහාභොගා, (බොහෝවූ උපභොග පරිභොග) වස්තු ඇත්තෝද; දිස්සන්ති, දක්නාලැබෙති; නීචාකුලීනා, (යටත්වූ) නීචජාති ඇත්තාහුද; දිස්සන්ති, දක්නාලැබෙති; උච්චාකුලීනා, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි) උතුම්වංශ ඇත්තාහුද; දිස්සන්ති, දක්නාලැබෙති; දුප්පඤ්ඤා, නුවණනැත්තෝද; දිස්සන්ති, දක්නාලැබෙති, පඤ්ඤවන්තො (උතුම්වූ) නුවණ ඇත්තෝද; දිස්සන්ති, දක්නාලැබෙති; භොගොතම, භවත්ගෞතමයාණන් වහන්ස; යෙනා

යම්හෙතුවකින්; මනුස්සානං යෙව සතං, මනුෂ්‍යජාති ඇත්තාමවූ; මනුස්සභූතානං, මනුෂ්‍යසත්ත්වයන් අතුරෙහිම; හීනප්පණීතතා, හීනොත්කෘෂ්ටසත්ත්වයෝද; දිස්සන්ති, දක්නාලැබෙති; කොනුඛොහෙතු, (ඡට)| හෙතුකවරේද; කොපච්චයොඉති, (ඡට) ප්‍රත්‍යයකවරේදැයි යන; එතං, මේ වචනය (හෙවත් මේ ප්‍රශ්නානුදුසතින් යුක්තවූ වාක්‍යය); අවොච, ඇත්වූයේය හෙවත් විචාළේය·

මෙසේ ඒ ශුභනම් මානවකයා විසින් විචාරණලද තුදුස්ප්‍රශ්නයන් එකපැහැර විසඳුවදුරණ සර්වඥයන්වහන්සේ "කම්මස්සකාමානවසත්තා" යනාදි පාළියවදාළසේක·

4 කම්මස්සකාමානව සත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධූ කම්මපටිසරණා කම්මං සත්තෙවිභජති යදිදං හීනප්පණීතතායා'ති·

4 මානව, එම්බාශුභමානවකය; සත්තා, පචකාමවිෂයෙහි සක්තවිසක්තාවීයෙන් සත්ත්වනම්වූ සියලු ප්‍රාණීහු, කම්මස්සකා, කර්මයස්වකීයකොට ඇත්තාහ හෙවත් සත්ත්වයන්සන්තකවස්තුවෙක්නම් කර්මයමය; කම්මදායාදා, කර්මයම හිමිකොට ඇත්තාහ හෙවත් තමාහිමිවස්තුවෙක්නම් කර්මයමය; කම්මයොනි, කර්මයම කාරණකොට ඇත්තාහ හෙවත් සියලු ඉෂ්ටානිෂ්ටඵලයට කර්මයම කාරණවන්නේය; කම්මබන්ධූ, කර්මයබන්ධූකොට ඇත්තාහ හෙවත් සියලු වැඩට සහායවන බන්ධූහුනමුත් කුශලකර්මයමය; කම්මපටිසරණා කර්මයම පිළිසරණකොට ඇත්තාහහෙවත් සත්ත්වයන්ට පිහිටෙක්නම් උන් උන්කළ සුචරිතකර්මයමය; කම්මං, දුශ්චරිත සුචරිත කර්මයතෙම; යදිදං හීනප්පණීතතාය, (තෝහීනවා තෝඋතුම්වා තෝමන්දායුෂ්කවා තෝදීර්ඝායුෂ්කවා තෝරොගීවා තෝනිරොගීවා තෝදුර්වර්ණවා තෝවර්ණසම්පන්නවා තෝ අල්පෙශාක්‍යවා තෝමහෙශාක්‍යවා තෝ අල්පභොගීවා තෝමහාභොගීවා තෝහීනකුලීනවා තෝමහාකුලීනවා තෝනුවණනැතිවා තෝනුවණ ඇතිවා, යී මෙසේ) හීනප්‍රණීතභාවය පිණිස (යම් මේ විභාගකිරීමෙක් ඇද්ද එරිද්දෙන්); සත්තෙ, ඒ ඒසත්ත්වයන්; විභජතීති, විභාගකරන්නේය; යී ඔහුගේ මානනිග්‍රහය පිණිස ගම්භීරකොට සංක්ෂෙපයෙන් විසඳුවදාළසේති·

ඉක්බිත්තෙන් ඝණවස්ත්‍රයකින් ඇසවසාබැඳ ඉදිරිපිටතුබූ මධුරවස්තුවක් මෙන් බුදුන්වදාළපාඨයෙහි අර්ථදැනගතනොහී නිගතමානිව විස්තරදෙශනාව පිණිස යාච්ඤාකරන්නේ "නාබො අහං" යනාදි පාඨසනාථය කීයේය.

5 නඛො අහං ඉමස්ස භොතොගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි, සාධුමෙ භවංගොතමො තථාධම්මංදෙසෙතු යථා අහං ඉමස්ස භොතොගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යං'ති තෙනහිමානව සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමී'ති එවං භො'තිඛො සුභොමානවො තොදෙය්‍යපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතද වොච.

5 අහං, මම; භොතොගොතමස්ස, භවත්ගෞතමගොත්‍රඇති සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයාණන්වහන්සේ විසින්; සංඛිත්තෙන භාසිතස්ස,සංක්‍ෂෙපයෙන්වදාරණලද්දාවූ;විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස, විස්තරයෙහින් අර්ථයවිභාගනොකරණලද්දාවූ; ඉමස්ස, ("කම්මස්සකාමානවසත්තා" යනාදි)මේ පාඨයාගේ; අත්ථං, අර්ථය; විත්ථාරෙන, විස්තරයෙහින්; නඛො ආජානාමි, දැනගතනොහෙමි; සාධු,ආයාචනාකෙරෙමි; අහං,මම; භොතොගොතමස්ස,භවත්ගෞතම ගොත්‍රඇති සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ විසින්; සංඛිත්තෙනභාසිතස්ස, සංක්‍ෂෙපයෙන් වදාරණලද්දාවූ; විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස, විස්තරයෙහින් අර්ථවිභාගනොකරණලද්දාවූ; ඉමස්ස, මේ පාඨයාගේ; අත්ථං, අර්ථය; විත්ථාරෙන, විස්තරයෙහින්; යථා ආජානෙය්‍යං, යම්සේදැනගනිම්ද; තථා, එපරිද්දෙන්; භවංගොතමො, භවත්ගෞතමයාණන් වහන්සේ; මෙ, මට; ධම්මංදෙසෙතූති, ධර්මදෙශනාකොට වදාරණසේක්වයි කියා යාච්ඤාකළේය; තෙනහි,එසේවීනම්;මානව, මානවකය; සුණාහි,(අවික්‍ෂිප්තචිත්තසන්තාන ඇතිව)අසව; සාධුකං, මනාකොට; මනසිකරොහි, සිත්හි කරව; භාසිස්සාමීති, (තවවිස්තරකොට)දෙශනාකරන්නෙම්යි වදාළසේක.

6 එවමෙභො'තිඛො සුභොමානවො තොදෙය්‍යපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච.

6 එවමෙභොතිඛො, එසේය ස්වාමීනි බුද්ධරාජයාණන් වහන්ස (අවික්‍ෂිප්තචිත්තසන්තානයෙන් ශ්‍රවණව අසමිකියා); තොදෙය්‍යපුත්තො, තොදෙය්‍ය බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ; සුභොමානවො, ශුභනම්මානවකතෙම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසි, පිළිවදන් ඇස්වූසේක; භගවා, දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍යවිහාරකාය චිත්තොපධිවිවෙකසුන්‍යතාප්‍රණිහිතානිමිත්තවිමොක්‍ෂපඤ්චාභිඥාදිවූ ලෞකිකලොකොත්තර උත්තරිමනුෂ්‍යධර්මයන් භජනයකළාවූ සර්වඥයන්වහන්සේ; එතං අවොච, මේ වක්‍ෂ්‍යමානවචනය වදාළසේක.

7 ඉධපනමානව එකච්චො ඉත්ථීවා පුරිසොවා පාණාතිපාතීහොතී ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු සොතෙනකම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො චෙ කායස්ස භෙදාපරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති,අප්පායුකොහොති,අප්පායුකසංවත්තනිකා එසාමානව පටිපදායදිදං පාණාතිපාතීහොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු.

7 මානව, මානවකය; ඉධපන, මෙලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථී වා,සමහරස්ත්‍රියෙක්හෝ; එකච්චො පුරිසො වා,සමහරපුරුෂයෙක්හෝ; පාණාතිපාතීහොති, ප්‍රාණඝාතකරන්නේවේද; ලුද්දො, රෞද්‍රද; ලොහිතපාණී (නිරන්තරයෙන් සත්ත්වඝාතනයෙන්) ලේවැකුණු අත්ඇත්තේද; හතපහතෙනිවිට්ඨො, විශෙෂයෙන් ප්‍රාණඝාතයෙහි පිහිටියේවේද; පාණභූතෙසු, ප්‍රාණීවූසත්ත්වයන් විෂයෙහි; අදයාපන්නො, නිෂ්කාරුණාවට පැමිණියේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේසම්පූර්ණකොට පූරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේමනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ අකුශලකර්මය හෙතුකොටගෙණ; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අපායං, අයසඞ්ඛ්‍යාතවූ සැපයෙන් පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයට පිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසවතිතවනතැන් හෙයින් විනිපාතනම්වූ; නිරයං,ආස්වාදසංඥිතවූසුඛසෞමනස්‍යයක්නැතිහෙයින් නිරයනම්වූ යටකී අපායාදියෙහි; උපපජ්ජති,උපදනේයි.

චෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං, අයසඞ්ඛ්‍යාතවූ සැපනේ පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයට පිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසවපතිතවන තැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං ආස්වාදසංඥිත සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටකී අපායාදියෙහි; නො උපපජ්ජති, නූපන්නේවී නම්, සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින්මනුෂ්‍යත්වයට පැමිණියේවී නම්; යත්ථයත්ථ පච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්යම් කුලයෙක උපදනේද;අප්පායුකොහොති, අල්පායුෂ්කවන්නේය.

ලුද්දො, රෞද්‍රක්‍රියාකරන්නේය; ලොහිතපාණී, (නිරන්තරයෙන් සත්ත්වඝාතනයෙන්) ලේවැකුණු අත් ඇත්තේය; හතපහතෙ නිවිට්ඨො, විශෙෂයෙන් ප්‍රාණඝාතයෙහි පිහිටියේය; පාණභූතෙසු, සකල ප්‍රාණීවූ සත්ත්වයන්කෙරෙහි; අදයාපන්නො, නිෂ්කාරුණාවට පැමිණියේය යන; යදිදං පාණාතිපාතීහොති, යම් මේ ප්‍රාණඝාතකර්මයෙක් වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; අප්පායුකසංවත්තනිකා, අල්පායුෂ්කභාවය පිණිස වන්නීය.

8 ඉධපන මානව එකච්චො ඉත්ථී වා පුරිසො වා පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති, දීඝායුකොහොති දීඝායුක සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතොහොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති.

8 මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථී වා, සමරස්ත්‍රියෙක් හෝ; එකච්චො පුරිසො වා, සමහරපුරුෂයෙක් හෝ; පාණාතිපාතං පහාය, ප්‍රාණඝාතය හැර; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතොහොති, විශෙෂයෙන් වැළැක්කේ වේද; නිහිතදණ්ඩො, (පරහිංසාපිණිස නොගන්නාලද දණ්ඩමුද්ගරාදීන් ඇතිහෙයින්) බහාතබනලද දණ්ඩමුද්ගරාදීන් ඇත්තේද; නිහිතසත්ථො, (පරූපඝාතයපිණිස ශස්ත්‍රාදියගෙණ නොපවත්නා හෙයින්) තබනලද ශස්ත්‍රයන් ඇත්තේද; ලජ්ජී, (පාපයෙහි ජිගුප්සාකාරයෙන් පවත්නාහෙයින්) ලජ්ජීද; දයාපන්නො, කරුණාවට පැමිණියේද; සබ්බපාණභූත, සියලුසත්වයන්කෙරෙහි; හිතානුකම්පී විහරති, හිතචිත්තයෙන් අනුකම්පාකරමින් වාසයකරන්නේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකොට පුරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේමනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙණ; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, (ශොභනවූගති ඇතිහෙයින්) සුගතිනම්වූ; සග්ගං, (සුට්ඨු අග්‍රහෙයින්) ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේය; චෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, (සොභනවූ ගති ඇතිහෙයින්) සුගතිනම්වූ; සග්ගං, (සුට්ඨුඅග්‍රහෙයින්) ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොඋපපජ්ජති, නූපදනේවීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යත්වයට පැමිණියේවීනම්; යත්ථයත්ථ පච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්කිසිකුලයෙක උපදනේද; දීඝායුකොහොති, දීර්ඝායුෂ්කවන්නේය; නිහිතදණ්ඩො, (පරහිංසාපිණිස නොගන්නාලද දණ්ඩමුද්ගරාදීන් ඇතිහෙයින්) බහාතබනලද දණ්ඩමුද්ගරාදින් ඇත්තේය; නිහිතසත්ථො, (පරූපඝා

තය පිණිස ශස්ත්‍රාදියගෙණ නොපවත්නාහෙයින්) තබනලද ශස්ත්‍රයන් ඇත්තේය; ලජ්ජී, (පාපයෙහි ජිගුප්සාකාරයෙන් පවත්නාහෙයින්) ලජ්ජීය; දයාපන්නො, කරුණාවට පැමිණියේය; සබ්බපාණභූත සකලප්‍රාණිභූතයන් කෙරෙහි; හිතානුකම්පීවිහරති, හිතචිත්තයෙන් අනුකම්පාකරමින් වාසයකරන්නේය යන; යදිදං පාණාතිපාතං පහාය, යම් මේ ප්‍රාණඝාතයක්හැර; පාණාතිපාතාපටිවිරතොහොති, ප්‍රාණඝාතචේතනායෙන් විරමනයෙක් වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; දීඝායුකසංවත්තනිකා, දීර්ඝායුෂ්කභාවය පිණිස පවත්නීය.

9 ඉධපනමානව එකච්චො ඉත්ථිවා පුරිසොවා සත්තානං විහෙඨකජාතිකොහොති පාණිනාවාලෙඩ්ඩුනාවා දණ්ඩෙනවා සත්ථෙනවා සොතෙනකම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නොචෙකායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති, බව්හාබාධොහොති බව්හාබාධ සංවත්තනිකා එසාමානව පටිපදායදිදං සත්තානං විහෙඨකජාතිකොහොති, පාණිනාවා ලෙඩ්ඩුනාවා දණ්ඩෙනවා සත්ථෙනවා.

9 මානව, මානවකය; ඉධ, මේලොකයෙහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියෙක් හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක් හෝ; සත්තානං, සත්වයන්ට; පාණිනාවා, හස්තපාදාදීන්හෝ; ලෙඩ්ඩුනාවා, කැටකැබිලිති ආදීන්හෝ; දණ්ඩෙනවා, දණ්ඩමුද්ගරාදීන් හෝ; සත්ථෙනවා, (ඛඩ්ගකොන්තාදි) ශස්ත්‍රයෙන්හෝ; විහෙඨකජාතිකොහොති, වෙහෙසදෙනස්වභාව ඇත්තේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකොට පූරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ අකුශලකර්මයහෙතුකොට ගෙන; කායස්සභෙදා, (ශරීරස්ථිතියට කාරණවූ) ජීවිතෙන්ද්‍රියො පච්ඡෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන්මත්තෙහි; අපායං, (අයසඞ්ඛ්‍යාතවූ ස්වර්ගමෝක්ෂසාධකකුශලාකුශල * විපාකදෙනින් පහවූහෙයින්) අපායනම්වූ; දුග්ගතිං, (දුඃඛයට පිහිටහෙයින්) දුර්ගතිනම්වූ; විනිපාතං, (විවසව පතිතවනතැන් හෙයින්) විනිපාතනම්වූ, නිරයං, (ආස්වාදසංඥිත සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ භටකී) අපායාදියෙහි; උපපජ්ජති, උපදනේය; චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරස්ථිතියට කාරණවූ) ජීවිතෙන්ද්‍රියො පච්ඡෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන්

* විමසිය යුතුයි.

මන්තෙහි; අපායං, (අයසඞ්ඛාතවූ ස්වර්ගමොක්ෂසාධකකුශලාකුශල විපාකදෙකින් පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයට පිහිටහෙයින්) දුර්ගතිනම්වූ; විනිපාතං, (විවශවපතිතවන තැන් හෙයින්) විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ සතර අපායාදියෙහි; නො උප්පජ්ජති, නූපන්නේවී නම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යත්වයට පැමිණියේවී නම්; යත්ථයත්ථපච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදියම්යම් කුලයෙක උපදනේය; බව්හාබාධොහොති, බව්හාබාධවන්නේය හෙවත් කාශශ්වාසාතිසාරාදිබොහෝ රොගපීඩා ඇතිවන්නේය.

සත්තානං, සත්වයන්ට; පාණිනාවා, හස්තපාදාදීන්හෝ; ලෙඩ්ඩුනාවා, කැටකැබිලිති ආදීන්හෝ; දණ්ඩනාවා, දණ්ඩමුද්ගරාදීන් හෝ; සත්ථෙනවා, (ඛඩ්ගකොන්තාදි) ශස්ත්‍රයෙන්හෝ; යදිදං සත්තානං විහෙඨකජාතිකොහොති, යම් මේ සත්වයන්ට වෙහෙසදෙන ස්වභාවයෙක් ඇත්තේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; බව්හාබාධසංවත්තනිකා, බව්හාබාධභාවය පිණිස වන්නීය; හෙවත් බොහෝ රොගපීඩා ඇතිවීමපිණිස වන්නීය.

10 ඉධපන මානව එකච්චො ඉත්ථිවා පුරිසොවා සත්තානං අවිහෙඨකජාතිකො හොති පාණිනාවා ලෙඩ්ඩුනාවා දණ්ඩෙනවා සත්ථෙනවා, සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, නොචෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති අප්පාබාධො හොති අප්පාබාධසංවත්තනිකා එසාමානව පටිපදා යදිදං සත්තානං අවිහෙඨකජාතිකො හොති පාණිනාවා ලෙඩ්ඩුනාවා දණ්ඩනාවා සත්ථෙනවා.

10 මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහිවනාහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියක්හෝ; එකච්චොපුරිසොවා, සමහරපුරුෂයෙක්හෝ; සත්තානං, සත්වයන්ට; පාණිනාවා, කරචරණාදීන්හෝ; ලෙඩ්ඩුනාවා, කැටකැබිලිති ආදීන්හෝ; දණ්ඩනාවා, දණ්ඩමුද්ගරාදීන් හෝ; සත්ථෙනවා, (ඛඩ්ගකොන්තාදි) ශස්ත්‍රයෙන්හෝ; අවිහෙඨකජාතිකොහොති, වෙහෙසනොදෙන ස්වභාව ඇත්තේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේසම්පූර්ණකොට පුරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේමනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙන; කායස්සභෙදා, (ශරීරස්ථිතියට කාරණවූ) ජීවිතෙන්ද්‍රියෝ පච්ඡේදයෙන්; පරම්මරණා,

චූතිචිත්තයෙන් මත්තෙහි; සුගතිං, (සොභනවූගති ඇතිහෙයින්) සුගතිනම්වූ; සග්ගං, (සුවසුඅග්‍රහෙයින්) ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේය.

නෙව, ඉදින්, කායස්සභෙදා, ශරීරස්ථිතියට කාරණවූ ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදයෙන්; පරම්මරණා, චූතිචිත්තයෙන් මත්තෙහි; සුගතිං, ශොභනවූගති ඇතිහෙයින් සුගතිනම්වූ; සග්ගං, සුවසුඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොඋපපජ්ජති, නොඋපන්නේවීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යත්වයට පැමිණියේවීනම්; යත්‍ථයත්‍ථ පච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි යම් යම් කුලයෙක උපදනේද; අප්පාබාධොහොති, අල්පාබාධවන්නේය; හෙවත් නිරොගීවන්නේය; සත්තානං, සත්වයන්ට; පාණිනාවා, කරචරණාදීන්හෝ; ලෙඩ්ඩුනාවා, කැටකැබිලිති ආදීන්හෝ දණ්ඩනවා, දණ්ඩමුද්ගරාදීන්හෝ; සත්ථෙනවා, ඛඩ්ගකොන්තාදි ශස්ත්‍රයෙන්හෝ; යදිදං අවිහෙඨකජාතිකොහොති, යම් මේ වෙහෙස නොදෙනස්වභාවයෙක් වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; අප්පාබාධ සංවත්තනිකා, නිරොගිබව පිණිස වන්නීය.

11 ඉධපනමානව එකච්චො ඉත්‍ථීවා පුරිසොවා කොධනොහොති උපායාසබහුලො අප්පම්පිවුත්තො සමානො අභිසජ්ජති, කුප්පති බ්‍යාපජ්ජති පතිත්‍ථීයති කොපඤ්චදොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නොචෙ කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්‍ථයත්‍ථ පච්චාජායති දුබ්බණ්ණොහොති, දුබ්බණ්ණසංවත්තනිකා එසාමානව පටිපදා යදිදං කොධනොහොති, උපායාසබහුලො අප්පම්පිවුත්තොසමානො අභිසජ්ජති කුප්පති බ්‍යාපජ්ජති පතිත්‍ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති.

11 මානව, මානවකය; ඉධ, මේ ලොකයෙහි; එකච්චො ඉත්‍ථීවා, සමහරස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසොවා, සමහරපුරුෂයෙක්හෝ; කොධනොහොති, දණ්ඩත්පහළ ආශීවිෂයක්හුමෙන්ද; වලිතකල අමෙධ්‍යකූපයක්මෙන්ද කෝටුවකින්පැහැරවීගිය දුෂ්ටව්‍රණයක්මෙන්ද සිහිමදවකීබස්පමණකිනුත් කිපෙනහෙයින් වෙහෙසවෙනස්වභාව ඇත්තේවේද; උපායාසබහුලො, (බලවත් ආයාස ඇත්තේද හෙවත් සුෂ්කඅලාබුඵලයකගත් ගින්නක්මෙන් නොසන්සිඳී නැවතනැවත බලවත්වෛරබැඳීමෙන් උපදනා) උපනාහයෙන් යුක්තවන්නේද; අප්පම්පිවුත්තොසමානො, ස්වල්පය

තුදු තියතුලබන්නේ; අභිසජ්ජති, කොපයෙන් සැවේද නොහොත් ඇලේද; කුප්පති, කිපේද; ව්‍යාපජ්ජති, කළකිරේද; හෙවත් ක්‍රොධයෙන් චිත්තපූතිභාවයටපැමිණේද; පතිත්ථීයති, තැතිගනීද (හෙවත් හැසිමිදුනුගිතෙලක්මෙන්) ක්‍රොධයෙන් දැඩිවේද; කොපඤ්ච, කොපයද; දොසඤ්ච, වෛෂයද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද; පාතුකරොති, පහළකෙරේද; සො, ඒ පුද්ගලතෙම; එවංසමත්තෙන, මෙසේ සම්පූර්ණකොට පුරණලද්දාවූ; එවංසමාදින්නෙන, මෙසේ මනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ අකුශලකර්මය හෙතුකොටගෙන; කායස්සභෙදා, ශරීරයාගේ භේදයෙන්; පරම්මරණා, කාබුන්මරණින්මත්තෙහි; අපායං, අයසඞ්ඛ්‍යාතසැපයෙන්පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයට පිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසවපතිතවනතැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතසුඛසෞමනස්‍යයක්නැතිහෙයින්නිරයනම්වූ යටත් අපායාදියෙහි; උපපජ්ජති, උපදනේය; චෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ භේදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අපායං, අයසඞ්ඛ්‍යාතවූ සැපයෙන් පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයටපිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං,විවසව පතිතවනතැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටත් අපායාදියෙහි; නො උපපජ්ජති, නොඋපන්නේවීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යත්වයට පැමිණියේවීනම්; යත්‍ථයත්‍ථ පච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදී යම්කිසිකුලයෙක උපදනේද; දුබ්බණ්ණොහොති, දුර්වර්ණවන්නේයහෙවත් විරූපවන්නේය නපුරුශරීරසටහන් ඇතිවන්නේය; උපායාසබහුලො,ක්‍රොධවශයෙන්වූ බලවත් ආයාස ඇත්තේය හෙවත් සුෂ්කඅලාබුඵලයකගත් ගින්නක්මෙන් නොසන්සිඳී නැවත නැවත බලවත් වෛරබැඳිමින් උපදනා උපනාහයෙන් යුක්තවන්නේය; අප්පම්පිවුත්තොසමානො, ස්වල්පයකුදු කියනුලබන්නේ; අභිසජ්ජති, කොපයෙන් සැටෙන්නේය හෙවත් ඇලෙන්නේය; කුප්පති, කිපෙන්නේය; ව්‍යාපජ්ජති, කළකිරෙන්නේය හෙවත් ක්‍රොධයෙන් චිත්තපූතිභාවයට පැමිණෙන්නේය; පතිත්ථීයති, තැතිගන්නේය හෙවත් හැසිමිදුනුගිතෙලක් මෙන්ක්‍රොධයෙන් දැඩිවන්නේය; කොපඤ්ච, කොපයද; දොසඤ්ච, වෛෂයද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද; පාතුකරොති, පහළකරන්නේය යන; යදිදං කොධනොහොති, යම් මේ ක්‍රොධනිරීමෙත්වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; දුබ්බණ්ණසංවත්තනිකා, දුර්වර්ණභාවය පිණිස වන්නීය හෙවත් විරූපභාවය පිණිස වන්නීය.

12 ඉධපන මානව එකච්චො ඉත්ථීවා පුරිසොවා අක්කොධනො හොති අනුපායාසබහුලො, බහුම්පිවුත්තොසමානො නාභිසජ්ජති නකුප්පති නව්‍යාපජ්ජති නපතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච නපාතුකරොති සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති පාසාදිකො හොති පාසාදිකසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං අක්කොධනො හොති අනුපායාසබහුලො බහුම්පිවුත්තො සමානො නාභිසජ්ජති නකුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච න පාතුකරොති·

12 මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියක් හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක් හෝ; අක්කොධනො හොති, සුචිඅසුචිනික්ෂෙපක්ෂම වූ භූමියක් මෙන් අවිරොධපරොධනාවයක්ෂමා කරන්නාවූ අධිවාසන ක්ෂාන්තියෙන් යුක්තහෙයින් ක්‍රොධ නැත්තේවේද; අනුපායාසබහුලො, ක්‍රොධවශයෙන්වූ බලවත් ආයාස නැත්තේද හෙවත් බඩ ඡෙවරී නොවේද; බහුම්පිවුත්තොසමානො, බොහෝකොට කියනු ලබන්නේ; නාභිසජ්ජති, ක්‍රොධයෙන් නොහැවේද; හෙවත් නොඇලේද; නකුප්පති, නොකිපේද; නව්‍යාපජ්ජති, නොකළකිරේද; හෙවත් ක්‍රොධයෙන් චිත්තපූතිභාවයට නොපැමිණේද; නපතිත්ථීයති, තැති නොගනීද හෙවත් හැසිමිඳුනුගිතෙලක් මෙන් ක්‍රොධයෙන් දැඩි නොවේද; කොපඤ්ච, කොපයද; දොසඤ්ච, වෙෂයද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද; නපාතුකරොති, පහළ නොකෙරේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකොට පුරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේමනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙන; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, ශොභනවූ ගති ඇතිහෙයින් සුගතිනම්වූ; සග්ගං, සුට්ඨුඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේය; නොචෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, කාබූන්මරණින් මත්තෙහි; සුගතිං, ශොභනවූගති ඇතිහෙයින් සුගතිනම්වූ; සග්ගං, සුට්ඨුඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොඋපපජ්ජති, නොඋපන්නේවීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යභවයට පැමිණියේවීනම්; යත්ථයත්ථ පච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදී යම්කිසිකුලයෙක උපදනේද; පාසාදිකොහොති, ප්‍රසාදවහවන්නේය හෙවත් දුටුදුටුවන් සිත් පහදවන විශිෂ්ටපැහැ ඇතිවන්නේය.

අනුපායාසබහුලො, ක්‍රොධවශයෙන්වූ බලවත් ආයාස නැත්තේය හෙවත් බද්ධවෛරනොවන්නේය; බහුම්පිවුත්තොසමානො, බොහෝකොට කියනුලබන්නේ; නාභිසජ්ජති, කොපයෙන් නොසෑ‍ෙවන්නේය නොහොත් නොඇලෙන්නේය; නකුප්පති, නොකිපෙන්නේය; නව්‍යාපජ්ජති, නොකළකිරෙන්නේය; හෙවත් ක්‍රොධයෙන් චිත්තප්‍රකෘතිභාවයට නොපැමිණෙන්නේය; නපතිත්ථීයති, තැතිනොයන්නේය හෙවත් හැසිමිදුනුගිතෙලක්මෙන් ක්‍රොධයෙන් දැඩිනොවන්නේය; කොපඤ්ච, කොපයද; දොසඤ්ච, ද්වේෂයද; අප්පච්චයඤ්ච, නොසතුටුබවද; නපාතුකරොති, පහළනොකරන්නේය යනු; යදිදං අක්කොධනොහොති, යම් මේ ක්‍රොධනොකිරීමෙක් ඇද්ද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; පාසාදිකසංවත්තනිකා, ප්‍රසාදවසභාවය පිණිසවත්නිය හෙවත් විශිෂ්ටරූ ඇතිවීම පිණිස වත්නීය.

13 ඉධපනමානව එකච්චො ඉත්ථීවා පුරිසොවා ඉස්සාමනකො හොති පරලාභ සක්කාර ගරුකාර මානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සංබන්ධති සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නොචෙකායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථයත්ථපච්චාජායති අප්පෙසක්කොහොති අප්පෙසක්කසංවත්තනිකා එසාමානව පටිපදා යදිදං ඉස්සාමනකොහොති පරලාභ සක්කාරගරුකාර මානනවන්දන පූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සංබන්ධති.

13 මානව, මානවකය; ඉධ, මේ ලොකයෙහි; එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසොවා, සමහරපුරුෂයෙක්හෝ; ඉස්සාමනකොහොති, (පරසම්පත්ති අසහනලක්ෂණවූ) ඊර්ෂ්‍යා සම්ප්‍රයුක්තසිත් ඇත්තේවේද; පරලාභසක්කාර ගරුකාරමානනවන්දන පූජනාසු, මෙරමාලබනලාභසත්කාර ගරුකාරමානනවන්දන පූජනාවන්විෂයෙහි; ඉස්සති, ඊර්ෂ්‍යාකෙරේද; උපදුස්සති, ඊර්ෂ්‍යාවශයෙන්ම උපක්‍රොශකෙරෙමින් නොසතුටුවේද; ඉස්සං, යථොක්තවූ ඊර්ෂ්‍යාව; බන්ධති, යවකලාපයක් බදනාක්හුසේ නොනස්නාපරිද්දෙන් බැන්දක්මෙන් සිත්හිතබාද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකොට පූරණලද්දාවූ; එවං සමාදින්නෙන, මෙසේ මනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒඅකුශලකර්මයහෙතුකොටගෙන; කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, එයට අනතුරුව උපදනාස්කන්ධග්‍රහණයෙහි; අපායං, සඞ්ඛ්‍යාතවූ ස්වර්ගමෝක්ෂසාධකකුශලානුශල විපාකදෙනින් වූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයට පිහිටහෙයින් දුර්ගතිය.

වූ; විනිපාතං, විවසව පතිතවනතැන් හෙයින් විනිපාතනම්වූ, නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටකී අපායාදියෙහි; උපපජ්ජති, උපදනේය.

නෙව, ඉදින්; කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අපායං, අයසඞ්ඛාතවූ ස්වර්ගමොක්ෂසාධකවූ කුශලාකුශලදෙකින් පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයටපිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසව පතිතවනතැන් හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිත සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටකී අපායාදියෙහි; නොඋපපජ්ජති, නො උපන්නේවීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යභවයට පැමිණියේවීනම්; යත්ථයත්ථ පච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්යම් කුලයෙක උපදනේද; අප්පේසක්ඛොහොති, අල්පේශාක්‍යවන්නේය හෙවත් දුසිදුසරකිනවිගතානුභාව ඇතිවන්නේය හෙවත් නිවගල්වන්නේය රුවිදිශරයක්මෙන් ප්‍රකාශව නොපෙනෙන්නේය.

පරලාභසක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු, මෙරමාලබන ලාභසත්කාර ගරුකාර මානනවන්දන පූජනාවන් විෂයෙහි; ඉස්සති, ඊර්ෂ්‍යාකරන්නේය; උපදුස්සති, ඊර්ෂ්‍යාවශයෙන්ම උපක්‍රොශකෙරෙමින් නොසතුටුවන්නේය; ඉස්සං, යථොක්තවූ ඊර්ෂ්‍යාව; බන්ධති, යවකලාපයක් බදනාක්හූෂ් නොනස්නාපරිද්දෙන් බැන්දක්මෙන් සිතතබන්නේය යනු; යදිදං ඉස්සාමනකොහොති, යම් මේ ඊර්ෂ්‍යාසම්ප්‍රයුක්ත චිත්තයෙක්වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ; අප්පේසක්ඛ සංවත්තනිකා, අල්පේශාක්‍යභාවය පිණිස වන්නීය.

14 ඉධපනමානව එකච්චො ඉත්ථී වා පුරිසො වා අනිස්සාමනකොහොති පරලාභසක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු න ඉස්සති න උපදුස්සති න ඉස්සංබන්ධති සොතෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති නොචෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති සචෙමනුස්සත්තං ආගච්ඡති යත්ථයත්ථ පච්චාජායති මහෙසක්ඛොහොති මහෙසක්ඛ සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං අනිස්සාමනකොහොති පරලාභ සක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු න ඉස්සති න උපදුස්සති න ඉස්සංබන්ධති.

14 මානව, මානවකය; ඉධ, මේලොකයෙහි; එකච්චො ඉත්ථී වා, සමහරස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසො වා, සමහරපුරුෂයෙක්හෝ; අනිස්සාමනකොහොති, (පරසම්පත් අසහනලක්ෂණවූ) ඊර්ෂ්‍යාසම්ප්‍ර

සුසනසිත් නැත්තේවේද; පරලාභසක්කාර ගරුකාරමානනවන්දන
පූජනාසු මෙරමාලබනලාභසත්කාර ගරුකාරමානනවන්දන පූජ
නාවන් විෂයෙහි; න ඉස්සති,ඊර්ෂ්‍යානොකෙරේද; න උපදුස්සති, ඊ
ර්ෂ්‍යාවශයෙන්ම උපක්‍රොශකෙරෙමින් නොසතුටුනොවේද; ඉස්සං
යථොක්තවූ ඊර්ෂ්‍යාව; නබන්ධති, යවකලාපයක් බඳනාක්හුසේ නො
නස්නාපරිද්දෙන් බැන්දුක්මෙන් සිත්හි නොතබාද; සො, ඒ පුද්ග
ලතෙම; එවං සමත්තෙන, මෙසේ සම්පූර්ණකොට පුරණලද්දාවූ; ඒ
වං සමාදින්නෙන, මෙසේමනාකොට සමාදන්වනලද්දාවූ; තෙන
කම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙන; කායස්සභෙදා, කර
ජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුග
තිං, ශොභනවූ ගතිඇතිහෙයින් සුගතිනම්වූ; සග්ගං, සුෂ්ඨුඅග්‍රහෙ
යින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේ
ය; චෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්ම
රණා, කාබුන් මරණින්මත්තෙහි; සුගතිං, ශොභනවූ ගතිඇතිහෙ
යින් සුගතිනම්වූ; සග්ගං, සුෂ්ඨුඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං,දි
ව්‍යලොකයෙහි; නො උපපජ්ජති, නොඋපදනේවීනම්; සචෙමනුස්ස
ත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යත්වයට පැමිණියේවීනම්; යත්ථයත්ථ ප
ච්චාජායති, ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්යම් කුලයෙක උපදනේද; මහෙ
සක්ඛො හොති, මහේශාක්‍යවත්තේය හෙවත් මහානුභාව සම්ප
න්නවන්නේය.

පරලාභ සක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු, මෙරමාලබ
නලාභ සත්කාර ගරුකාර මානනවන්දන පූජනාවන් විෂයෙහි; න
ඉස්සති, ඊර්ෂ්‍යානොකරන්නේද; න උපදුස්සති, ඊර්ෂ්‍යාවශයෙන්ම උ
පක්‍රොශකෙරෙමින් නොසතුටු නොවන්නේද; ඉස්සං, යථොක්තවූ
ඊර්ෂ්‍යාව; නබන්ධති, යවකලාපයක් බඳනාක්හුසේ නොනස්නාපරිද්
දෙන්බැන්දුක්මෙන් සිත්හි නොතබන්නේය යන; යදිදං, අනිස්සු
මනකො හොති, යම් මේ ඊර්ෂ්‍යාසම්ප්‍රයුක්ත චිත්තප්‍රවෘත්තියෙක්
නොවේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතොමෝ;
මහෙසක්ඛ සංවත්තනිකා, මහේශාක්‍ය භාවය පිණිස වන්නීය
හෙවත් මහානුභාව සම්පන්නබව පිණිස වන්නීය.

15 ඉධපනමානව එකච්චො ඉත්ථීවා පුරිසොවා නදාතාහොති
සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ
විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං සොතෙන කම්මෙන එවං සම
ත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ග
තිං විනිපාතං නිරයං උපපජ්ජති,නොචෙ කායස්සභෙදාපරම්මරණා
අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්ත

ආගච්ඡති යත්‍ථ යත්‍ථ පච්චාජායති අප්පභොගො හොති අප්පභොග
සංවත්තනිකා එසා මාණව පටිපදා යදිදං නදාතා හොති සමණස්ස
වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං
සෙය්‍යාවසථපදීපෙය්‍යං.

15 මාණව, මාණවකය; ඉධ, මෙලොකයෙහි; එකච්චො ඉත්ථීවා,
සමහරස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසොවා, සමහරපුරුෂයෙක්හෝ;
සමණස්සවා, සමිතපාපීවූ ශ්‍රමණයකුහටහෝ; බ්‍රාහ්මණස්සවා, බාහි
තපාපීවූ බ්‍රාහ්මණයකුහටහෝ; අන්නං, "ශාලිව්‍රීහියවකඞ්ගුකුද්‍රූස
වරකගොධූමය"යන සප්තවිධ ධාන්‍යයෙන් නිෂ්පන්නවූ ඛජ්ජභොජ්ජ
ලෙය්‍යපෙය්‍යාදිවශයෙන් චතුර්විධවූ ආහාරවර්ගය; පානං, මධුමුද්දි
කාදි අෂ්ටවිධපානවර්ගය; වත්ථං, ක්ෂෞමකෞසෙය්‍යාදිවස්ත්‍රය; යා
නං, රථගැල්පුවත් ඉදෙලිදෙලිකුනම් ඇත් අස් ආදියානවාහනය;
මාලා,ගෙතූනොගෙතූ සීනිද්ද බෝලිද්ද ඇසමන් ආදිවූසුගන්ධපුෂ්ප
ය; ගන්ධ, කස්තූරුකපුරුජබාදු පිණිදිය ආදිසුගන්ධය; විලෙපනං, ස
ඳුන්කසාගොරද කොකුම් ආදිජවිරාගකරණය;සෙය්‍යන්ති,බිසිචිලිම්*
කාදි දසශවිධසෙය්‍යාය නොහොත් විචිත්‍රවිත්‍රකර්මාන්ත විශිෂ්ටරත්
නපය්‍යඞ්ක ගොනක කුත්තක චිත්‍රපටිකපටලික තුලිකකාවසීස්ස
කොසෙය්‍යාදි උතුම්සෙය්‍යාය; ආවසථ, ආවාසයහෙවත් ලැගුම්ගෙ
ය; පදීපෙය්‍යං, ප්‍රදීපයටහිතවූ පහන්කඳු පහන්මාලා පහන්වැටි
පහන්තෙල් ආදිය (යන මෙකී දසවිධ දානවස්තූන්); නදාතාහො
ති, (ස්වසම්පත්තිනිගූහන ලක්ෂණවූ මාත්සර්‍ය්‍යවශයෙන්)නොදෙන්
නේවේද; සො, ඒ පුද්ගලතෙම; එවං සමත්තන, මෙසේ සම්පූර්ණ
කොට පූරණලද්දවූ; එවං සමාදින්නෙන, මෙසේ මනාකොට සමා
දන්වනලද්දවූ; තෙනකම්මෙන, ඒ අකුශලකර්මය හෙතුකොටගෙ
න; කායස්ස භෙදා, ශරීරභෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙ
හි; අපායං; අයසඞ්ඛ්‍යාතවූ සැපයෙන්පහවූහෙයින් අපායනම්වූ;
දුග්ගතිං, දුඃඛයටපිහිට හෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසව
පතිතවනතැන් හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිත සු
ඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ සතරකී අපායාදියෙහි;
උපපජ්ජති, උපදනේය.

චෙ, ඉදින්; කායස්සභෙදා, ශරීරභෙදයෙන්; පරම්මරණා, මරණි
න්මත්තෙහි; අපායං, අයසඞ්ඛ්‍යාතවූ සැපයෙන් පහවූහෙයින් අපා
යනම්වූ; දුග්ගතිං, දුඃඛයට පිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං,
විවසව පතිතවනතැන් හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාද
සංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ සතරකී අපා

* චිම්ලි.

ගාදියෙහි; නොඋප්පජ්ජති, නොඋපන්නේවී නම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින් මනුෂ්‍යත්වයට පැමිණියේවී නම්; යත්ථයත්ථ පච්චාජායති, ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්කිසි කුලයෙක උපදනේද; අප්පභොගොහොති, උපභොග පරිභොග සම්පත් නැතිවන්නේය; සමණස්සවා, සම්තපාපීවූ ශ්‍රමණයක්හටහෝ; බ්‍රාහ්මණස්සවා, බාහිතපාපීවූ බ්‍රාහ්මණයක්හටහෝ; අන්නං, ශාලිව්‍රීහිආදි සප්තවිධධාන්‍යයෙන් කළ ආහාරය; පානං, මධුමුද්දිකාදි අෂ්ටවිධපානවර්ගය; වත්ථං, ක්‍ෂෞමකොසෙය්‍යාදි වස්ත්‍රය; යානං, රථගැල්පුවත් ඇත්අස්ඉදෙලිදෙලි කූනම් ආදියානවාහනය; මාලා, ගෙතූනොගෙතූ සිනිද්ද බෝලිද්ද දෑසමන් ආදී සුගන්ධපුෂ්පය; ගන්ධ, කස්තුරුකපුරු ආදිසුගන්ධය; විලෙපනං, සඳුන් කොකුම්ආදි ඡවිරාගකරණය; සෙය්‍යං, හිසිච්මිලිකාදි දශවිධසෙය්‍යාය නොහොත් විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විශිෂ්ටරත්නපර්‍ය්‍යඞ්කා ගොනක කුත්තක චිත්තකපට්ක පටලිකතූලික කටිස්සකොසෙය්‍යාදිඋතුම්සෙය්‍යාය; ආවසථ, ආවාසය; පදීපෙය්‍යං, ප්‍රදීපයට හිතවූ පහන්වැටි පහන්තෙල් ආදිය යන දශවිධ දානවස්තූන්; යදිදං න දාතාහොති, (යම්මේමාත්සර්‍ය්‍යාදි වශයෙන්) නොදීමෙක්වේද; මානව, මානවකය; එසාපටිපදා, මේප්‍රතිපත්තිතොමෝ; අප්පභොගසංවත්තනිකා, උපභොග පරිභොග සම්පත් නැතිබව පිණිස වන්නීය.

16 ඉධපනමානව එකච්චො ඉත්ථීවා පුරිසොවා දාතාහොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං සොතෙන කම්මෙන එවං සමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උප්පජ්ජති නොචෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උප්පජ්ජති සචෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති මහාභොගො හොති මහාභොගසංවත්තනිකා එසාමානව පටිපදා යදිදං දාතාහොති සමණස්සවා බ්‍රාහ්මණස්සවා අන්නංපානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං.

16 මානව, මානවකය; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චොඉත්ථීවා සමහරස්ත්‍රියෙක්හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ; සමණස්සවා, සම්තපාපීවූ ශ්‍රමණයක්හට හෝ; බ්‍රාහ්මණස්සවා, බාහිතපාපීවූ බ්‍රාහ්මණයක් හටහෝ; අන්නං, (ශාලිව්‍රීහිආදී සප්තවිධ ධාන්‍යයෙන්කළ)ආහාරය; පානං,(මධුමුද්දිකාදී අෂ්ටවිධ) පානවර්ගය; වත්ථං, (ක්‍ෂෞමකොසෙය්‍යාදි) වස්ත්‍රය; යානං, (රථගැල්පුවත් ඉදෙලි දෙලි කූනම් ඇත්අස් ආදි) යානවාහනය; මාලා, (ගෙතූ නොගෙතූ සිනිඳු බෝලිඳු දෑසමන් ආදී) සුගන්ධ

පුෂ්පය; ගන්ධ,(සඳුන්සුවඳ කස්තුරුකපුරු ජබාදු පිණ්ඩිය ආදිවූ)සු
ගන්ධය; විලෙපනං, (සඳුන් කසාගොරද කොකුම්ආදි) ඡවිරාගකර
ණය; සෙය්‍ය, (හිසිබිම්බිලිකාදි දශවිධ) සෙය්‍යය නොහොත් විචිත්‍ර
චිත්‍ර කර්මානාන විශිෂ්ටරත්න පර්‍ය්‍යඞ්ක ගොනක කුත්තක චිත්තක
පටික පටලිකතූලික කටිස්සකොසෙය්‍යාදි උතුම් සෙය්‍යාය; ආවස
ථ, ආවාසය; පදීපෙය්‍යං,ප්‍රදීපයටහිතවූ පහන්කඳු පහන්මාලා පහ
න්වැටි පහන්තෙල් යනමෙකීදශවිධ දානවස්තූන්; දනාහොති,දෙ
න්නේවේද; සො, ඒපුද්ගලතෙම; එවංසමත්තෙන, මෙසේසම්පූර්ණ
කොටපූරණලද්දවූ; එවංසමාදින්නෙන, මෙසේමනාකොට සමාද
න්වනලදවූ; තෙනකම්මෙන, ඒකුශලකර්මය හෙතුකොටගෙන;
කායස්සභෙදා, ශරීරභෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි;
සුගතිං,(රූපශබ්දාදි පඤ්චකාමසම්පත්තියෙන්ශොභමානවූ කුශලක
ර්මයෙන් පැමිණියයුතුහෙයින්) සුගතිනම්වූ; සග්ගං, (රූපශබ්දාදි
පඤ්චකාම සම්පත්තියෙන් අග්‍රහෙයින්)ස්වර්ගනම්වූ; ලොකං, දි
ව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේය; චෙ, ඉදින්; කායස්සභෙ
දා, ශරීරභෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, ශො
භනවූකර්මයෙන් පැමිණියයුතුහෙයින් සුගතිනම්වූ; සග්ගං, රූප
ශබ්දාදි පඤ්චකාමසම්පත්තීන් අග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං,
දිව්‍යලොකයෙහි; නොඋපපජ්ජති, නොඋපන්නේ වීනම්; සචෙම
නුස්සත්තං ආගච්ඡති, ඉදින්මනුෂ්‍යභවයට පැමිණියේවීනම්; යත්‍ථය
ත්‍ථපච්චාජායති, ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්කිසිකුලයෙක උපන්නේද; ම
හාභොගොහොති, බොහෝඋපභොග පරිභොග වස්තු ඇතිවන්
නේය; සමණස්සවා, සමිතපාපිවූ ශ්‍රමණයක්හටහෝ; බ්‍රාහ්මණස්ස
වා, බාහිතපාපීවූ බ්‍රාහ්මණයක්හටහෝ; අන්නං, (ශාලිව්‍රීහියවක
ඞ්ගුකුද්‍රූසවරකගොධූමය යන සප්තවිධ ධාන්‍යයෙන් නිර්මිතවූ ඛ
ජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යාදි වශයෙන් චතුර්විධවූ)ආහාරවර්ගය; පානං
(මධුමුද්දිකාදි අෂ්ටවිධ) පානවර්ගය; වත්‍ථං, (ක්‍ෂෞමකොසෙය්‍යාදි)
වස්ත්‍රය; යානං, (රථගැල්සුවත් ඉද්දෙලි දෙලිකූනම් ඇත් අස් ආදි)
යානවාහනය; මාලා,(ගෙතූනොගෙතූ සීනිද්ද බෝලිද්ද දැසමන්
ආදී) සුගන්ධපුෂ්පය; ගන්ධ,(කස්තුරුකපුරු පිණ්ඩිය ආදිවූ)සුගන්ධය;
විලෙපනං, (සඳුන්කසා ගොරද කොකුම්ආදි) ඡවිරාගකරණය;
සෙය්‍ය, හිසිබිම්බිලිකාදි දශවිධසෙය්‍යාය; නොහොත් විචිත්‍ර චිත්‍රක
ර්මානානවිශිෂ්ටරත්න පර්‍ය්‍යඞ්ක ගොනක කුත්තකචිත්තකපටිකපට
ලිකතූලික කටිස්සකොසෙය්‍යාදි උතුම්සෙය්‍යාය; ආවසථ, ආවාස
ය හෙවත් ලැගුම්ගෙය; පදීපෙය්‍යං, ප්‍රදීපයටහිතවූ පහන්කඳු ප
හන්මාලා පහන්වැටි පහන්තෙල් යන මේ දශවිධ දානවස්තූන්;
යදිදං දනාහොති, යම්මේ දානයෙක්වේද; මානව, මානවකය; එසා

පටිපදා, මේ ප්‍රතිපත්ති තොමෝ; මහාභොගසංවත්තනිකා, බොහෝ උපභොග පරිභොග වස්තුඇතිබවපිණිස වන්නීය.

17 ඉධපනමානව එකච්චො ඉත්ථිවා පුරිසොවා එද්ධොහොති අතිමානී, අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨාති, ආසනාරහස්ස න ආසනංදෙති, මග්ගාරහස්ස න මග්ගංදෙති, සක්කාතබ්බං න සක්කරොති, ගරුකාතබ්බං න ගරුකරොති, මානෙතබ්බං න මානෙති, පූජෙතබ්බං න පූජෙති, සොතෙන කම්මෙන එවංසමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති, නොචෙකායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථපච්චාජායති, නීචාකුලීනොහොති, නිචාකුලිනසංවත්තනිකා එසාමානව පටිපදා යදිදං එද්ධොහොති, අතිමානී, අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨාති, ආසනාරහස්ස න ආසනංදෙති, මග්ගාරහස්ස න මග්ගංදෙති, සක්කාතබ්බං න සක්කරොති, ගරුකාතබ්බං න ගරුකරොති,මානෙතබ්බං න මානෙති,පූජෙතබ්බං න පූජෙති.

17 මානව, මානවකය; ඉධ, මෙලොකයෙහි; එකච්චො ඉත්ථිවා, සමහරස්ත්‍රියෙක්හෝ; එකච්චොපුරිසොවා,සමහරපුරුෂයෙක්හෝ; එද්ධොහොති, තදමන්ඇත්තේවේද; අතිමානී,"සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි සදිසස්සසෙය්‍යොහමස්මි හීනස්ස සෙය්‍යොහමස්මි" යනත්‍රිවිධමානයෙන් යුක්තවේද; අභිවාදෙතබ්බං, නමස්කාරාහිවූ බුඩාදි ආර්‍ය්‍යයක්හට; න අභිවාදෙති, නමස්කාරනොකෙරේද; පච්චුට්ඨාතබ්බං, දුකහුනස්නෙන් නැගීසිටියයුතු එබඳුමහොත්තමයක්හු; න පච්චුට්ඨාති, දුකහුනස්නෙන් නැගීනොසිටීද; ආසනාරහස්ස, ආසනදෑනයටසුදුසු එබඳුමජ්‍යෙෂ්ඨයක්හට; ආසනං න දෙති, හිඳිනා අසුන්පණවානොදේද; මග්ගාරහස්ස, මගින්පහව්මටසුදුසු එබඳුඋත්කෘෂ්ටයක්හට; මග්ගං න දෙති, මගනොදේද; සක්කාතබ්බං, විශෙෂයෙන්සකස්කරණලද ප්‍රත්‍යය දෑනයට සුදුසුවූ උත්කෘෂ්ටයක්හට; න සක්කරොති, සත්කාරනොකෙරේද; ගරුකාතබ්බං, පාසානච්ඡත්‍රයක්මෙන් ගරුකටයුතුවූ එබඳුවූ එක්තරා වක්හු; න ගරුකරොති, ගරුනොකෙරේද; මානෙතබ්බං, ගුණවිසින්ආදරකටයුතුවූ එබඳුවූම උතුමක්හට; න මානෙති, ආදරනොකෙරේද;පූජෙතබ්බං,(ගන්ධපුෂ්පාදීන් පිදියයුතු එබඳුවූම)පූජ්‍යයක්හු; න පූජෙති, නොපුදාද; සො, ඒ පුඟුලතෙම; එවංසමත්තෙන, මෙසේසම්පූර්ණකොට පුරණලද්දාවූ; එවංසමාදින්නෙන, මෙසේමනාකොටසමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ(අකුශල)කර්මයහෙතුකොටගෙන; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා,

මරණින්මත්තෙහි; අපායං, අයසංඛ්‍යාතවූ සැපයෙන්පහවූ හෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයටපිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසවපතිතවන තැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ; යටකීඅපායාදියෙහි; උපපජ්ජති, උපදනේය·

වෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අපායං, අයසංඛ්‍යාතවූ සැපයෙන් පහවූ හෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයටපිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසවපතිතවන තැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටකී අපායාදියෙහි; නොඋපපජ්ජති, නොඋපදනේවීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින්මනුෂ්‍යත්වයට පැමිණියේවීනම්; යත්ථයත්ථපච්චාජායති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි යම්කිසිකුලයෙක උපදනේද; නීචාකුලීනොහොති, යටත්වූ නීචජාති ඇත්තේවේ·

අතිමානී, "සෙය්‍යස්සසෙය්‍යොහමස්මි සදිසස්සසෙය්‍යොහමස්මි හීනස්සසෙය්‍යොහමස්මි" යනාදිවිධාවූ මානයෙන්යුක්තවන්නේය; අභිවාදෙතබ්බං, නමස්කාරාර්හවූ බුද්ධාදි ආර්‍ය්‍යයක්හට; නඅභිවාදෙති, නමස්කාරනොකරන්නේය; පච්චුට්ඨාතබ්බං, දැකහුනස්නෙන්නැගීසිටියයුතු එබඳුමහොත්තමයක්හු; න පච්චුට්ඨාති, දැකහුනස්නෙන් නැඟීනොසිටිනේය; ආසනාරහස්ස, ආසනදානයට සුදුසු එබඳුවූම ශ්‍රෙෂ්ඨයක්හට; ආසනං න දෙති, හිඳිනාඅසුන් නොදෙන්නේය; මග්ගාරහස්ස, මඟින්පහවීමට සුදුසුඑබඳුවූම ශ්‍රෙෂ්ඨයක්හට; මග්ගං න දෙති, මඟනොදෙන්නේය හෙවත් මඟින්පහනොවන්නේය; සක්කාතබ්බං, විශෙෂයෙන් සකස්කරණලද ප්‍රත්‍යයදානයටසුදුසු එබඳුවූම උත්කෘෂ්ටයක්හට; න සක්කරොති, සත්කාරනොකරන්නේය; ගරුකාතබ්බං, පාසානච්ඡත්‍රයක්මෙන් ගරුකටයුතුවූ එබඳුවූම එක්තරාවක්හු; න ගරුකරොති, ගරුනොකරන්නේය; මානෙතබ්බං, ගුණවිසින්ආදරකටයුතු එබඳුවූම උතුමක්හට; න මානෙති, ආදරනොකරන්නේය; පූජෙතබ්බං.(ගන්ධපුෂ්පාදීන්පිදියයුතු එබඳුවූ) පූජ්‍යයක්හු; න පූජෙති, නොපුදන්නේය යනා; යදිදං ඵධොහොති, යම්මේ තදමනෙක්වේද; මානව, මානවකය; එසාපටිපදා, මේප්‍රතිපත්තිතොමෝ: නීචාකුලීනසංවත්තනිකා යටත්වූනීචජාති ඇතිබව පිණිසවන්නීය.

18 ඉධපනමානව එකච්චො ඉත්ථීවාපුරිසොවා අත්ථද්ධොහොති. අනතිමානී, අභිවාදෙතබ්බං අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං පච්චුට්ඨාති, ආසනාරහස්ස අසනංදෙති, මග්ගාරහස්ස මග්ගංදෙති,

සක්කාතබ්බං සක්කරොති, ගරුකාතබ්බං ගරුකරොති, මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති, සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති· නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්‍ථ යත්‍ථ පච්චාජායති, උච්චාකුලීනො හොති. උච්චාකුලීනසංවත්තනිකා එසා මානව පටිපදා යදිදං අත්‍ථද්ධො හොති, අනතිමානී, අභිවාදෙතබ්බං අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං පච්චුට්ඨෙති, ආසනාරහස්ස ආසනං දෙති, මග්ගාරහස්ස මග්ගං දෙති, සක්කාතබ්බං සක්කරොති, ගරුකාතබ්බං ගරුකරොති, මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති.

18 මානව, මානවකය; ඉධපන, මේලොකයෙහි වනාහි; එකච්චො ඉත්‍ථීවා, සමහරස්ත්‍රියෙක්හෝ, එකච්චො පුරිසොවා, සමහරපුරුෂයෙක්හෝ; අත්‍ථද්ධො හොති, තදමන් නැත්තේවේද; අනතිමානී, "සෙය්‍යස්සසෙය්‍යොහමස්මි සදිසස්සසෙය්‍යොහමස්මි හීනස්ස සෙය්‍යොහමස්මි" යනත්‍රිවිධ වූ මානයෙන් යුක්තනොවේද; අභිවාදෙතබ්බං, නමස්කාරාර්හවූ බුද්ධාදී ආර්‍ය්‍යයන්හට; අභිවාදෙති, නමස්කාරකෙරේද; පච්චුට්ඨාතබ්බං, දැකහුනස්නෙන් නැගිසිටියයුතු එබඳුවූම මහොත්තමයන්හු; පච්චුට්ඨෙති, දැකහුනස්නෙන් නැගීසිටීද; ආසනාරහස්ස, ආසනදානයටසුදුසුවූ එබඳුවූම ජ්‍යෙෂ්ඨයන්හට; ආසනංදෙති, හිඳිනාසුන්දේද; මග්ගාරහස්ස, මඟින්පහව්මටසුදුසුවූ එබඳුජ්‍යෙෂ්ඨයන්හට; මග්ගංදෙති, මගදේද හෙවත්මඟින් පහවේද; සක්කාතබ්බං, විශෙෂයෙන් සකස්කරණලද ප්‍රත්‍යයදානයට සුදුසුවූ එබඳුවූම උත්කෘෂ්ටයන්හට; සක්කරොති, සත්කාරකෙරේද; ගරුකාතබ්බං, පාසානච්ඡත්‍රයක්මෙන් ගරුකටයුතු එබඳුවූම එත්තරාවන්හු; ගරුකරොති, ගරුකෙරේද; මානෙතබ්බං; ගුණවිසින් ආදරකටයුතු එබඳුවූ උතුමන්හට; මානෙති, ආදරකෙරේද; පූජෙතබ්බං, (ගන්ධපුෂ්පාදීන්පිදියයුතු එබඳුවූම) පූජ්‍යයන්හට; පූජෙති, පුදාද; සො, ඒපුද්ගලතෙම; එවංසමත්තෙන, මෙසේසම්පූර්ණකොට පූරණලද්දාවූ; එවංසමාදින්නෙන, මෙසේ මනාකොටසමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ (කුශල) කර්මයහෙතුකොටගෙන; කායස්සභෙදා, කරජකායයාගේ හෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, ශොභනවූගති ඇතිහෙයින් සුගතිනම්වූ; සග්ගං, සුට්ඨුඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදනේය.

චෙ, ඉදින්; කායස්සභෙදා, කරජකායයාගේ හෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, ශොභනවූගති ඇතිහෙයින්

සුගතිනම්වූ; සග්ගං, සුවඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍ය ලොකයෙහි; නොඋපපජ්ජති, නොඋපදින්නේ වීනම්; සචෙමනුස්සත්තං ආගච්ඡති, ඉදින්මනුෂ්‍යත්වයට පැමිණියේවීනම්; යත්‍ථයත්‍ථපච්චාජායති, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි)යම්යම්කුලයෙක උපදනේද; උච්චාකුලීනොහොති, (ක්ෂත්‍රියබ්‍රාහ්මණ) උතුම්වංශ ඇතිවන්නේය.

අනතිමානී, "සෙය්‍යස්සසෙය්‍යොහමස්මි සදිසස්සසෙය්‍යොහමස්මි හීනස්සසෙය්‍යොහමස්මි" යනත්‍රිවිධාතිමානයෙන් යුක්තනොවන්නේය; අභිවාදෙතබ්බං, නමස්කාරාර්හවූ බුද්ධාදිආර්‍ය්‍යයන්හට; අභිවාදෙති, නමස්කාරකරන්නේය; පච්චුට්ඨාතබ්බං, දක්නාහුනස්නෙන් නැගිසිටියයුතු එබඳුමහොත්තමයන්හු; පච්චුට්ඨෙති, දක්නාහුනස්නෙන්නැගිසිටිනේය; ආසනාරහස්සං, ආසනදෙනයටසුදුසු එබඳුමජ්‍යෙෂ්ඨයන්හට; ආසනංදෙති, හිඳිනාහුන්දෙන්නේය; මග්ගාරහස්සං මගින්පහවීමටසුදුසු එබඳුශ්‍රෙෂ්ඨයන්හට; මග්ගංදෙති, මගදෙන්නේය හෙවත්මගින් පහවන්නේය; සක්කාතබ්බං, විශෙෂයෙන් සත්කරණලද ප්‍රත්‍යයදනයට සුදුසු එබඳුවූම උතුමන්හට; සක්කරොති, සත්කාරකරන්නේය; ගරුකාතබ්බං, ගරුකටයුතු එබඳුඋතුමන්හට; ගරුකරොති, ගරුකරන්නේය; මානෙතබ්බං, බුහුමන්කටයුතු එබඳුඋතුමන්හට; මානෙති, ආදරකරන්නේය; පූජෙතබ්බං, (ගන්ධපුෂ්පාදීන්පිදියයුතු එබඳුවූම) පූජ්‍යයන්හු; පූජෙති, පුදන්නේය යන; යදිදංඅත්‍ථඩොහොති, යම්මේ තදම්නෙක්නොවේද; මානව, මානවකය· එසාපටිපදා, මේප්‍රතිපත්තිතොමෝ; උච්චාකුලීනසංවත්තනිකා, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි) උතුම්වංශ ඇතිබවපිණිස වන්නීය.

19 ඉධපනමානව එකච්චො ඉත්‍ථිවාපුරිසොවා සමණංවා බ්‍රාහ්මණංවා උපසංකමිත්‍වා න පරිපුච්ඡිතාහොති· කිංභන්තෙ කුසලං කිංඅකුසලං කිංසාවජ්ජං කිංඅනවජ්ජං කිංසෙවිතබ්බං කිංනසෙවිතබ්බං කිංමෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛායහොති· කිංවා පනමෙ කයිරමානං දීඝරත්තං හිතායසුඛාය හොතී'ති සො තෙන කම්මෙන එවංසමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, නොචෙකායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්‍ථයත්‍ථපච්චාජායති, දුප්පඤ්ඤොහොති, දුප්පඤ්ඤසංවත්තනිකා එසාමානව පටිපදා යදිදං සමණංවා බ්‍රාහ්මණංවා උපසංකමිත්‍වා න පරිපුච්ඡිතා හොති, කිංභන්තෙ කුසලං කිංඅකුසලං කිංසාවජ්ජං කිංඅනවජ්ජං කිංසෙවිතබ්බං කිංනසෙවිතබ්බං කිංමෙකයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිංවාපනමෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතී'ති.

19 මාණව, මාණවකය; ඉධපන, මේලොකයෙහිවනාහි; එකච්චො ඉත්ථීවා, සමහරස්ත්‍රියෙක්හෝ; එකච්චොපුරිසොවා, සමහරපුරුෂයෙක්හෝ; සමණංවා, සමිතපාපීවූශ්‍රමණයක් කරාහෝ; බ්‍රාහ්මණංවා, බාහිතපාපීවූ බ්‍රාහ්මණයක්කරාහෝ; උපසංකමිත්වා, එළඹ; භනෙත, වහන්ස; කිංකුසලං, කිමෙක්කුසල්ද; නොහොත්කුසල්නම් කිමෙක්ද; කිංඅකුසලං, කිමෙක්අකුසල්ද නොහොත් අකුසල්නම්කිමෙක්ද; කිංසාවජ්ජං, කිමෙක්සාවද්‍යද හෙවත් කිමෙක්සදෝෂද; කිං අනවජ්ජං, කිමෙක්නිරවද්‍යද හෙවත් කිමෙක් නිර්දෝෂද; කිංසෙවිතබ්බං, කිමෙක්භජනය සෙවනය කටයුතුද; කිංනසෙවිතබ්බං, කිමෙක්භජනය සෙවනය නොකටයුතුද; මෙ, මාවිසින්; කිංකයිරමානං, කිමෙක්කරණලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; අහිතාය දුක්ඛායහොති, අහිතයට දුක්ඛයට කාරණවේද; වා, නොහොත්; මෙ, මාවිසින්; කිංකයිරමානං, කුමක්කරණලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; හිතාය සුඛායහොතීති, හිතසැපපිණිසවන්නේදැයි; න පරිපුච්ඡිතාහොති, නොවිචාරන්නේවේද; සො, ඒපුද්ගලතෙම; එවංසමත්තෙන, මෙසේසම්පූර්ණකොට පූරණලද්දාවූ; එවංසමාදින්නෙන, මෙසේමනාකොට සමාදන්වනලද්දාවූ; තෙනකම්මෙන, ඒ (අකුශල) කර්මයහෙතුකොටගෙන; කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, එයට අනතුරුවඋපදනා ස්කන්ධග්‍රහණයෙහි; අපායං, අයසංඛ්‍යාතවූ සැපයෙන් පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයටපිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසව පතිතවනතැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටකීඅපායාදියෙහි; උපපජ්ජති, උපදනේය.

චෙ, ඉදින්; කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, මරණින්මතෙහි; අපායං, සැපයෙන් පහවූහෙයින් අපායනම්වූ; දුග්ගතිං, දුඃඛයටපිහිටහෙයින් දුර්ගතිනම්වූ; විනිපාතං, විවසවපතිතවනතැන්හෙයින් විනිපාතනම්වූ; නිරයං, ආස්වාදසංඥිතවූ සුඛසෞමනස්‍යයක් නැතිහෙයින් නිරයනම්වූ යටකීඅපායාදියෙහි; නොඋපපජ්ජති, නොඋපන්නේවීනම්; සචෙමනුස්සත්තං, ආගච්ඡති, ඉදින්මනුෂ්‍යභවයට පැමිණියේවීනම්; යත්ථයත්ථපච්චාජායති, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි) යම්කිසිකුලයෙක උපදනේද; දුප්පඤ්ඤොහොති, නුවණනැතිවන්නේය.

සමණංවා, සමිතපාපීවූ ශ්‍රමණයක්හූ කරාහෝ; බ්‍රාහ්මණංවා, බාහිතපාපීවූ බ්‍රාහ්මණයක්හූ කරාහෝ; උපසංකමිත්වා, එළඹ; භනෙත, වහන්ස; කිංකුසලං, කිමෙක්කුසල්ද නොහොත් කුසල්නම් කිමෙක්ද; කිංඅකුසලං, කිමෙක්අකුසල්ද නොහොත් අකුසල්

නම් කිමෙක්ද; කිංසාවජ්ජං, කිමෙක්සාවද්‍යද හෙවත් කිමෙක්ස දොෂද; කිංඅනවජ්ජං, කිමෙක්නිරවද්‍යද හෙවත් කිමෙක්නිර්දො ෂද; කිංසෙවිතබ්බං, කිමෙක්භජනයකටයුතුද; කිංනසෙවිතබ්බං, කිමෙක් සෙවනය නොකටයුතුද; මෙ, මාවිසින්; කිංකයිරමා නං, කිමෙක්කරණුලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; අහි තාය දුක්ඛායහොති, අහිතයට දුඃඛයට කාරණවේද; වා, නො හොත්; මෙ, මාවිසින්; කිංකයිරමානං, කුමක්කරණු ලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; හිතාය සුඛායහොතීති, හිතසැපපිණි සවන්නේදැයි යන; යඉදං න පරිපුච්ඡිතාහොති, යම්මේ නොවිචා රීමෙක්වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිපත්තිතො මෝ; දුප්පඤ්ඤසංවත්තනිකා, නුවණනැතිබවපිණිස වන්නීය.

20 ඉධපනමානව එකච්චො ඉත්ථිවා පුරිසොවා සමණංවා බ්‍රාහ්ම ණංවා උපසංකමිත්වා පරිපුච්ඡිතාහොති කිංභන්තෙ කුසලං කිංඅ කුසලං කිංසාවජ්ජං කිංඅනවජ්ජං කිංසෙවිතබ්බං කිංනසෙවිතබ්බං කිංමෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛායහොති කිංවාපන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය හොතී'ති සොතෙන ක ම්මෙන එවංසමත්තෙන එවංසමාදින්නෙන කායස්සභෙදා පරම්ම රණා සුගතිං සග්ගංලොකං උපපජ්ජති නොචෙකායස්සභෙදා පර ම්මරණා—පෙ—සචෙමනුස්සත්තං ආගච්ඡති, යත්ථයත්ථ පච්චාජායති, මහාපඤ්ඤොහොති මහාපඤ්ඤසංවත්තනිකා එසාමානව පටිපදා යඉදං සමණංවා බ්‍රාහ්මණංවා උපසංකමිත්වා පරිපුච්ඡිතා හොති. කිංභන්තෙ කුසලං කිංඅකුසලං කිංසාවජ්ජං කිංඅනවජ්ජං කිංසෙ විතබ්බං කිංනසෙවිතබ්බං කිංමෙකයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිංවාපන මෙකයිරමානං දීඝරත්තං හිතාය සුඛා ය හොතී'ති

20 මානව, මානවකය; ඉධපන, මේලොකයෙහි වනාහි; එක ච්චොඉත්ථීවා, සමහරස්ත්‍රියෙක්හො; එකච්චොපුරිසොවා, සමහරපු රුෂයෙක්හෝ; සමණංවා, සමිතපාපීවූ ශ්‍රමණයන්හු කරාහෝ; බ්‍රා හ්මණංවා, බාහිතපාපීවූ බ්‍රාහ්මණයන්හු කරාහෝ; උපසංකමිත්වා, එළඹ; භන්තෙ, වහන්ස; කිංකුසලං, කිමෙක්කුසල්ද; නොහොත් කුසල්නම් කිමෙක්ද; කිංඅකුසලං, කිමෙක්අකුසල්ද නොහොත් අකුසල්නම් කිමෙක්ද; කිංසාවජ්ජං, කිමෙක්සාවද්‍යද හෙවත් කි මෙක්සදොෂද; කිංඅනවජ්ජං, කිමෙක්නිරවද්‍යද හෙවත් කිමෙක් නිර්දොෂද; කිංසෙවිතබ්බං, කිමෙක් සෙවනය කටයුතුද; කිං නසෙවිතබ්බං, කිමෙක් සෙවනය නොකටයුතුද; මෙ, මාවිසින්; කිංකයිරමානං, කුමක්කරණු ලබන්නේ; දීඝරත්තං, බොහෝ කලක්; අහිතාය දුක්ඛායහොති, අහිතයට දුඃඛයට කාරණ

වේද: වා, නොහොත්; මෙ, මාවිසින්; කිංකයිරමානං, කිමෙක්කර ණුලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; හිතාය සුඛාය හොතීති, හිතසැපපිණිසවන්නේදැයි; පරිපුච්ඡිතාහොති, විචාරන්නේවේද; සො, ඒ පුද්ගලතෙම; එවංසමත්තෙන මෙසේ සම්පූර්ණකොට පුර ණලද්දාවූ; එවංසමාදිනෙන, මෙසේමනාකොට සමාදන්වනල ද්දාවූ; තෙනකම්මෙන, ඒ (කුශල) කර්මයහෙතු කොටගෙන; කා යස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සු ගතිං, ශොභනවූ ගතිඇති හෙයින් සුගතිනම්වූ; සග්ගං, සුවඳුඅග්‍ර හෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපද නේය.

චෙ, ඉදින්, කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, මර ණින්මත්තෙහි; සුගතිං, ශොභනවූගති ඇතිහෙයින් සුගතිනම්වූ, සග්ගං, සුවඳුඅග්‍රහෙයින් ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; නොඋපපජ්ජති, නොඋපන්නේවීනම්; සචෙමනුස්සත්තංආගච්ඡති, ඉදින්මනුෂ්‍යභවයට පැමිණියේවීනම්; යත්‍රයත්‍රපච්චාජායති, (ක්ෂත්‍රි යබ්‍රාහ්මණාදි) යම්යම්කුලයෙක උපදනේද; මහාපඤ්ඤොහොති,ම හත්නුවණ ඇතිවන්නේය.

සමණංවා, සම්තපාපීවූ ශ්‍රමණයක්හු කරාහෝ; බ්‍රාහ්මණංවා,බා හිතපාපීවූ බ්‍රාහ්මණයක්හු කරාහෝ; උපසංකමිත්වා, එළඹ; භ න්තෙ, වහන්ස; කිංකුසලං, කිමෙක්කුසල්ද නොහොත් කුසල්නා ම් කිමෙක්ද; කිං අකුසලං, කිමෙක් අකුසල්ද හෙවත් අකුසල් නාම් කිමෙක්ද; කිංසාවජ්ජං, කිමෙක්සාවද්‍යද හෙවත් කිමෙ ක් සදොෂද; කිංඅනවජ්ජං, කිමෙක්නිරවද්‍යද හෙවත් කිමෙක් නි ර්දොෂද; කිංසෙවිතබ්බං, කිමෙක්භජනය සෙවනය කටයුතුද; කිංනසෙවිතබ්බං, කිමෙක්භජනය සෙවනය නොකටයුතුද; මෙ, මාවිසින්; කිංකයිරමානං, කිමෙක්කරණුලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; අහිතාය දුක්ඛායහොති, අහිතයට දුඃඛයට කාර ණවේද; වා, නොහොත්; මෙ, මාවිසින්; කිංකයිරමානං, කුමක්ක රණුලබන්නේ; දීඝරත්තං, බොහෝකලක්; හිතාය සුඛාය හොතී ති, හිතසැපපිණිසවන්නේදැයිකියා; යදිදංපරිපුච්ඡිතාහොති, යම් මේ විචාරීමෙක්වේද; මානව, මානවකය; එසාපටිපදා, මේ ප්‍රතිප ත්තිතොමෝ; මහාපඤ්ඤසංවත්තනිකා, මහත්වූ නුවණ ඇතිබව පිණිස වන්නීය.

21 ඉතිඛො මානව අප්පායුකසංවත්තනිකා පටිපදා අප්පායුක ත්තං උපනෙති දීඝායුකසංවත්තනිකා පටිපදා දීඝායුකත්තං උප නෙති බව්හාබාධසංවත්තනිකා පටිපදා බව්හාබාධත්තං උපනෙති අප්පාබාධසංවත්තනිකා පටිපදා අප්පාබාධත්තං උපනෙති, දුබ්බ

ණ්ණසංවත්තනිකා පටිපදා දුබ්බණ්ණත්තං උපනෙති, පාසාදිකසංවත්තනිකා පටිපදා පාසාදිකත්තං උපනෙති, අප්පෙසක්ඛසංවත්තනිකා පටිපදා අප්පෙසක්ඛත්තං උපනෙති, මහෙසක්ඛසංවත්තනිකා පටිපදා මහෙසක්ඛත්තං උපනෙති, අප්පභොගසංවත්තනිකා පටිපදා අප්පභොගත්තං උපනෙති, මහාභොගසංවත්තනිකා පටිපදා මහාභොගත්තං උපනෙති, නීචාකුලීනසංවත්තනිකා පටිපදා නීචාකුලීනත්තං උපනෙති, උච්චාකුලීන සංවත්තනිකා පටිපදා උච්චාකුලීනත්තං උපනෙති, දුප්පඤ්ඤසංවත්තනිකා පටිපදා දුප්පඤ්ඤත්තං උපනෙති, මහාපඤ්ඤසංවත්තනිකා පටිපදා මහාපඤ්ඤත්තං උපනෙති.

**21** මානව, මානවකය; ඉතිඛො, මෙසේව නාහි; අප්පායුකසංවත්තනිකා, අල්පායුෂ්කභාවයපිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ අප්පායුකත්තං උපනෙති, අල්පායුෂ්කභාවය එළවන්නීය; දීඝායුකසංවත්තනිකා, දීර්ඝායුෂ්කභාවයපිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; දීඝායුකත්තං උපනෙති, දීර්ඝායුෂ්කභාවය එළවන්නීය; බව්හාබාධසංවත්තනිකා, බව්හාබාධභාවය පිණිසවන්නාවූ; පටිපදා ප්‍රතිපත්තිතොමෝ; බව්හාබාධත්තං උපනෙති, බව්හාබාධභාවය එළවන්නීය; අප්පාබාධසංවත්තනිකා, අල්පාබාධභාවයපිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; අප්පාබාධත්තං උපනෙති, නිරොගිබව එළවන්නීය; දුබ්බණ්ණසංවත්තනිකා, දුර්වර්ණභාවය පිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ දුබ්බණ්ණත්තං උපනෙති, දුර්වර්ණභාවය එළවන්නීය; පාසාදිකසංවත්තනිකා, ප්‍රසාදවඝභාවයපිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; පාසාදිකත්තං උපනෙති, ප්‍රසාදවඝභාවය එළවන්නීය; අප්පෙසක්ඛසංවත්තනිකා, අල්පේශාක්‍යභාවය පිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; අප්පෙසක්ඛත්තං උපනෙති, අල්පේශාක්‍යභාවය එළවන්නීය; මහෙසක්ඛසංවත්තනිකා, මහෙශාක්‍යභාවයපිණිස වන්නාවූ, පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; මහෙසක්ඛත්තං උපනෙති, මහෙශාක්‍යභාවය එළවන්නීය; අප්පභොගසංවත්තනිකා, උපභොගපරිභොග සම්පත්නැතිබවපිණිස වන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; අප්පභොගත්තං උපනෙති, උපභොගපරිභොග සම්පත්නැතිබව එළවන්නීය; මහාභොගසංවත්තනිකා, බොහෝඋපභොගපරිභොග වස්තුඇතිබවපිණිස වන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; මහාභොගත්තං උපනෙති, බොහෝ උපභොගපරිභොගවස්තුඇතිබවවන්නීය; නීචාකුලීනසංවත්තනිකා, යටත්වූනීචජාතිඇතිබව පිණිස වන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; නීචාකුලීනත්තං උපනෙති, හීනකුලීනභාවය එළවන්නීය; උච්චාකුලීනසංවත්තනිකා, උතුම්වංශඇතිබව පිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්ති

තොමෝ; උච්චාකුලීනත්තං උපනෙති, උතුම්වංශඇතිබව එළවන්නිය; දුප්පඤ්ඤසංවත්තනිකා, නුවණනැතිබවපිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; දුප්පඤ්ඤත්තං උපනෙති, නුවණනැතිබවඑළවන්නිය; මහාපඤ්ඤසංවත්තනිකා, මහත්නුවණඇතිබව පිණිසවන්නාවූ; පටිපදා, ප්‍රතිපත්තිතොමෝ; මහාපඤ්ඤත්තං උපනෙති, මහත්නුවණ ඇතිබව එළවන්නිය.

22 කම්මස්සකාමානවසත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධූ කම්මපටිසරණා කම්මංසත්තෙ විභජති යදිදං හීනප්පණීතතායා’ති.

22 මානව, මානවකය; සත්තා, (පඤ්චකාමවිෂයෙහි සක්තවිසක්තවීයෙන් සත්ත්වනම්වූ සකල) ප්‍රාණීහු; කම්මස්සකා කර්මයමස්වකීයකොට ඇත්තාහු හෙවත් සත්ත්වයන් සන්තක වස්තුවෙක්නම් කර්මයමය; කම්මදායාදා, කර්මයම හිමිකොට ඇත්තාහු; හෙවත් තමාහිමිවස්තුවෙක්නම් කර්මයමය; කම්මයොනී, කර්මයකාරණකොට ඇත්තාහු හෙවත් සියලුඉෂ්ටානිෂ්ටඵලයට කර්මයම කාරණවන්නේය; කම්මබන්ධූ, කර්මය බන්ධුකොට ඇත්තාහු හෙවත් සියලුවැඩට සහායවනබන්ධුහු නමුත් කුශලකර්මයමය; කම්මපටිසරණා, කර්මයපිළිසරණකොට ඇත්තාහු හෙවත් සත්ත්වයන්ට පිහිටෙක් නම් උන් උන්කළ සුචරිතකර්මයමය; කම්මං, දුශ්චරිතසුචරිත කර්මයතෙම; යදිදංහීනප්පණීතතාය, හෝ හීනවා හෝ උතුම්වා හෝමන්දායුෂ්කවා හෝදීර්ඝායුෂ්කවා හෝරෝගීවා හෝනිරෝගීවා, හෝදුර්වර්ණවාහෝවර්ණසම්පන්නවා හෝඅල්පේශාක්‍යවා හෝමහේශාක්‍යවා හෝඅල්පභෝගීවා හෝමහාභෝගීවා හෝහීනකුලීනවා හෝමහාකුලීනවා හෝනුවණනැතිවා හෝනුවණඇතිවා යි මෙසේහීනප්‍රණීත භාවයපිණිස යම්මේවිභාග කිරීමෙක්ඇද්ද, (එපරිද්දෙන්;) සත්තෙ, ඒ ඒසත්ත්වයන්; විභජතීති, විභාගකරන්නේයයි හෙවත් තෙලකුශලාකුශලකර්මයම හීනප්‍රණීත භාවයපිණිස මෙසේසත්ත්වයන් බෙදන්නේය; ඊශ්වරාදි අන්කිසිවෙක් කරන්නේ නොවෙයි මෙසේවිසඳා වදාළසේක.

23 එවංවුත්තෙ සුභොමානවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච, අභික්කන්තං භොගොතම අභික්කන්තං භොගොතම සෙය්‍යථාපි භොගොතම නික්කුජ්ජිතංවා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නංවා විවරෙය්‍ය මූළ්හස්සවා මග්ගංආචික්ඛෙය්‍ය අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානිදක්ඛන්ති’ති එවමෙවං භොතාගොතමෙන අනෙකපරියායෙනධම්මො පකාසිතො එසාහං භගවන්තං ගොතමං සරණංගච්ඡාමි ධම්මඤ්චභික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මංභවගොතමො ධාරෙතු අජ්ජතග්ගෙපාණුපෙතං සරණං ගතං’ති.

23 එවංවුත්තෙ, භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේවිසින් තුදුස්ප
ශ්නයකින්යුක්ත මේ සූත්‍රය මෙසේවදාළකල්හි; තොදෙය්‍යපුත්තො
තොදෙය්‍යනම්බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ; සුභොමාණවො; ශුභනම්මා
ණවකතෙම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතදවොච,
මෙසේකීයේය; භොගොතම, භවත්ගෞතමගොත්‍රඇති සම්‍යක්ස
ම්බුද්ධසර්වඥරාජොත්තමයාණන්වහන්ස; අභික්කන්තං, ඔබගේධර්ම
දෙශනාව ඉතාමනොඥය ඉතාඉෂ්ටය ඉතාකාන්ත; භොගොතම,
භවත්ගෞතමගොත්‍රඇතිවූ සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයා
ණන්වහන්ස; අභික්කන්තං, ඔබගේධර්මදෙශනාවනිසාවූ මාගේ
යම්චිත්තප්‍රසාදයෙක්ඇද්ද, ඒප්‍රසාදයද ලෞකිකලොකොත්තර ස
ම්පත්ති ප්‍රදානයකරණහෙයින් ඉතාඉෂ්ටය ඉතාකාන්ත; භොගො
තම, භවත්ගෞතමයාණන්වහන්ස; සෙය්‍යථාපි, යම්සේ(පුරුෂයෙ
ක්;) නික්කුජ්ජිතං, කිසිවක්හුවිසින් කිබ්සිනිකළදෙයක්; උක්කු
ජ්ජෙය්‍යවා, උඩුකුරුකරන්නේ හෝවේද;පටිච්ඡන්නං, තෘණපර්ණා
දීන්ඡාදිතවූ වස්තුවක්; විවරෙය්‍යවා, ප්‍රකාශකොටදක්වන්නේහෝ
වේද; මූළ්හස්ස, දිසාමූඪයක්හට හෙවත් මංමුලාවූඑකෙක්හට; ම
ග්ගංආචික්ඛෙය්‍යවා, අතඅල්වාගෙන මේමගය මෙසේයවයි මග
පාන්නේහෝවේද; චක්ඛුමන්තො, අවිනෂ්ටචක්ෂුප්‍රසාද ඇත්තාහු;
රූපානිදක්ඛින්තීති, නීලපීතාදි රූපයන්දකිත්යි; අන්ධකාරෙ, කෘ
ෂ්ණපක්ෂචාතුර්දශීමධ්‍යමරාත්‍රිඝනවනඛණ්ඩ මෙඝපටලා ඛ්‍යනචතු
රාඞ්ග සමන්විත ඝනාන්ධකාරයෙහි; තෙලපජ්ජොතං, ප්‍රසන්නති
ලතෛල ප්‍රජ්වලිතමහාප්‍රදීපයක්; ධාරෙය්‍යවා, ධරන්නේ හෝවේ
ද; එවමෙවං, එපරිද්දෙන්ම; භොගොතමෙන, භවත්ගෞතමස
ම්‍යක්සම්බුද්ධසර්වඥ රාජොත්තමයාණන්වහන්සේ විසින්; අනෙකප
රියායෙන, උත්තාපනවිවරණ ප්‍රදෙශප්‍රකරණාදිනොයෙක්කාරණ
යෙන්; ධම්මොපකාසිතො, ධර්මයප්‍රකාශකොට වදාරණලද්දේය;
එසොඅහං, හේමම්; භගවන්තංගොතමං, භවත්ගෞතමගොත්‍ර
යාණන්වහන්සේද; ධම්මඤ්ච, මාර්ගඵලනිර්වාණ පර්‍ය්‍යාප්තිසංඛ්‍යාත ධ
ර්මයද; භික්ඛුසංඝඤ්ච, අෂ්ටාර්‍ය්‍යපුද්ගල භික්ෂුසංඝයාද; සරණංගච්ඡා
මි, සරණය, පරායණය, හිතාහිතය, ප්‍රත්‍යුපකාරකාරණයයි යන
අභිප්‍රායෙන් භජනය සෙවනය පර්‍ය්‍යුපාසනය කෙරෙමි; භවංගො
තමො, භවත්ගෞතමයාණන්වහන්සේ; මං, මා; අජ්ජතග්ගෙ, අ
දආදිකොට හෙවත් අදපටන්; පාණුපෙතං, ජීවිතාන්තයදක්වා
හෙවත් දිවිහිමියෙන්; සරණංගතන්ති, අනන්‍යශාස්තෘකත්ව ආත්ම
සන්නිය්‍යාතනයෙන් තිසරණගතවූ; උපාසකන්ති, උපාසකයෙකැ
යි; ධාරෙතූති, දැනගන්නාසේක්වයි යන; එතං, මේවචනය; අවො
ච, දැන්වූයේය.

නිමි.

# ශුභසූත්‍ර දේශනා

## සංක්ෂේප

### භාව සන්නය.

---

1 අපතිලෝගුරුබුදුරජාණන්වහන්සේ එක්සමයෙක්හි සැවැත්නුවර දෙම්රම්වෙහෙර වැඩවාසයකරවදාරණ සේක.

2 එකල්හි වනාහි තොදෙය්‍යබ්‍රාහ්මණයාගේ පුත්‍රවූ ශුභනම්මානවකතෙම බුදුරජාණන්වහන්සේ යම්තැනකනම් එතැනටපැමිණියේය, පැමිණසර්වඥයන්වහන්සේහා සමග සතුටුවූයේය, සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවක්පවත්වා එකත්පස්ව හුන්නේය එකත්පස්ව හුන්නාවූ තොදෙය්‍යබ්‍රාහ්මණයාගේපුත්‍රවූ ශුභනම්මානවකතෙම සර්වඥයන්වහන්සේට මෙසේසැල කළේය.

3 භවත්ගෞතමගොත්‍රයෙහි උපන් සම්‍යක්සම්බුද්ධසර්වඥරාජෝත්තමයාණන්වහන්ස යම්හෙතුවකින් මනුෂ්‍යජාතිඇත්තාවූම මනුෂ්‍යසත්වයන් අතුරෙහිම ලාමකවූද උතුම්වූද සත්වයෝ දක්නාලැබෙති ඊටහෙතුකවරේද ඊටප්‍රත්‍යයකවරේද? ඒ එසේමැයි භවත්ගෞතමයාණන්වහන්ස අල්පායුෂ්කමනුෂ්‍යයෝත් දක්නාලැබෙති දීර්ඝායුෂ්කමනුෂ්‍යයෝත් දක්නාලැබෙති, කාසශ්වාසාතීසාරාදි බොහෝරොගයෙන් පීඩිතවූ සත්වයෝත් දක්නාලැබෙති නිරොගීසත්වයෝත් දක්නාලැබෙති, දුර්වර්ණසත්වයෝත් දක්නාලැබෙති, උතුම්ප්‍රශස්තවූශරීරවර්ණඇති සත්වයෝද දක්නාලැබෙති, අප්‍රසිද්ධඅල්පානුභාවඇතිසත්වයෝද දක්නාලැබෙති, රාජරාජමහාමාත්‍යාදි මහානුභාව ඇත්තෝද දක්නාලැබෙති, උපභොග පරිභොගසම්පත් නැත්තාවූ දරිද්‍රජනයෝද දක්නාලැබෙති, බොහෝවූ උපභොග පරිභොග සම්පත්ඇත්තාවූ සත්වයෝද දක්නාලැබෙති, යටත්වූනීචජාති ඇත්තාහුද දක්නාලැබෙති, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි උතුම්වංශ ඇත්තාහුද දක්නාලැබෙති, නුවනනැත්තෝද දක්නාලැබෙති, උතුම්නුවන ඇත්තෝද දක්නාලැබෙති, භවත්ගෞතමයාණන්වහන්ස යම්හෙතුවකින් මනුෂ්‍යජාති ඇත්තාවූම මනුෂ්‍යසත්වයන් අතුරෙහිම හීනොත්කෘෂ්ටසත්වයෝ දක්නාලැබෙද්ද ඊටහෙතුකවරේද ඊටප්‍රත්‍යයකවරේදැයි යනමේවචනය හෙවත් මේ ප්‍රශ්නානුසන්ධියුක්තවූ වාක්‍යය දීත්වූයේය හෙවත් විචාළේය.

4 එසඳ බුදුහුවදාරණසේක් මානවකය මෙලොකයෙහි සත්වයෝ කර්මය ස්වකීයකොටඇත්තාහ, කර්මදායාදහ, කර්මයොනීහ හෙ

වත් කම්මයම උත්පත්තිස්ථානකොට ඇත්තාහ, කම්මයම ඥාතීකොට ඇත්තාහ, කර්මප්‍රතිසරණයහ එසේහෙයින් කර්මයසියලු සත්වයන් හීනප්‍රණීතකොට බෙදන්නේයයි වදාළසේක.

එසඳ බමුණුදරු සණපටකින් මුහුණවසා බැඳ අභිමුඛයේ මධුරභොජනයක්තබාලූ කලත්වැතිවිය, බුදුරජාණන්වහන්සේ සංක්‍ෂෙපයෙන් කුමක්පිණිසවදාළ සේක්දයත්?.

ඒ බමුණුදරු පණ්ඩිතමානිය තමාහාසමාන කෙනකුන්ලොව නැතැයිසිතා හිඳිනේය, ශ්‍රමණභවත්ගෞතමයන්වහන්සේ කියන්නේ කිම්ද මමයමක්දනිම්නම් එම උන්වහන්සේ කියනසේක, උන්වහන්සේ යමක්දන්නාසේක්වීනම් ඒ සියල්ල මමද දනිමි මවඩා උන්වහන්සේ දන්නාදෙයක්නැතැයි අභිමානපරවහිඳිනේය, එසේහෙයින් බුදුහුඔහුගේ මාන්බිඳිනාපිණිස පළමුකොට ඔහු නොදතහැකි පරිද්දෙන් කියමියි පසුවඔහුගේ ආරාධනාවෙන් විස්තරකොට දක්වමියි සංක්‍ෂෙපයෙන් වදාළසේක.

5. 6. එසඳ බමුණුදරු සැකෙවින් කීබස අරුමට නොදැනෙයි විස්තරවශයෙන් මාදතහැකිසේ දෙසුවමැනවැයි ආරාධනා කෙළේය.

7 එසඳ විස්තරවශයෙන් පැණවිසඳන්නාවූ බුදුරජාණන්වහන්සේ දරුව යම්ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක්හෝ ප්‍රාණඝාත කළේවීනම් ඒ සත්වතෙම නරකයෙහි ඉපද බොහෝදුක්විඳ මනුෂ්‍යජන්මයෙකඋපන්නේවීනම් උපන්තැනම අල්පායුෂ්කවෙයි නවයෞවනයෙහිම මරණලැබෙන්නේය.

8 යමෙක්ප්‍රාණවධ නොකොට සත්වයන්කෙරෙහි කරුණාඇතිව වෙසේද ඒසත්වතෙම දිව්‍යලොකයෙහි ඉපද බොහෝ සුවවිඳිමින් මිනිසත්බවට පැමිණියේවීනම් උපනුපන්තැන්හි දීර්ඝායුෂ්කවබොහෝකලක් ජීවත්ව ඉඳිනේය.

9 යමෙක් සත්වයන්ට අතින්හෝ පයින්හෝ දණ්ඩින්හෝ පහනින්හෝ ශස්ත්‍රයෙන්හෝ පීඩාකෙරේද ඒ සත්වතෙම නරකයෙහි ඉපද බොහෝදුක්විඳිමින් මිනිස්පියට ආයේවීනම් උපනුපන්තන්හි බව්‍යාබාධවෙයි, රොගීවෙයි.

10 යමෙක්සත්වයන්ට පීඩානොකෙරේද ඒ සත්වතෙම දිව්‍යලොකයෙහි ඉපද බොහෝසුවවිඳ මිනිස්බවට ආයේවීනම් උපනුපන්තන්හි අල්පාබාධවෙයි නිරොගීවෙයි.

11 යමෙක් ක්‍රොධ බහුලව මදබසකින්දු කිපෙන්නේවීනම් ඒ සත්වතෙම නරකයෙහි ඉපද බොහෝදුක්විඳ මිනිස්පියට ආයේවී නම් උපනුපන්තන්හි දුර්වර්ණවෙයි විරූපීවෙයි·

12 යමෙක්ක්‍රොධනොකරන්නේ වීනම් ඒ සත්වතෙම දිව්‍යලොකයෙහි ඉපද බොහෝසුවවිඳ මනුෂ්‍යජන්මයට පැමිණියේ වීනම් උපනුපන්තන්හි සුවර්ණවර්ණවෙයි අභිරූපීවෙයි.

13 යමෙක් අනුන්ගේ ඓශ්වර්‍ය්‍යයෙහිද අනුන්ටකරණ සත්කාරද ඉවසියනොහී ඊර්ෂ්‍යාකළේවීනම් ඒසත්වතෙම නරකයෙහිඉපදබොහෝදුක්විඳ මිනිස්පියක් ලද්දේවීනම් උපනුපන්තන්හි අල්පෙශාක්‍යවෙයි විගතානුභාවවෙයි නිවහලුවෙයි.

14 යමෙක් අනුන්ගේඓශ්වර්‍ය්‍යයෙහිද අනුන්ටකරණ සත්කාරයෙහිද ඊර්ෂ්‍යානොකොට ප්‍රසංසාකළේවීනම් ඒසත්වතෙම දිව්‍යලොකයෙහි ඉපද දිවසුවවළඳ මිනිස්පියට ආයේවීනම් උපනුපන්තන්හි මහෙශාක්‍යවෙයි මහානුභාවවෙයි, මහත්පිරිවර ඇතිවෙයි·

15 යමෙක් මහණබමුණන්ට අන්නපානාදියෙන් සංග්‍රහනොකරන්නේවීනම් ඒ සත්වතෙම නරකයෙහි ඉපද බොහෝදුක්විඳ මිනිස්බවට පැමිණියේනම් උපනුපන්තන්හි අල්පභොග ඇතිවෙයි දුරිද්‍රවෙයි.

16 යමෙක් අන්නපානාදීන් මහණබමුණන්පිණවූ වීනම් ඒ සත්වතෙම දිව්‍යලොකයෙහි ඉපද බොහෝසුවවිඳ මනුෂ්‍යභාවයට පැමිණියේ වීනම් උපනුපන්තන්හි මහාභොග ඇතිවෙයි සුවපත්වෙයි.

17 යමෙක්ස්තබ්ධව අභිමානයෙන් වැන්දමැනවුන් නොවඳිද පිදුවමැනවුන් නොපුදද හුනස්නෙන් නැංගමැනවුන්ට අස්නෙන් නොනැගේද හිඳිනාඅසුන් දුනමැනවුන්ට අසුන්නොදේද මඟහැරපහවුව මැනවුන්ට මඟනොහරීද සත්කාරකළමැනවුන්ට සත්කාරනොකෙරේද ගරුකළමැනවුන්ට ගරුකාරනොකෙරේද ඒ සත්වතෙම නරකයෙහි ඉපද බොහෝදුක්විඳ මිනිස්පියක උපන්නේ වීනම් හීනකුලයෙහි යටත්ව උපදනේය, හැමදෙනා විසින් ගර්හිත වන්නේය·

18 යමෙක් මානස්තම්භනොව අභිමානනොකොට වැන්දමැනවුන්ට වඳිද පිදුවමැනවුන්ට පුදද දූකහුනස්නෙන් නැංගමැනවුන් දූක හුනස්නෙන් නැගේද හිඳිනාඅසුන්පනවාදේද සත්කාරගරුකාර නමස්කාරකෙරේද ඒසත්වතෙම දිව්‍යලොකයෙහි ඉපද බොහෝ සුවවිඳ මිනිස්පියෙහි උපන්නේවීනම් උතුම්කුලයෙන් උපදී හැමදෙනාවිසින් පූජ්‍යවෙයි.

19 යමෙක් මහණබමුණන්කරාඑළඹ වහන්ස "කුසල්කවරේද අකුසල්කවරේද කුමක්කටයුතුද කුමක්නොකටයුතුද කුමක්කළකල දුගතියෙහි දුක්පැමිණේද කුමක්කළකල සුගතියෙහිසැපපැමිණේද"යි නොපිළිවිසීද ඒ සත්‍වතෙම නරකයෙහි ඉපද බොහෝදුක්විඳ මිනිස්පියට ආයේවීනම් උපනුපන්තන්හි අඥානවන්නේය.

20 යම් ස්ත්‍රියක්හෝ පුරුෂයෙක්හෝ මහණබමුණන්කරාඑළඹ වහන්ස"කුසල්කවරේද අකුසල්කවරේද"යනාදීන් විචාරාදඒ සත්‍වතෙම දිව්‍යලොකයෙහි ඉපද බොහෝසුවවිඳ මනුෂ්‍යජන්මයකට පැමිණියේවීනම් උපනුපන්තන්හි පොළොවහා සමානවූ මහානුවන ඇතිවන්නේය.

21 මානවකය මෙසේ අල්පායුෂ්කවන්ට නිසිපිළිවෙත් අල්පායුෂ්කබවට පමුණුවයි, දීර්ඝායුෂ්කවන්ට නිසිපිළිවෙත් දීර්ඝායුෂ්කබවට පමුණුවයි, බව්හාබාධවන්ට නිසිපිළිවෙත් බව්හාබාධබවට පමුණුවයි, අල්පාබාධවන්ට නිසිපිළිවෙත් අල්පාබාධබවට පමුණුවයි, දුර්වර්ණවන්ට නිසිපිළිවෙත් දුර්වර්ණබවට පමුණුවයි, සුවර්ණවර්ණවන්ට නිසිපිළිවෙත් සුවර්ණවර්ණබවට පමුණුවයි, අල්පෙශාක්‍යවන්ට නිසිපිළිවෙත් අල්පෙශාක්‍යබවට පමුණුවයි, මහෙශාක්‍යවන්ට නිසිපිළිවෙත් මහෙශාක්‍යබවට පමුණුවයි, අල්පභොගීවන්ට නිසිපිළිවෙත් අල්පභොගීබවට පමුණුවයි, මහාභොගීවන්ට නිසිපිළිවෙත් මහාභොගීබවට පමුණුවයි, අකුලීනවන්ට නිසිපිළිවෙත් අකුලීනබවට පමණුවයි, කුලීනවන්ට නිසිපිළිවෙත් කුලීනබවට පමුණුවයි, නුවනනැතිවන්ට නිසිපිළිවෙත් නුවනනැතිබවට පමුණුවයි, නුවනැතිවන්ට නිසිපිළිවෙත් නුවනැතිබවට පමුණුවයි.

22 මෙසේ සත්‍වයෝ කර්මය ස්වකීයඟ කර්මදායාදයඟ කර්මයොනීග කර්මබන්ධුග කර්මප්‍රතිසරණයඟ එසේහෙයින් කර්මයතෙම්ම සියළුසතුන් තෝ හීනවා තෝ ප්‍රණීතවා තෝ අල්පායුෂ්කවා තෝ දීර්ඝායුෂ්කවා තෝ බව්හා බාධවා තෝ අල්පාබාධවා තෝ දුර්වර්ණවා තෝ සුවර්ණවර්ණවා තෝ අල්පේශාක්‍යවා තෝ මහෙශාක්‍යවා තෝ අල්පභොගීවා තෝ මහාභොගීවා තෝ අකුලීනවා තෝ කුලීනවා තෝ නුවණනැතිවා තෝ නුවණඇතිවායි හීනොත්කෘෂ්ටව බෙදන්නේය.

23 කර්මයමිස සත්‍වයන් හීනප්‍රණීතකොට විභාග කරවන්ටනිසි අන්කිසිවෙක් නැතැයි වදාළසේක.

24 දෙශනාවසානයෙහි ශුභනම්මානවකයා. අන්‍යලබ්ධියහැරසරණසීලයෙහි පිහිටියේය.

නිමි.